# බයිබලය කියැවීමේ සැලැස්ම

**(BIBLE READING PLANNER)**



## පටුන


| | පිටු අංක |
|---|---|
| **■ 1 වැනි පියවර** | |
| 1 වැනි සතිය : ගීතාවලිය 19, උත්පත්ති 1, ලූක් 2, 1කොරින්ති 13, මාර්ක් 4, දේශනාකාරයා 3, 2 තිමෝති 3 | 3 |
| **■ 2 වැනි පියවර** | |
| 2 වැනි සතිය : උත්පත්ති 2, 3, 4, 5, 6, 7, 8 | 5 |
| 3 වැනි සතිය : මතෙව් 1, 2, 3, 4, 5, 6, 7 | 6 |
| **■ 3 වැනි පියවර** | |
| 4 වැනි සතිය : උත්පත්ති 11, 12, 13, 14, 15, 17, 19 | 8 |
| 5 වැනි සතිය : මතෙව් 8, 9, 10, 11, 12, 13, 14 | 9 |
| 6 වැනි සතිය : උත්පත්ති 22, 26, 27, 28, 29, 30, 31 | 10 |
| **■ 4 වැනි පියවර** | |
| 7 වැනි සතිය : මතෙව් 15, 16, 17, 18, 19, 20, 21 | 12 |
| 8 වැනි සතිය : උත්පත්ති 32, 33, 37, 39, 40, 41, 42 | 13 |
| 9 වැනි සතිය : මතෙව් 22, 23, 24, 25, 26, 27, 28 | 14 |
| 10 වැනි සතිය : උත්පත්ති 43, 44, 45, 46, 47, 49, 50 | 15 |
| **■ 5 වැනි පියවර** | |
| 11 වැනි සතිය : මාර්ක් 1, 2, 3, 6, 7, 8, 9 | 17 |
| 12 වැනි සතිය : නික්මයාම 1, 2, 3, 4, 5, 6, 7 | 18 |
| 13 වැනි සතිය : මාර්ක් 10, 11, 12, 13, 14, 15, 16 | 19 |
| 14 වැනි සතිය : නික්මයාම 8, 9, 10, 11, 12, 13, 14 | 20 |
| 15 වැනි සතිය : ලූක් 1, 2, 4, 5, 7, 9, 10 | 21 |
| 16 වැනි සතිය : නික්මයාම 16, 17, 19, 20, 24, 25, 32 | 22 |
| 17 වැනි සතිය : ලූක් 11, 12, 13, 14, 15, 16, 17 | 23 |
| 18 වැනි සතිය : ලෙවී කථාව 8, 10, 16, 17, 23, 25, 26 | 24 |
| 19 වැනි සතිය : ලූක් 18, 19, 20, 21, 22, 23, 24 | 25 |
| 20 වැනි සතිය : ගණන් කථාව 14, 17, 20, 21, 22, 23, 24 | 26 |
| 21 වැනි සතිය : යොහන් 1, 3, 4, 10, 11, 15, 17 | 27 |
| 22 වැනි සතිය : ද්විතීය කථාව 1, 2, 3, 6, 8, 18, 28 | 28 |
| 23 වැනි සතිය : ක්‍රියා 1, 2, 3, 4, 5, 6, 7 | 29 |
| 24 වැනි සතිය : යෝෂුවා 1, 2, 3, 4, 6, 20, 24 | 30 |
| 25 වැනි සතිය : ක්‍රියා 8, 9, 10, 11, 12, 13, 14 | 31 |
| 26 වැනි සතිය : විනිශ්චයකාරයා 4, 7, 14, රූත් 1, 2, 3, 4 | 32 |
| **■ 6 වැනි පියවර** | |
| 27 වැනි සතිය : ක්‍රියා 15, 16, 17, 18, 19, 20, 21 | 34 |
| 28 වැනි සතිය : 1 සාමුවෙල් 1, 2, 3, 8, 9, 10, 15 | 35 |
| 29 වැනි සතිය : ක්‍රියා 22, 23, 24, 25, 26, 27, 28 | 36 |
| 30 වැනි සතිය : 1 සාමුවෙල් 16, 17, 2සාමුවෙල් 1, 2, 5, 7, 24 | 37 |
| 31 වැනි සතිය : රෝම 5, 6, 8, 9, 10, 12, 13 | 38 |
| 32 වැනි සතිය : 1රාජාවලිය 3,5,12,17,18,2 රාජාවලිය 5,2 ලේකම් 36 | 39 |
| 33 වැනි සතිය : 1 කොරින්ති 1, 2, 3, 10, 11, 13, 15 | 40 |
| 34 වැනි සතිය : ගීතාවලිය 1, 2, 6, 16, 19, 22, 23 | 41 |
| 35 වැනි සතිය : 2 කොරින්ති 11, ගලාති 1, 2, 3, 4, 5, 6 | 42 |
| 36 වැනි සතිය : ගීතාවලිය 32, 37, 45, 46, 48, 49, 51 | 43 |
| 37 වැනි සතිය : එපීස 4,5,6, පිලිප්පි 1,2,3,4. | 44 |
| 38 වැනි සතිය : ගීතාවලිය 67, 72, 88, 90, 91, 95, 96 | 45 |
| 39 වැනි සතිය : 1 තෙසලෝනික 1, 2, 4, 5, 2 තෙසලෝනික 1, 2 | 46 |
| 40 වැනි සතිය : ගීතාවලිය 103, 104, 110, 122, 146, 149, 150 | 47 |
| 41 වැනි සතිය : 1 තිමෝති 1, 2, 6, 2 තිමෝති 1, 2, 3, 4 | 48 |
| 42 වැනි සතිය : යෙසායා 1, 2, 9, 11, 25, 26, 32 | 49 |
| 43 වැනි සතිය : හෙබ්‍රෙව් 1, 2, 3, 4, 5, 10, 11 | 50 |
| 44 වැනි සතිය : යෙසායා 40, 42, 52, 53, 55, 60, 61 | 51 |
| 45 වැනි සතිය : හෙබ්‍රෙව් 12, 13, යාකොබ් 1, 2, 3, 4, 5 | 52 |
| 46 වැනි සතිය : යෙරමියා 1, 17, 30, 31, 33, 36, 38 | 53 |
| 47 වැනි සතිය : 1 පේතෘස් 1, 2, 3, 5, 2 පේතෘස් 1, 2, 3 | 54 |
| 48 වැනි සතිය : එසකියෙල් 2, 3, 18, 36, 37, 38,39 | 55 |
| 49 වැනි සතිය : 1 යොහන් 1, 2, 3, 4, 2 යොහන්, 3 යොහන්, යූද් | 56 |
| 50 වැනි සතිය : දානියෙල් 2, 3, 5, 6, 7, 9, 12 | 57 |
| 51 වැනි සතිය : හොසෙයා 13, යෝවෙල් 3, මීකා 5, සෙකරියා 8, 12, මලාකි 3,4 | 58 |
| 52 වැනි සතිය : එළිදරව් 1, 2, 3, 5, 19, 21, 22 | 59 |
| **■ 7 වැනි පියවර** | 64 |
| **■ බයිබල් උගැන්වීම් සංක්ෂිප්තයක්** | 60 |


# හැඳින්වීම

## බයිබලය ගැන

- ✦ බයිබලය අප සැම සඳහා දෙවියන්වහන්සේගේ පණිවුඩය වේ. එය උන්වහන්සේගේ වචනයයි. එය අසමසම වේ.
- ✦ එය ලෝකයේ විශ්මජනක සහිත්‍යය මෙන්ම, අතිතයේ මිනිස් වර්ගයා සමඟ දෙවියන්වහන්සේ ගණුදෙනු කල ආකාරය, වර්තමානයට උන්වහන්සේගේ පණිවිඩය සහ අනාගතය සඳහා උන්වහන්සේගේ පොරොන්දු එය තුළ කියැවිය හැකිය.
- ✦ උන්වහන්සේ ගැනත් උන්වහන්සේගේ පුත්‍රයා වන ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස් වහන්සේ ගැනත් පවසන, දෙවියන්වහන්සේ විසින් සෘජුවම දෙන ලද එකම පොත එයයි.
- ✦ අප මිය යන්නේ මන්ද කියාත්, සදාකල් ජිවත් විය හැක්කේ කෙසේද කියාත් කියැවීමට හැක්කේ බයිබලයේ පමණි.
- ✦ නොසලකා හැරීමටත්, එය පවසන්නේ කුමක්ද කියා අනුන්ගෙන් ඇසීමට ඉඩ හැරීමටත් එරෙහිව බයිබලයේ පණිවිඩය බොහෝ වැදගත්ය.
- ✦ එම නිසා එය අප සියල්ලන් විසින්ම කියැවිය යුතුය.

## අද බයිබලය කියවන්න.

- ✦ ලෝකය සඳහාත් ඔබ සඳහාත් කාලය වේගයෙන් අවසන් වී යයි.
- ✦ <u>අද</u> ඔබගේ අවස්ථාව කරගන්න. මෙම ආශ්චර්යවත් පොත දැන්ම කියැවීම අරඹන්න.
- ✦ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආගමනය සඳහා සූදානම් වන්නේ කෙසේද,යි දැන ගැනීම අදම අරඹන්න.

## කුමන සංස්කරණයද ?

- ✦ බොහෝ භාෂාවල වෙනස් බයිබල් සංස්කරණ රාශියක් ඇත. ඉංග්‍රිසියේ පවා 17 වැනි සියවස් භාවිතා කල භාෂාවේ සිට අද කථා කරන සහ ලියන භාෂා වලට පරිවර්තනය කරන ලද ඒවා ඇත.
- ✦ ඔබ කුමන සංස්කරණය භාවිතා කලත්, එකම මූලික ඉගැන්වීම් ඔබට හමුවනු ඇත. පැරණි සහ නව පරිවර්තන සිංහල බයිබලයේ ඇත. ඔබට සුදුසු යැයි හැගෙන සංස්කරණයක් තෝරා ගන්න. මෙම සටහන් පාදකවී ඇත්තේ සිංහල බයිබලයේ පැරණි සංස්කරණය මතය.

<u>කවරයේ ඡායාරූපය:</u> මළමුහුදේ කුම්රාන් ලෙන්-ඊශ්‍රායෙල් රජයේ සංචාරක කාර්යාලයේ කාරුණික අවසරයෙනි. ක්‍රි. පූ. 200 සිට ක්‍රි. ව. 70 දක්වා "එසෙනීන්" යැයි හැඳින්වූ භක්තිමත් යුදෙව් ප්‍රජාවක් මෙම ප්‍රදේශය වාස භූමි කරගත්හ. ඔවුන් දෙවියන්වහන්සේගේ වචනයේ ශිෂ්‍යයෝවූ අතර ඔවුන්ගේ ලියවිලි පාෂාණ බරණි තුළ ආරක්‍ෂිතව තැන්පත් කලහ. රෝමානුවන්ගේ තර්ජනය හමුවේ ඔවුන් මෙම අනර්ග ලියවිලි මෙම ලෙන් තුළ සැගවිය. මෙම ලියවිලි 1947 දී සොයා ගන්නා ලදී.

## <u>මෙම සටහන් පාවිච්චි කරන්නේ කෙසේද ?</u>

- මෙම සටහන් ගොඩ නගා ඇත්තේ සෑම දිනකම බයිබලයේ එක් පරිච්ඡේදයක් කියැවීම සඳහාය. එය ලබා කරගත හැකි ආශ්චර්යමත් පුරුද්දකි.
- මෙම සැලැස්ම අනුගමනය කිරීමෙන් <u>පියවර</u> හයම සති පනස් දෙකක් තුළ ආවරණය කල හැකිය. එබැවින් එක් වසරක් තුළ බයිබලයේ පණිවුඩය ගැන ඉතා යහපත් පූර්ණ දැක්මක් ලබාගත හැක.
- මෙම සටහන් තුළ, ආවරණය කර ඇති පරිච්ඡේද සහ කොටස් තුළ ඇති පණිවිඩයේ දැක්මක් සමඟ හැඳින්වීමකින් සෑම පියවරක්ම ආරම්භ වේ. අනුපිළිවෙල අනුගමනය කිරීම සුදුසු යැයි යෝජනා කෙරේ. පිටකවරය ඇතුල් පැත්තේ ඇති දර්ශකය ඔබට විවිධ සුවි පරිච්ඡේද විපරම් කිරීමට උදව් වන අතර ඔබට වැදගත් යැයි හැගෙන කොටස් කරා ඉදිරියට පැනීමටද උදව් කරනවා ඇත.
- සෑම දිනකටම ඇති පරිච්ඡේදය අවධානයෙන් සහ දිනපතා සටහන් සමඟ සංයුක්තව කියැවිය යුතුය. සැසඳීමට සුදුසු අනෙකුත් බයිබල් පාඨද යෝජනා කර ඇත. මෙම අනෙකුත් යොමු කිරීම්ද බලන්න. එය ඉතා වැදගත් වේ. බයිබලයේ පණිවිඩය කෙතරම් අවල දැයි එය පෙන්වනු ඇත. දෙවියන් වහන්සේගේ වචනයේ සියලුම කොටස් තුළ අපහට පැවසීමට යමක් ඇත.
- ගණන් කථාව 14:21 යනු, ගණන් කථාව පොතේ 14 වැනි පරිච්ඡේදයේ 21 වැනි පදයයි. ඔබට සොයා ගැනීමේ පහසුව සඳහා බයිබලයේ පොත් 66 සාමාන්‍යයෙන් බයිබලයක ආරම්භයේ සටහන්ව ඇත.
- මෙම සටහන් පසුපිට කවරයේ ඇතුල් පැත්තේ ඇති සටහන් පත්‍රය බයිබල් ජනතාව, ඉසව් සහ පොත්, ඉතිහාසය සමඟ ගැලපෙන්නේ කෙසේදැයි පෙන්වයි. වර්තමාන බයිබලය අපට ලැබුනේ කෙසේදැයි පෙන්වන සටහනක්ද ඇත.
- 60-63 පිටුවල බයිබල් ඉගැන්වීම් වල වැදගත් සංක්ෂිප්තයක් මුද්‍රණය කර ඇත.
- මෙම සැලසුම එක්වසරක් සඳහා වුවත්, එහි දින සටහන් කර නොමැති නිසා ලබන ජනවාරි 1 වනිදා දක්වා බලා හිදීමට උවමනාවක් නැත. ඔබට වහාම පළමු වැනි පියවර ආරම්භ කල හැක.
- එම නිසා එය අදම කරන්න.





| | |
|---|---|
| ඉරිදා | ගීතාවලිය 19 |
| සඳුදා | උත්පත්ති 1 |
| අඟහරුවාදා | ලූක් 2 |
| බදාදා | 1 කොරින්ති 13 |
| බ්‍රහස්පතින්දා | මාර්ක් 4 |
| සිකුරාදා | දේශනාකාරයා 3 |
| සෙනසුරාදා | 2 තිමෝති 3 |

- ඔබ ආශිර්වාද කරන මෙන් දෙවියන්වහන්සේගෙන් යාච්ඤාවකින් ඉල්ලා සෑම දිනකම කියැවීම් ආරම්භ කරන්න.
- පළමු පියවරේ කියැවීම් බයිබලයේ විවිධ කොටස් වල සිත් ගන්නා තෝරා ගැනීම් කිහිපයකි.
- ඔබ ඒවා කියවන විට, බයිබලයේ පොත් 66 හි ඒකත්වය, සත්‍යය සහ දිව්‍යමය සම්භවය වඩාත් නිශ්චිත වනු ඇත. වසර 1500 ක් පුරා විවිධ ලියන්නන් අතින් ලියැවුවත්, කර්තෘ දෙවියන්වහන්සේ වන අතර උන්වහන්සේගේ පණිවුඩය එකමය.
- අවලව, අවධානයෙන් සහ යාච්ඤාවෙන් යුතුව කියවන්න.

### දිනපතා සටහන්

<u>ඉරිදා - ගීතාවලිය 19 -</u> මැවීම දෙවියන්වහන්සේගේ බලය මහ මහිමය පවසයි. (11-6 පද) නමුත් බයිබලය පමණක් උන්වහන්සේගේ අභිප්‍රාය සහ මාර්ග දැනුම් දෙයි (7-14 පද)

<u>සඳුදා - උත්පත්ති 1 -</u> සියල්ල සැදුයේ දෙවියන්වන්සේය. ස්වභාවධර්මායේ නියමයන් උන්වහන්සේ ස්තාපිත කල අතර මිනිසාගේ නිවහන ලෙස ලෝකය සූදානම් කල සේක.

<u>අඟහරුවාදා - ලූක් 2 -</u> යේසුස්වහන්සේගේ ප්‍රාතිහාරාත්මක උපත සාමයේ පොරොන්දු (14 පදය) සහ යුදෙව්වන්ට හා අන්‍යජාතින්ට ගැළවීම ගෙනෙන ලදී (29-32 පද)

<u>බදාදා - 1 කොරින්ති -</u> පරිත්‍යාගය (ප්‍රේමය) අප අනුගමනය කිරීම සඳහා වූ උච්චතම ගුණය වන අතර සදාකාල අනාගතයක පොරොන්දුව ඇත. (11-13 පද)

<u>බ්‍රහස්පතින්දා - මාර්ක් 4 -</u> දෙවියන්වහන්සේගේ මහිය සඳහා අප ජිවිත තුළ වගා කිරීමට සහ පල දැරීමට දෙවියන්වහන්සේගේ වචනය වටිනා බීජයක් වේ.

<u>සිකුරාදා - දේශනාකාරයා 3 -</u> ජිවිතය කෙටිය, දුබලය. අපගේ කාලය ඥාණාන්විතව දෙවියන්වහන්සේගේ සේවයටත් විනිශ්චයේ දවසට සූදානම් විමටත් යෙදවිය යුතුය. (17 පදය)

<u>සෙනසුරාදා - 2 තිමෝති 3 -1-7 දක්වා</u> පදවල වර්තමාන ලෝකය විස්තර කර තිබේ. දැහැමි විමටත්, ගැළවීම කරා අප යොමු කිරීමටත් දෙවියන්වහන්සේ විසින් බයිබලය දී ඇත. (15-17 පද)

දෙවැනි පියවර සති දෙකක් ආවරණය කරයි - පළමුව පැරණි ගිවිසුම තුළත් දෙවැනුව නව ගිවිසුම තුළත්ය.

- ✦ උත්පත්ති පොතේ මුල් පරිච්ඡේද තුළ, මැවීමට පසු සිදුවූ ඉසව් දෙස දෙවැනි සතිය බලයි.
- ✦ යහපත කරමින් සහ ගැළවීමේ සුභාරංචිය දේශනා කරමින් යේසුස්වහන්සේ ප්‍රකාශ කල අලුත් ආරම්භය දෙස තෙවැනි සතිය බලයි.

## දෙවියන්වහන්සේගේ සැලැස්ම

- ✦ පෘථිවිය සහ පළමු මිනිසා හා ගැහැණිය මැවීමෙන්, දෙවියන් වහන්සේ මනස තුළ අත්‍යන්ත අභිප්‍රායක් විය.
- ✦ මෙම අභිප්‍රාය නම්, දෙවියන්වහන්සේට සේවය කිරීමටත්, උන්වහන්සේට මහිමය ප්‍රකාශ කරන්ට තෝරා ගත්තාවූත් මිනිසුන් සහ ස්ත්‍රීන්ගෙන් පෘථිවිය පිරී තිබීමය.
- ✦ මෙම විශ්වාසවන්ත වූ මිනිසුන් හට, පෘථිවිය මත දෙවියන් වහන්සේගේ රාජ්‍යයේදී සදාකාල ජීවිතය දෙනු ඇත. (යෙසායා 45:18-23, මතෙව් 5:5, දානියෙල් 7:27)
- ✦ මෙම සැලැස්මේ අත්‍යාවශ්‍ය තලයක් වූයේ දෙවියන්වහන්සේගේ පුත්‍ර - යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ - ප්‍රාතිහාර්යාත්මක උපතයි. දෙවියන්වහන්සේගේ කැමැත්තට උන්වහන්සේගේ පරිපූර්ණ කීකරුකම මෙම සැලැස්මට අත්‍යාවශ්‍ය විය.
- ✦ අප කල යුත්තේ කුමක්දැයි ප්‍රකාශ කිරීමේ මාර්ගය ලෙසද, බයිබලය අත්‍යාවශ්‍ය වේ.





## උත්පත්ති

| | |
|---|---|
| ඉරිදා | උත්පත්ති 2 |
| සඳුදා | උත්පත්ති 3 |
| අඟහරුවාදා | උත්පත්ති 4 |
| බදාදා | උත්පත්ති 5 |
| බ්‍රහස්පතින්දා | උත්පත්ති 6 |
| සිකුරාදා | උත්පත්ති 7 |
| සෙනසුරාදා | උත්පත්ති 8 |

- ✦ "උත්පත්ති" යන නමෙහි අරුත "පටන්ගැන්මේ" පොත යනුයි. පෘථිවියේ මිනිසාගේ සහ ගැහැණියගේ ආරම්භයන් එය අපට පවසයි.
- ✦ ලෝකය තුළට පාපය සහ මරණය පැමිණියේ කෙසේද කියාත් එය අපට පවසයි.
- ✦ පවුකාර මනුෂ්‍ය වර්ගයාට ඉවතට මාර්ගයක් සැපයීමේ දෙවියන් වහන්සේගේ දීමනාවේ පළමුවැනි සඳහන එහි අන්තර්ගතය. ඇත්තවශයෙන්ම උත්පත්ති පොත බයිබලය වටහා ගැනීමේ අත්‍යවශ්‍යය පදනමක්ය.

## දිනපතා සටහන්

<u>ඉරිදා - උත්පත්ති 2 -</u> මිනිසාගේත් (7 පදය) ස්ත්‍රියගේත් (22 පදය) විශේෂිත මැවිල්ල සහ සැබෑ විවාහ සම්බන්ධය (24 පදය) බලන්න.

<u>සඳුදා - උත්පත්ති 3 -</u> පාපය (අකීකරුකම) මරණය ගෙනදෙන බවත් (3 පදය) එය එසේ වූ බවත් (19 පදය) දෙවියන්වහන්සේ පවසා තිබුනි. රෝම 5:12 බලන්න.

<u>අඟහරුවාදා - උත්පත්ති 4 -</u> මිනිසා දැන් මිය යමින් සිටි අතර ගැළවීම අවශ්‍ය විය. විශ්වාසයෙන් දෙවියන්වහන්සේට සේවය කොට සදාකාල ජීවිතය ගැන බලාපොරොත්තුවක් ඇතිකර ගැනීමට (4 පදය, හෙබ්‍රෙව් 11:4 සමඟ) හෝ තමාගේම සහෝදරයා මැරූ කායින් මෙන් තමා පාපයට බාර දීමටත් (5-8 පද) ඔහුට හැකි විය.

<u>බදාදා - උත්පත්ති 5 -</u> කායින්ගේ පැවතෙන්නෝ (4 වැනි පරිච්ඡේදයේ) සෙත්ගේ වඩා යහපත් පැවතෙන්නන්ගෙන් (3 පදයේ සිට) නෝවා දක්වා (29 පදය) වෙන්කර ඇත.

<u>බ්‍රහස්පතින්දා - උත්පත්ති 6 -</u> තමන් අවට සිටි ප්‍රචණ්ඩ සාමාජයෙන් නෝවා සහ ඔහුගේ පවුල පමණක් වෙන් කෙරින. ගැලවීම සඳහා කුමක් කල යුතුදැයි දෙවියන්වහන්සේ ඔවුනට පෙන්වූ අතර (14 පදය) එය කෙසේ කල යුතු දැයි පෙන්වා දෙන ලදී. (15-16 පද) අප කල යුත්තේ <u>කුමක්ද</u> යන්න බයිබලය අපට පෙන්වන අතර, යේසුස් වහ්නසේගේ ජීවිතය අප <u>කෙසේ</u> දෙවියන්වහන්සේ සතුටු කල යුතුදැයි පවසයි.

<u>සිකුරාදා - උත්පත්ති 7 -</u> දෙවියන්වහන්සේ පැවසූ දෙය පිළිගත් නෝවා නැවක් සැදුවේය. දෙවියන්වහන්සේගේ මාර්ගය තුළ අප විශ්වාසය තැබිය යුතු අතර (හෙබ්‍රෙව් 11:7) පැමිණෙන විනිශ්චය සඳහා සූදානම් විය යුතුය. (2 පේතෘස් 3:1-7, 11-13)

<u>සෙනසුරාදා - උත්පත්ති 8 -</u> දෙවියන්වහන්සේ නෝවා සිහිකල සේක. (1 පදය) ඔලිව් අත්ත දැරූ පරෙවියා සාමයේ සංකේතයක් වී තිබේ. (11 පදය) දෙවියන්වහන්සේ තවදුරටත් පෘථිවිය විනාශ නොකරනු ඇත. (22 පදය සහ උත්පත්ති 9:13-15)

| | |
|---|---|
| ඉරිදා | මතෙව් 1 |
| සඳුදා | මතෙව් 2 |
| අඟහරුවාදා | මතෙව් 3 |
| බදාදා | මතෙව් 4 |
| බ්‍රහස්පතින්දා | මතෙව් 5 |
| සිකුරාදා | මතෙව් 6 |
| සෙනසුරාදා | මතෙව් 7 |

## මතෙව්

- ✦ පැරණි ගිවිසුමේ අබ්‍රහම් (උත්පත්ති 12) සහ දාවිත් රජු (2 සාමුවෙල් 7) සමඟ ඇති සම්බන්දය පෙන්වීම සඳහා අලුත් ගිවිසුම ආරම්භ වන්නේ යේසුස්වහන්සේගේ "පෙළපත් සටහනෙනි".
- ✦ පැරණි ගිවිසුමේ අනාවැකි පලකල පරිදි, පොරොන්දුවූ මෙසායා යේසුස්වහන්සේ බැව් පෙන්වීමට (ගෝලයෙකු වූ අයබදු එකතු කරන්නා) මතෙව්, දෙවියන්වහන්සේ විසින් තෝරා ගන්නා ලදී.
- ✦ "මෙසේ ලියා තිබෙන ලෙස......." වැනි වචනවලින් නිතරම පැරණි ගිවිසුම සඳහන් කරන සැටි සලකන්න.

ආබ්‍රහම්
|
දාවිත්

සොලමොන් | නේතන්
ජෝසප් (පසුව මරියා හා විවාහ විය) (මතෙව් 1:16) | මරියා (යේසුස්ගේ මව) (ලූක් 3)

## දිනපතා සටහන්

<u>ඉරිදා - මතෙව් 1 -</u> යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය (18-20 පදය) පැරණි ගිවිසුමේ පොරොන්දුවූ පරිදි, තමන් වහන්සේගේ මව හරහා උන්වහන්සේ දාවිත්ගෙන් (ක්‍රි.පූ. 1000) සහ ආබ්‍රහම්ගෙන් (ක්‍රි.පූ. 2000) පැවතෙන්නෙක්ද විය.

<u>සඳුදා - මතෙව් 2 -</u> අනාගතවක්තෘ මීකා (ක්‍රි.පූ 700) විසින් අනාවැකි පල කරන ලද පරිදි, දාවිත්ගේ පුත්‍රයා රජවීමට නියමව වී තිබූ අතර, දාවිත් මෙන් බෙත්ලෙහෙමේ බිහිවෙන්නටද තිබුනි. (මීකා 5:2 සහ ලූක් 1:32)

<u>අඟහරුවාදා - මතෙව් 3 -</u> පෙර ගමන්කරුවකු සමඟ (යොහන් බෞතිස්ත) ගැලවුම්කරුවෙකු එවීමේ දෙවියන්වහන්සේගේ පොරොන්දුව යෙසායා (ක්‍රි.පූ.700) තුළින් කරන ලදී. (යෙසායා 40:1-5) යේසුස්වහන්සේ හට පසු තැවීමට පාපයක් නොතිබුනු නමුත් යටහත් කීකරුකමේ ක්‍රියාවක් ලෙස යොහන් විසින් බෞතිස්මය ලදහ. (15-17පද)

<u>බදාදා - මතෙව් 4 -</u> ගැටළු සහ පෙළඹීම් වලදී මාර්ගෝපදේශකයක් සඳහා යේසුස්වහන්සේ පැරණි ගිවිසුම යොදා ගත්හ. (4,7,10 පද)

<u>බ්‍රහස්පතින්දා - මතෙව් 5 -</u> කන්ද උඩ දේශනාව (5-7 පරිච්ඡේද) ප්‍රායෝගික නොවේ යැයි වර්තමානයේ නිතර සිතන නමුත්, මෙය ක්‍රිස්තියානි ජීවිතයට යේසුස්වහන්සේගේ ව්‍යවස්ථාව වන අතර ක්‍රිස්තුස්වහන්සේගේ සෑම අනුගාමිකයෙකුම එය මත ජීවත් වීමට යත්නදැරිය යුතුය.

<u>සිකුරාදා - මතෙව් 6 -</u> යේසුස්වහන්සේගේ යාච්ඤාව, අපගේ යාච්ඤා පදනම් විය යුතු ආකෘතියකි. පෘථිවිය මතට දෙවියන්වහන්සේගේ රාජ්‍යය පැමිණීමටත්, යේසුස්වහන්සේ පැමිණ ලෝකය යථා තත්වයට පමුණුවන්නටත් අපි යාච්ඤා කලයුතු වෙමු.


<u>සෙනසුරාදා - මතෙව් 7 -</u> ආරක්ෂාව සඳහා නියමිත පදනමවූ ක්‍රිස්තුස් වහන්සේ සහ දෙවියන්වහන්ස්ගේ වචනය මත අප ගොඩනැගිය යුතුය. (24-27 පද) ගැළවීම සියල්ලට නොවේ, සැබැවින්ම එය අපේක්ෂා කරන සුළුතරයට පමණි. (13, 19, 21 පද)





තුන්වැනි පියවර ප්‍රබෝධමත් සති තුනක් අයත්කර ගන්නා අතර, ආබ්‍රහම් ඊසාක් සහ යාකොබ් යන පියවරුන්ගේ උත්පත්ති වාර්තාවට අප පළමුවෙන් හඳුන්වාදෙයි.

- ✦ බයිබලයේ ඉතිරිය කුමක් ගැනද යන්න වටහා ගැනීමට මෙම පදනම අපට උදව් වෙනවා ඇත. උදාහරණයක් ලෙස නව ගිවිසුමේදී "ආබ්‍රහම් හට සුභාරංචිය දේශනා කරන ලදැයි" අපි ඉගෙන ගනිමු. (ගලාති 3:8)
- ✦ මතෙව් වාර්තා කර ඇති පරිදි, යේසුස්වහන්සේගේ ජීවිතය සහ ක්‍රියා ගැන මේ සමඟම අපි කියවමු.
- ✦ අඛණ්ඩව, අවධානයෙන් සහ යාච්ඤාවෙන් යුතුව කියැවීමට සිහිතබා ගන්න. ඕනෑම ප්‍රශ්නයක් හෝ මතයක් 64 වැනි පිටුවේ ඇති ලිපිනයට එවන්න.




ආබ්‍රහම්ගේ කාලයේ ප්‍රදේශ සහ ජනතාව

(උත්පත්ති 11 බලන්න)

| | |
|---|---|
| ඉරිදා | උත්පත්ති 11 |
| සඳුදා | උත්පත්ති 12 |
| අඟහරුවාදා | උත්පත්ති 13 |
| බදාදා | උත්පත්ති 14 |
| බ්‍රහස්පතින්දා | උත්පත්ති 15 |
| සිකුරාදා | උත්පත්ති 17 |
| සෙනසුරාදා | උත්පත්ති 19 |

## දෙවියන්වහන්සේ ආබ්‍රම් කැඳවයි.

- ✦ ව්‍යාජ ආගම් තිබූ (උත්පත්ති 11-12) ප්‍රදේශයක් වූ බැබිලෝ නිය අත්හැරීමට දෙවියන් වහන්සේ විසින් ආබ්‍රම් හට (පසුව ආබ්‍රහම් ලෙස හැඳින්වූ) අණ කරන ලදී. මහත් ආශිර්- වාද සහ නව දේශයක අනාගත උරුමය පොරොන්දු දේශය-දෙවියන්වහන්සේ ඔහුට පොරොන්දුවූ සේක. පසුව පලස්තිනය යැයි නම් කල මෙය කනාන් විය.
- ✦ ආබ්‍රම් කීකරුකම සහ විශ්වාසය සිත්ගන්නා සුලු විය. දෙවියන් වහන්සේ ප්‍රසන්න කිරීමට උවමනා සැම හට ඔහු ආදර්ශයක් විය. ආබ්‍රම් දෙවියන්වහන්සේ තුළ විශ්වාස කල නිසා, දෙවියන්වහන්සේ ආබ්‍රම් ධර්මිෂ්ඨකමින් උතුම් කල සේක. (රෝම 4:12-13 සහ 19-25)
- ✦ ආබ්‍රම්ගේ විශ්වාසය පසුව ඔහුගේ ක්‍රියාවලින් ප්‍රදර්ශනය විය. ඔහු තම විශ්වාසයෙන් ජිවත් විය. මෙයට කලින් පවා දෙවියන්වහන්සේ පොරොන්දු දුන්සේක.

## දිනපතා සටහන්

**ඉරිදා - උත්පත්ති 11** - නෝවාගේ පුත්‍රයෙකු වූ ෂෙම්ගේ පවුල ආබ්‍රම් දක්වා මෙහෙය වීමට දෙවියන්වහන්සේ තෝරා ගත් සැටි නිරීක්සන්න. (10-26 පද)

**සඳුදා - උත්පත්ති 12** - 2 සහ 3 වැනි පද තුළ දෙවියන්වහන්සේ කල වැදගත් පොරොන්දුවට කොටස් 7 ක් ඇත. ආබ්‍රම්ට දුන් දෙවියන් වහන්සේගේ වචනය ඉටුවීම සියලු ජාතීන්ට බලපානු ඇත.

**අඟහරුවාදා - උත්පත්ති 13** - කානාන් දේශයේ සදාකල් උරුමය පිළිබඳ තවත් පොරොන්දු (14-17 පද)

**බදාදා - උත්පත්ති 14** - මෙල්කිසඩෙක් (18-20) රජෙකු සහ පූජයකු විය. සැබෑ ඇදහිලිවන්තයන්ට යේසුස්වහන්සේ දැන් පූජකයෙකු වන අතර යෙරුසලමේ රජ වීමට නැවත පැමිණෙනු ඇත.

**බ්‍රහස්පතින්දා - උත්පත්ති 15** - දෙවියන්වහන්සේගේ පොරොන්දු තුළ (6 පදය) විශ්වාසය ඔහුට තිබූ බැවින් ආබ්‍රම් ධර්මිෂ්ඨ ලෙස සලකන ලදී. ආබ්‍රම්ගේ පැවතෙන්නෝ කලකට වහල්ලු වන බැව් දෙවියන් වහන්සේ අනාවැකි පැවසූහ. (13-14) පසුව හෙබ්‍රිව්වරු මිසරයේ වහලුන් වූහ.

**සිකුරාදා - උත්පත්ති 16** - දෙවියන්වහන්සේගේ පොරොන්දු අලුත් කල අතර (1-8 පද) ආබ්‍රම්ගේ නම ආබ්‍රහම් ලෙස වෙනස් කරන ලදී. (බොහෝ ජාතීන්ගේ පියා) පොරොන්දුව යායුතුව තිබුනේ ඊසාක් තුළින් මිස ඉශ්මායෙල් තුළින් නොවේ. (19 පදය)

**සෙනසුරාදා - උත්පත්ති 17** - ලොත්ගේ කාලයේදී මෙන්, ලෝකයේ සදාචාරාත්මක තත්වය කෙරෙහි දෙවියන්වහන්සේ තවමත් සැලකිලිමත් විය. (ලූක්17:28-32බලන්න) දෙවියන්වහන්සේට පිළිගත නොහැකි දුෂ්ඨභාවයට සොදම් තම නාමයදී ඇත. (උත්පත්ති 18:20)





| | |
|---|---|
| ඉරිදා | මතෙව් 8 |
| සඳුදා | මතෙව් 9 |
| අඟහරුවාදා | මතෙව් 10 |
| බදාදා | මතෙව් 11 |
| බ්‍රහස්පතින්දා | මතෙව් 12 |
| සිකුරාදා | මතෙව් 13 |
| සෙනසුරාදා | මතෙව් 14 |

## දෙවියන්වහන්සේගේ රාජ්‍යය

- ✦ පැරණි ගිවිසුමේ පොරොන්දු වෙන ලද පැමිණෙන දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ රජු ලෙස යේසුස්වහන්සේ ගැන මතෙව් අපට පවසයි.
- ✦ "ස්වර්ගයෙහි රාජ්‍යය" ලෙස (එය දෙවියන්වහන්සේට අයත් නිසා) රාජ්‍යය විස්තර කර ඇති නමුත්, යෙරුසලෙම අගනුවර කරමින් එය පෘථිවිය මත පිහිටවනු ඇත.
- ✦ "ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීම" බොහෝ ආකාරයකින් ආබ්‍රම් සඳහා දෙවියන්වහන්සේගේ කැඳවීමට සමානය. එයට අවශ්‍යය ක්‍රිස්තුස්වහන්සේ තුළ සහතිකවූ පොරොන්දුවේ විශ්වාසයත්, මනාප ශ්‍රාවකයෙකුගේ ජිවිතයත්ය.

## රාජ්‍යයේ උපමා

- ✦ යේසුස්වහන්සේ බොහෝ විට ඉගැන්වූයේ උපමා වලිනි. රාජ්‍යයේ සුභාරංචිය යටහත්වූවන්ට වටහා ගැනීමට උපකාර වන්නටත්, උඩඟු සහ විරුද්ධවාදීන් වියවුලට පත්කරන්නටත් ඒවා සැලසුම් කෙරින "ඇසීමට කන් ඇත්තන් හට" මේ උපමා බොහෝ දේ උගැන්විය හැකි අතර, මතකය සඳහා ඒවා විශ්මිත උපකාර වේ.
- ✦ වපරන්නාගේ වැනි (මතෙව් 13) සමහර උපමා රාජ්‍යය සූදානම් වීමේ අවධිය පවසයි. බැටලුවන් සහ එළුවන් වැනි අනෙකුත් ඒවා (මතෙව් 25) අනාගතය ගැන අපට පවසයි.

## දිනපතා සටහන්

**ඉරිදා - මතෙව් 8** - යේසුස්වහන්සේ විසින් සිදුකරන ලද බොහෝ ප්‍රාතිහාර්ය උන්වහන්සේගේ උගැන්වීමේ සත්‍යය සඳහා සාක්ෂි වූ අතර අවශ්‍ය අය සඳහා උපකාර කිරීමේ හැකියාවද පෙන්විය.

**සඳුදා - මතෙව් 9** - 6, 9 පද. යේසුස්වහන්සේ තුළින් පාපයට සමාව ලැබිය හැක. තමන් පසුපස පැමිණෙන ලෙස මතෙව් කැඳවනු ලැබින. උන්වහන්සේ අනුගමනය කරන්නට නම් අපි යේසුස්වහන්සේ ගැන ඉගෙනගත යුතුවෙමු.

**අඟහරුවාදා - මතෙව් 10** - 2-4 පද. යේසුස්වහන්සේ අනුගමනය කිරීම සඳහා දොලොස්දෙනා සියල්ල අත්හැරියහ. අපගේ ජිවිත වල දෙවියන්වහන්සේ ප්‍රමුඛව තැබීමට විශ්වාසය අපට අවශ්‍යය. (38-39 පද)

**බදාදා - මතෙව් 11** - 2-3 පද. යොහන්ගේ විමසුමට යේසුස් වහන්සේගේ පිළිතුර යෙසායා 35 උපමා දැක්වීම විය. (එය අනාගත රාජ්‍යය පිළිබඳවය.)

**බ්‍රහස්පතින්දා - මතෙව් 12** - 15-21 පද. යේසුස්වහන්සේගේ ආකල්පය යෙසායා 42, 1-4 පද ඉටු කලේය. දෙවියන්වහන්සේගේ සේවකයා ආරාධනා කිරීමට මිස ජනතාවට බල කිරීම සඳහා නොවිය.

**සිකුරාදා - මතෙව් 13** - මෙම පරිච්ඡේදයෙහි රාජ්‍යය ගැන උපමා හතක් ඇත. 23 වැනි පදයේ වැදගත් අවස්ථා විමසන්න. දෙවියන්වහන්සේගේ වචනය (අ) පිළිගැනීම.... (ආ) ශ්‍රවණය කිරීම.... (ඇ) තේරුම් ගැනීම.


**සෙනසුරාදා - මතෙව් 14** - යේසුස්වහන්සේ සැමවිටම අන් අය ගැන සිතූහ. රෝගීන් (14 පදය) කුසගින්නේ සිටින්නන් (19 පදය), පේත්‍රුස්ගේ විශ්වාසය (29 පදය), පේත්‍රුස්ගේ බිය (31 පදය)

| | |
|---|---|
| ඉරිදා | උත්පත්ති 22 |
| සඳුදා | උත්පත්ති 26 |
| අඟහරුවාදා | උත්පත්ති 27 |
| බදාදා | උත්පත්ති 28 |
| බ්‍රහස්පතින්දා | උත්පත්ති 29 |
| සිකුරාදා | උත්පත්ති 30 |
| සෙනසුරාදා | උත්පත්ති 31 |

## ආබ්‍රහම්ගේ වර්ගය

✦ අවසානයේ ක්‍රිස්තුස්වහන්සේ කරා පෙළපත මෙහෙයවීම සඳහා ආබ්‍රහම්ගේ පවුලේ කිහිප දෙනෙකු දෙවියන්වහන්සේ තෝරාගත් සේක.

✦ ඔවුන් සඳහා උන්වහන්සේ එම පොරොන්දු නැවත ප්‍රකාශ කළහ. එම පොරොන්දු එක් විශේෂිත පැවතෙන්නෙකු මගින් ඉටුවීමට තිබුනි. එනම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.




යාකොබ්ගේ පුතුන් "ඊශ්‍රායෙල් සෙනඟ" ලෙස නම් කෙරින (ගෝත්‍ර 12)

## දිනපතා සටහන්

**ඉරිදා - උත්පත්ති 22 -** තමාගේ විශ්වාසය පෙන්වීම සඳහා දෙවියන්වහන්සේ ආබ්‍රහම් "පෙළඹිය" (1පදය-පරීක්ෂා කළේය) පසුව තමන්වහන්සේගේ පුත්‍රයාට දීමට නියමිත කාලය දෙසට මෙම පරිච්ඡේදය අප යොමු කරයි. එය නව ගිවිසුමේ යොදා ඇති සැටි බලන්න. (ගලාති 3:8-9, 16)

**සඳුදා - උත්පත්ති 26 -** දෙවියන්වහන්සේ ඊසාක්ට දුන් පොරොන්දු (1-4 පද) ආබ්‍රහම්ගේ කීකරුකම හා සම්බන්ධ අතර (5 පදය) නැවතත් එය ලෝකයේ සියලුම ජාතීන් ගැනය.

**අඟහරුවාදා - උත්පත්ති 27 -** යාකොබ් ආශිර්වාද ලැබීමට යන වග රෙබෙක්කා දැන ගති. (උත්පත්ති 25:19-34) එසේ වුවද එය දෙවියන්වහන්සේ සිදු කරන තෙක් ඇය සිටියා නම් යහපත්ය.

**බදාදා - උත්පත්ති 28 -** ආබ්‍රහම්ට පළමුවෙන් දුන් පරිදි (13-15 පද) දෙවියන්වහන්සේ (ඊසාක් නොවේ) යාකොබ්ට පොරොන්දු දෙයි. උන්වහන්සේ ආබ්‍රම්ගේද, ඊසාක්ගේද, යාකොබ්ගේද දෙවියන්වහන්සේය. (13 පදය)

**බ්‍රහස්පතින්දා - උත්පත්ති 29 -** යාකොබ්ට ඉවසීම සහ දෙවියන්වහන්සේ තුළ විශ්වාසය ඉගෙනගන්නට තිබිනි. ඔහු වසර 20 ක් ලාබන්ගේ ගෘහයෙහි ලෙයා, රේචල් සහ ගවයන්ට සේවය කළේය. (උත්පත්ති 31:41)

**සිකුරාදා - උත්පත්ති 30 -** යාකොබ්ට උපන් පුතුන්, යෝසෙප්ගේ පුතුන් ඇතුළුව, ඊශ්‍රායෙලයේ ගෝත්‍ර 12 හි පූර්වජයෝ වූහ. (උත්පත්ති 46:3 සහ නික්මයාම 1-1-7)

**සෙනසුරාදා - උත්පත්ති 32 -** අපගේ කාලයේදී පොරොන්දු දේශයට ඊශ්‍රායෙල් වංශය නැවත රැගෙන ඒමට උන්වහන්සේ පොරොන්දු වුවා සේ (යෙරමියා 30:3, 31:8-11) දෙවියන්වහන්සේ යාකොබ් නැවත රැගෙන ආ සේක. (උත්පත්ති 28:15)






හතරවැනි පියවර සති හතරක් පුරා විහිදෙයි. ඔබ නිතිපතා කියැවීම් වලට පුරුදු වන හෙයින් මෙය ගැටළුවක් නොවනු ඇත.

✦ මෙම සති හතරේදී, උත්පත්ති පොතින් පියවරුන් ගැනත්, මතෙව් තුළින් යේසුස්වහන්සේගේ ජිවිතය ගැනත් කියැවීම කරගෙන යන්නෙමු.

✦ යෝසෙප්ගේ ජිවිතය (උත්පත්ති 37-50) සහ යේසුස්වහන්සේගේ ජිවිතය අතර සිත් බැඳෙන සමාන්තරතාවයක් බලාපොරොත්තුවන්න. (13 පිටුවේ කිහිපයක් සඳහන්ව ඇත.)

✦ අඛණ්ඩව, අවධානයෙන් සහ යාච්ඤාවෙන් කියැවීමට සිහිතබා ගන්න. ඕනෑම ගැටළුවක් හෝ අදහසක් කරුණාකර 64 වැනි පිටුවේ ඇති ලිපිනයට එවන්න.




යේසුස්වහන්සේගේ කාලයේ පලස්තීනය

| | |
|---|---|
| ඉරිදා | මතෙව් 15 |
| සඳුදා | මතෙව් 16 |
| අඟහරුවාදා | මතෙව් 17 |
| බදාදා | මතෙව් 18 |
| බ්‍රහස්පතින්දා | මතෙව් 19 |
| සිකුරාදා | මතෙව් 20 |
| සෙනසුරාදා | මතෙව් 21 |

## රෝමානුවන් යටතේ ඊශ්‍රායලය

- ✦ යේසුස්වහන්සේගේ දවස් වල ඊශ්‍රායල් දේශය සහ ජනතාව මත රෝමානු ආධිපත්‍යය සම්පූර්ණයෙන්ම වාගේ පැවතින. එමනිසා රෝමානුවන්ගෙන් නිදහස් වීමේ බලාපොරොත්තුව පොරොන්දුවිය හැකි ඕනෑම කෙනෙක් අනුගමනය කිරීමට බොහෝ දේශප්‍රේමී යුදෙව්වෝ කැමැත්තෙන් සිටියහ.
- ✦ පැහැදිලිවම නාසරෙත්හි යේසුස්ට එය කිරීමට බලය තිබුනි. ඔහුගේ ප්‍රාතිහාර්යයන් එය පෙන්වා දුනි. මනුෂ්‍යය කිර්තිය සඳහා පැමිණි පෙළඹ වීම උන්වහන්සේ දැනටමත් ප්‍රතික්ෂේප කර තිබුනි. උන්වහන්ස්ගේ රාජ්‍යය අනාගත එකක් වනු අතර එය තමන්වහන්සේගේ පියාණන් විසින් ප්‍රදානය කරනු ඇත. පළමුවෙන්ම, මනුෂ්‍යයා එහි වහල්භාවයෙන් සහ මරණයෙන් නිදහස් කර ගැනීම සඳහා උන්වහන්සේට පාපය යටත් කර ගැනීම යුතු විය. එවිට උන්වහන්සේ පෘථිවියේ රජු වීමට සුදුසු වනු ඇත.
- ✦ අන් අය පාලනය කිරීමට ප්‍රථම තමන් පාලනය කර ගැනීමට උන්වහන්සේගේ අනුගාමිකයෝ ඉගෙන ගත යුතුය. ඔවුන්ගේ සැලකිල්ල විය යුත්තේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය විනා මේ ලෝකයේ දේශපාලනය නොවේ.

## දිනපතා සටහන්

**ඉරිදා - මතෙව් 15 -** මිනිස් හදවතින් (මනසින්) පාපය පැන නගින බැව් යේසුස්වහන්සේ දැනසිටි සේක. පිරිසිදු කල යුත්තේ එයයි. (18-19 පද)

**සඳුදා - මතෙව් 16 -** යේසුස්, ක්‍රිස්තුස්වහන්සේ (යුදෙව් මෙසායා) වන අතර, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. (16 පදය) උන්වහන්සේ තම මරණය කලින් කීහ. (21 පදය) ආත්ම පරිත්‍යාගයේ මාර්ගය ශ්‍රාවක බව ලබන්නා අනුගමනය කල යුතුය. (24-26 පද)

**අඟහරුවාදා - මතෙව් 17 -** යේසුස්වහන්සේ අන්වෙසක් වීම, අනාගත රජු වශයෙන් උන්වහන්සේගේ විභූතියේ පූර්ව වින්දනයකි. මතෙව් 15:28 සහ 2 **පේත්‍රුස්** 1:16-17 බලන්න.

**බදාදා - මතෙව් 18 -** "කුඩා දරුවන් මෙන්" (3 පදය) වෙනවා යනු, දෙවියන් වහන්සේගේ වචනය පිළිගනිමින් (ලාමක නොව්) විශ්වාස කිරීමයි.

**බ්‍රහස්පතින්දා - මතෙව් 19 -** ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නන් හට, පැමිණෙන රාජ්‍යයේ සදාකාලික ජීවිතය සහ ප්‍රීතිය දෙනු ඇත. (27-29 පද)

**සිකුරාදා - මතෙව් 20 -** තමාට කුමක් වීමට යන්නනේ දැයි යේසුස්වහන්සේ දැන සිටි සේක. (18-19 පද) පැරණි ගිවිසුම එය කලින් කියා තිබුනි. තමා මළවුන්ගෙන් නැගිටවනු ලබන බව උන්වහන්සේ විශ්වාස කල සේක. (19 පදය)

**සෙනසුරාදා - මතෙව් 21 -** 1-11 පද, සෙකරියා 9:9 සම්පූර්ණ කලේ අඩක් පමණි. ඉතිරිය, ලෝකයේ රජු වශයෙන් නැවත යේසුස්වහන්සේ පැමිණි විට සිදුවනවා ඇත.





## යේසුස්වහන්සේට සමාන යෝසප්

| | |
|---|---|
| ඉරිදා | උත්පත්ති 32 |
| සඳුදා | උත්පත්ති 33 |
| අඟහරුවාදා | උත්පත්ති 37 |
| බදාදා | උත්පත්ති 39 |
| බ්‍රහස්පතින්දා | උත්පත්ති 40 |
| සිකුරාදා | උත්පත්ති 41 |
| සෙනසුරාදා | උත්පත්ති 42 |

- ✦ යෝසෙප්ගේ ජිවිතය ගැන දිව්‍යමය වාර්තාවේ (උත්පත්ති 37-50) යේසුස්වහන්සේගේ ජිවිතය සමඟ බොහෝ සමාන්තරතාවයන් අඩංගුය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම කලින් සනිටුහන් කිරීමටත්, උන්වහන්සේ තමන්ගේම ජනතාව විසින් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධවත් පැරණි ගිවිසුම පූර්ව ලක්ෂණ පල කිරීමේ බොහෝ ක්‍රම වලින් මෙය එකකි.

| යෝසෙප් | යේසුස්වහන්සේ |
|---|---|
| 1. යෝසෙප් හට තම පියාණන් ප්‍රේමකරන ලදී. | යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝය. |
| 2. යෝසෙප් හට තම සහෝදරයන් වෛර කරන ලදී. | යේසුස්වහන්සේ තම ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. |
| 3. යෝසෙප් අත්දැකීම් තුළින් ඉවසීම ඉගෙන ගත්තේය. | යේසුස්වහන්සේ "වේදනාව තුළින් සම්පූර්ණත්වයට පත් කරන ලදී. |
| 4. යෝසෙප් සිරකරන ලදුව පසුව නිදහස් කරන ලදී. | යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ විසින් සොහොනින් නිදහස් කරන ලදී. |
| 5. යෝසෙප් සෆ්නත්-පානෙයා (ලෝකයේ ගැළවුම්කරු) ලෙස නම් කලේය. | යේසුස්වහන්සේ ලෝකයේ ගැළවුම්-කාරයාණෝය. |
| 6. යෝසෙප් තම සහෝදරයන් ගලවා ඔවුනට සමාව දුන්නේය. | යේසුස්වහන්සේ තම ජනතාවට සමාවදී ඔවුන් ගලවනු ඇත. |
| 7. යෝසෙප් රජතුමා අසල සිටීමට උසස් කරන ලදී. | යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ නාමය ලැබීමට උසස් කරන ලැබ සිටින අතර ලෝකයේ රජවනු ඇත. |

## දිනපතා සටහන්

**ඉරිදා - උත්පත්ති 32 -** ඔහු දෙවියන්වහන්සේ විශ්වාස කල බැවින්, යාකොබ්ගේ නාමය, ඉශ්‍රායෙල් (දෙවියන්වහන්සේ සමඟ කුමාරයෙක්) ලෙස වෙනස් කරන ලදී.

**සඳුදා - උත්පත්ති 33 -** තම දරුවන් (5 පදය) සහ තම භාණ්ඩ (11 පදය) ඇතුලුව සියලු ආශිර්වාද දෙවියන්වහන්සේ වෙතින් බැව් යාකොබ් පිළිගත්තේය.

**අඟහරුවාදා - උත්පත්ති 37 -** යෝසෙප් පවුලේ පූජකයා කරවන ලදී. "කබාය" පූජක වස්ත්‍රයක් විය. මෙය ඔහුගේ සහෝදරයෝ ඊර්ෂ්‍යයා කරවන්නනක් විය. ඔහුගේ සිහින, අනාගතය සඳහා දෙවියන්වහන්සේගේ එළිදරව් විය.

**බදාදා - උත්පත්ති 39 -** යෝසෙප්, යේසුස්වහන්සේ මෙන්, අන්‍යයන් සඳහා විශ්වාසවන්තව සේවය කල අතර පෙළඹවීමට විරෝධය දැක්විය (7-8 පද)

**බ්‍රහස්පතින්දා - උත්පත්ති 40 -** සිපිරිගෙයිදී පවා යෝසෙප් සේවය කරගෙන ගිය නමුත් ඔහු ඉක්මනින් අමතක කරන ලදී. (23 පදය) මෙතැන්දීත්, තමන් උපකාර කිරීමට පැමිණි වුවන් විසින් ප්‍රතික්ෂේප කරන ලැබූ ඔහු, යේසුස් වහන්සේ හා සමාන විය.

**සිකුරාදා - උත්පත්ති 41 -** යෝසෙප්ගේ නැදහස් වීම සිදු කරන ලද්දේ දෙවියන්වහන්සේය.

**සෙනසුරාදා - උත්පත්ති 42 -** යෝසෙප්, තම සහෝදරයන් තමා හඳුනා ගැනීමට ප්‍රථම ඔවුන් හැඳින්නේය. තමන්ගේ ගැළවුම්කාරයාණන් තවමත් හඳුනානොගත් වර්තමාන ඊශ්‍රායෙල් ජනතාව සමඟ එය එසේමය.

| | |
|---|---|
| ඉරිදා | මතෙව් 22 |
| සඳුදා | මතෙව් 23 |
| අඟහරුවාදා | මතෙව් 24 |
| බදාදා | මතෙව් 25 |
| බ්‍රහස්පතින්දා | මතෙව් 26 |
| සිකුරාදා | මතෙව් 27 |
| සෙනසුරාදා | මතෙව් 28 |

## අප සමාන නමුත් දෙවියන් වහන්සේ හා සමාන යේසුස් වහන්සේ.

- ✦ උන්වහන්සේගේ උපත තුළින් යේසුස්වහන්සේ මරියාගේ පුත්‍රයා වූ අතර අපගේ මනුෂ්‍යය ස්වභාවය උරුම කරගත් සේක. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන්ද වන අතර දෙවියන්වහන්සේගේ මැවීමේ සැලැස්මේ කේන්ද්‍රයද වන සේක.
- ✦ මෙම සත්‍යයන් යුගල සුභාරංචි අවධාරණය කරයි මෙම විශ්මිත සත්‍යය ප්‍රදර්ශනය කරන පහත සඳහන් මතෙව්ගේ පද කියවන්න. (මතෙව් 1:1, 18, 23, 3:16-17, 16:16, 22:41-45, 26:63, 27-40, 43, 54)
- ✦ මනුෂ්‍යය වර්ගයාගේ මිදුම්කරු වීම සඳහා දෙවියන්වහන්සේගේ පුත්‍රයා ස්ත්‍රියගෙන් උපත ලදහ. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පියාණෝය. යේසුස්වහන්සේ තුළින්, අප සඳහා පියාණන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ වීමට තිබුනි.
- ✦ අපගේ දුබල සහ හිතුවක්කාර ස්වභාවය තුළ තමන්වහන්සේගේ පියාණන් කැමති කිරීමෙන් යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙස ජීවත් විය.

### දිනපතා සටහන්

<u>ඉරිදා - මතෙව් 22 -</u> උන්වහන්සේගේ පැමිණීමේදී අප ක්‍රිස්තුස්වහන්සේට පිළිගැනීමට නම්, අප එකිනෙකා හට අවශ්‍ය පාපය සඳහා වැස්ම නියෝජනය කරන්නේ මංගල්‍යය වස්ත්‍රයයි. (11 පදය)

<u>සඳුදා - මතෙව් 23 -</u> නිවැරදි දේ කරන්නට උත්සාහය දරන පවුකාරයා යේසුස්වහන්සේ කිසිකලෙකත් වරදකරු නොකල නමුත්, යහපත් යැයි තමන් හැඟවූ අය උන්වහන්සේගේ මහත් දෝශාරෝපණය ලදහ.

<u>අඟහරුවාදා - මතෙව් 24 -</u> මෙම පරිච්ඡේදයේ, ක්‍රි.ව. 70දී පළමුවෙන් යුදෙව්වන්ගේ විසිරීමත්, ඉක්බිති උන්වහන්සේගේ නැවත පැමිණීමට යොමු වූ ඉසව් ගැනත්, යේසුස්වහන්සේ පූර්ව කථනයක් කල සේක. (30 පදය)

<u>බදාදා - මතෙව් 25 -</u> මෙම පරිච්ඡේදයේ උපමා තුනක්, ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණියාට පසු ඇතිවන විනිශ්චය පෙන්වති. අප සූදානම් විය යුතුය. (13 පදය)

<u>බ්‍රහස්පතින්දා - මතෙව් 26 -</u> ශුද්ධ ලියවිල්ල පෙර කී ලෙස, යේසුස්වහන්සේ තම අඳුරුතම පැය තුළට ඇතුළුවෙත්. පූප සහ මිදියුෂ උන්වහන්සේගේ ජීවිතදානය සංකේතවත් කරයි. (26 - 29 පද)

<u>සිකුරාදා - මතෙව් 27 -</u> යේසුස්වහන්සේ අහිංසක බැව් සියල්ලෝම දැන සිටියද, උන්වහන්සේ කුරුසිගත කලහ. කුරුසිය මතවූ පදවි නාමය උන්වහන්සේගේ සැබෑ දූතමෙහෙවර ප්‍රකාශ කලේය. (37 පදය)

<u>සෙනසුරාදා - මතෙව් 28 -</u> සැබවින්ම ස්වාමින්වහන්සේ නැගිට ඇති අතර උන්වහන්සේගේ ජයග්‍රහණය සම්පූර්ණය. දෙවියන්වහන්සේගේ පූර්ණ අධිකාරිය සමඟ අපෝස්තුලුවරුන් තුළින් උන්වහන්සේගේ ක්‍රියාව පවත්වාගෙන යනු ලබයි. (18-20 පද)



## පොරොන්දුවූ දේශය තුළ භූමිදානය

| | |
|---|---|
| ඉරිදා | උත්පත්ති 43 |
| සඳුදා | උත්පත්ති 44 |
| අඟහරුවාදා | උත්පත්ති 45 |
| බදාදා | උත්පත්ති 46 |
| බ්‍රහස්පතින්දා | උත්පත්ති 47 |
| සිකුරාදා | උත්පත්ති 49 |
| සෙනසුරාදා | උත්පත්ති 50 |

- ✦ දෙවියන්වහන්සේගේ පොරොන්දු තුළ විශ්වාසය පෙන්වමින්, බොහෝ පියවරු තමන් කානාන් දේශයේ මිහිදන් කිරීමට ඉල්ලිය.
- ✦ සදාකාලයටම දේශයේ ප්‍රායෝගික උරුමයක් උන්වහන්සේ ඔවුනට පොරොන්දු වී තිබින. මෙහි අරුත නම් තමන්වහන්සේගේ පොරොන්දු ඉටු කිරීම සඳහා එක් දිනෙක ඔවුන් මළවුන්ගෙන් නැගිටවනු බවය. (ක්‍රියා 7:5 සමඟ ලූක් 13:25-30)
- ✦ මේ අතර, ඔවුන්ගේ උරුමය වහාම නොව <u>අනාගතයේදී</u> බැව් පැහැදිලි කිරීමට, ඔවුන් තමන් පෘථිවියේ අයිතිකරුවන් නොව, එහි "අමුත්තන් සහ වන්දනාකරුවන්" විය යුතු විය. (හේබ්‍රෙව් 11:13, 39-40)
- ✦ එම නිසා, සාරා මිහිදන් කිරීම සඳහා ආබ්‍රහම් ඉඩම් කැබැල්ලක් <u>මිළදී ගත්තේය.</u> ආබ්‍රහම්ද, ඊසාක් සහ රෙබෙක්කා සහ ලෙයාද (උත්පත්ති 49:29-31), යාකොබ්ද (උත්පත්ති 50:13) එහි මිහිදන් කරන ලදී.

### දිනපතා සටහන්

<u>ඉරිදා - උත්පත්ති 43 -</u> යෝසෙප් ඔහුගේ සහෝදරයන් සියල්ල හමුවූ අතර ඔවුහු ඔහු ඉදිරියේ හිසනමා ආචාර කලෝය. (20 පදය) යෝසෙප්ගේ සිහින මතකද? යෝසෙප් තම සේවකයා හට දෙවියන්වහන්සේ ගැන උගන්වා තිබුනිද? (23 පදය) ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ ගැන දන්නා අය අන්‍යයන් සඳහා කියාදිය යුතුය.

<u>සඳුදා - උත්පත්ති 44 -</u> යෝසෙප්ගේ සහෝදරයෝ තම වැරදි හෙළිකිරීමට යොමු කර තිබුනි. (උත්පත්ති 42:21, 44:16) යෝසෙප් හට ආයාචනා කළ පළමු වැන්නේ යුදා බැව් සලකන්න. 10 පිටුවේ සටහන් බලන්න.

<u>අඟහරුවාදා - උත්පත්ති 45 -</u> යෝසෙප් පලිගැනීමට උත්සහ කලේ නැත. තමාගේ වේදනා තම සහෝදරයන් වෙනුවෙන් බැව් ඔහු දැනගත්තේය. (5-8 පද) මෙතැනදී ඔහු යේසුස්වහන්සේ මෙන් විය.

<u>බදාදා - උත්පත්ති 46 -</u> මිසරයේ සිට නික්මයන යාකොබ්ගේ පැවතෙන්නන් ගැන අනාවැකියක් මෙන්න. (3-4 පද) නික්මයාම 3:8 බලන්න.

<u>බ්‍රහස්පතින්දා - උත්පත්ති 47 -</u> තමාගේ <u>විශ්වාසය</u> නිසා (හේබ්‍රෙව් 11:8-16), පොරොන්දු දේශයේ තමා මිහිදන් කිරීමට යාකොබ්ට අවශ්‍ය විය. (29-20 පද)

<u>සිකුරාදා - උත්පත්ති 49 -</u> "ෂිලෝ" පැමිණිය යුතු තෝරාගත් ගෝත්‍රය යුදා විය. නමෙහි අරුත වනුයේ, "එය කා හටද" යනුයි. එය යොමු වූයේ යේසුස් වහන්සේටය. එසකියෙල් 21:27 බලන්න.

<u>සෙනසුරාදා - උත්පත්ති 50 -</u> එම විශ්වාසයම තිබූ බැවින් යෝසෙප්ටද තමා කානාන්හි මිහිදන් කරවීමට උවමනා විය. (හේබ්‍රෙව් 11:22) පොරොන්දු ගැන විශ්වාසයෙන් ඔහු මිය ගියේය. (24-25 පද)

දෙවියන්වහන්සේගේ වචනය කියැවීමේ වසර භාගයක් සම්පූර්ණ කිරීම සඳහා සති දහසයක් පුර මෙම පස්වැනි පියවර ඔබ ඉදිරියට ගෙනයනු ඇත. දැනටමත් දෙවියන්වහන්සේගේ ක්‍රියාවේ සහ ප්‍රේමයේ විශ්මිත සහ සැනසිළිදායක වාර්තා ඔබ කියවා ඇත.

- ඉඩකඩ නොමැති කම නිසා සටහන් තවමත් කෙටි විය හැකිය. දැනටමත් ඔබ තනිවම පරිච්ඡේද තුළින් වැදගත් කරුණු තෙලාගන්නවා ඇත.
- සමහර අවස්ථා වලදී කියැවීම් තුළ දුශ්කර හෝ නොපැහිදිලි දේ ඇත. අපගේ ජීවිත පුරාම බොහෝ සිත්ගන්නා සහ ප්‍රබෝධාත්මක දේ ගවේශණය කිරීම සඳහා දෙවියන්වහන්සේ ඥාණාන්විතව බයිබලය සැලසුම් කර ඇත. දෙවියන්වහන්සේගේ වචනය තුළින් දැනගත හැකි <u>සියල්ලු</u> අප කිසි දිනෙක සොයා අවසන් නොකරනු ඇත.
- ඒ කෙසේ වෙනත්, ඉතා ඉක්මනින් අත්‍යාවශ්‍යය ඉගැන්වීම් සහ පණිවිඩය ඉගෙන ගැනීමට අපට හැකිය. (අප එසේ කල යුතු වෙමු.) අප ගැටළු වලට මුහුණ දුනහොත්, ශුද්ධ ලියවිල්ල ශුද්ධ ලියවිලෙන්ම තේරුම් කරදීමට සැම විටම ඉඩහල යුතුය. අපගේ ප්‍රශ්න වලට පිළිතුරු බොහෝ විට අපගේ ප්‍රශ්නය ඇති පරිච්ඡේදයේම ඇත.
- එම නිසා ඔබ දැනටමත් කියවා ඇතිදේ දෙස නැවත හැරී බලන්න. ඔබ සතුව "සුචියක්" ඇති නම් එය පාවිච්චි කරන්න. (එනම් අකාරාදි පිළිවෙලට ඇති බයිබලයේ වදන් සහ ඒවා යෙදෙන පාඨ ගැන ලැයිස්තුවක්)
- බයිබල් ඉගැන්වීම් යොමු කිරීමේදී, ඒවා මතුවූ විට, 60-63 පිටුවලින් විමසන්න.
- අවධානයෙන් අඛණ්ඩව සහ යාච්ඤාවෙන් යුතුව දිනපතා කියැවීම කර ගෙන යන්න.





## <u>මාර්ක්ගේ දිව්‍යමය අනුග්‍රහය ලැබූ යේසුස්වහන්සේගේ ජීවිත වාර්තාව</u>

| | |
|---|---|
| ඉරිදා | මාර්ක් 1 |
| සඳුදා | මාර්ක් 2 |
| අඟහරුවාදා | මාර්ක් 3 |
| බදාදා | මාර්ක් 6 |
| බ්‍රහස්පතින්දා | මාර්ක් 7 |
| සිකුරාදා | මාර්ක් 8 |
| සෙනසුරාදා | මාර්ක් 9 |

- මාර්ක් (යොහන් මාර්ක්) පේත්‍රැස්ගේ මිතුරෙකුද (1 පේත්‍රැස් 5:13), අපෝස්තුලුවර පාවුල්ගේ සහකාර -යෙකුද විය. (ක්‍රියා 12:12)
- යේසුස්වහන්සේගේ ජීවිතය ගැන ඔහුගේ වාර්තාව පැරණිම එක වන්නට පුලුවන. නිසැකවම එය කෙටිම එකවන අතර එහි විස්තරයේ <u>හදිසි</u> හැඟවීමක් ඇත.
- නිතරම යොදා ගන්නා මෙවැනි "හදිසි" වචන දෙස බලන්න: "වහාම" - "ක්ෂණිකව" - "විශ්මයට පත්" - "නොපමාව" - "මවිතව."
- උද්යෝගයෙන් සහ යාච්ඤාවෙන් කියවන්නේ නම්, පණිවුඩයේ හදිසිතාවය සහ බලපෑම අපගෙන් නැති නොවෙනු ඇත.
- "භූතයන්" සහ "නපුරු ආත්ම" ගැන සඳහන් බොහොමයක් මාර්ක් සටහන් කරයි. මේ දුෂ්ඨ දෙවිවරු නොවේ. 62 පිටුවේ 29 වැනි සටහන බලන්න.

### දිනපතා සටහන්

<u>ඉරිදා - මාර්ක් 1 -</u> යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. (1, 11 පද) උන්වහන්සේගේ අනුකම්පාව මහත්ය. මාර්ක් සටහන් කරන බොහෝ ප්‍රාතිහාර්යයන් මෙම සත්‍යයන් අවධාරණය කරයි.

<u>සඳුදා - මාර්ක් 2 -</u> යේසුස්වහන්සේට සමාව සැපයිය හැක. (10 පදය) නමුත් ස්වයංධාර්මිකයා හට තමනට ගැළවීම අවශ්‍ය නැතැයි සිතන්නෝ - උදව් කිරීමට නොහැක. (17 පදය)

<u>අඟහරුවාදා - මාර්ක් 3 -</u> "සිතේ දැඩිකම" (5 පදය) විශ්වාසයට තවත් මහත් බාධාවකි. අපෝස්තුලුවරුන් තෝරාගන්නා ලදී. (13-19 පද)

<u>බදාදා - මාර්ක් 6 -</u> යොහාන් බෞතීස්ත දුෂ්ඨභාවයට එරෙහිව කතා කිරීමට බිය නොවූ අතර මරණය දක්වාම විශ්වාසවන්තව සිටියේය.

<u>බ්‍රහස්පතින්දා - මාර්ක් 7 -</u> අපගේම ආදරණීය අදහස් සමහර විට අත්හැරීමට සිදුවේ. (7 පදය) අපගේ ඇදහිලි ශුද්ධ ලියවිලි හා එකඟදැයි අප සහතික විය යුතුය.

<u>සිකුරාදා - මාර්ක් 8 -</u> යේසුස්වහන්සේ ආහාරය සඳහා ස්තුති කල සේක. (6 පදය) දිනපතා ආශිර්වාද ගැන එම කෘතඥතාවය අප පෙන්වනවාද?

<u>සෙනසුරාදා - මාර්ක් 9 -</u> තමන්ට ඉදිරියේ ඇති දේ පිළිබඳ යේසුස් වහන්සේගේ දැනුමේ සඳහන් තුනක් මාර්ක් සතුය. (මාර්ක් 8:31, 9:31, 10:33)

| | |
|---|---|
| ඉරිදා | නික්මයාම 1 |
| සඳුදා | නික්මයාම 2 |
| අඟහරුවාදා | නික්මයාම 3 |
| බදාදා | නික්මයාම 4 |
| බ්‍රහස්පතින්දා | නික්මයාම 5 |
| සිකුරාදා | නික්මයාම 6 |
| සෙනසුරාදා | නික්මයාම 7 |

## මිසරයේ වහල්භාවය

- ✦ පාරවෝ හට වහල්භාවය යටතේ ඉශ්‍රායෙල්ගේ අත්දැකීම, පාපය සහ මරණය යටතේ අපගේ වහල් භාවයට ශුද්ධ ලියවිල්ල සම කරයි.
- ✦ අදේව වාදය සහ එහි පාපය තුළ මිසරය පසුව "ලෝකයට" සංකේතයක් වෙයි. අප එයින් ගැළවිය යුතු අතර ඉන්පසුව නැවත හැරියාමේ ආශාවක් නොතිබිය යුතුය.
- ✦ නික්මයාම නමැති වචනයේ - මෝසෙස් විසින් ලියන ලද දෙවැනි පොතට දුන් නම - තේරුම "පිටතට පැමිණීමයි."
- ✦ "මිසරයෙන් පිටතට කැඳවීම" දෙවියන්වහන්සේගේ දරුවනට මහත් ආශිර්වාදයකි. මෙම සිත්ගන්නා සඳහන් වැල අනුගමනය කරන්න. නික්මයාම 4:22, හොසෙයා 11:1, මතෙව් 2:15, හෙබ්‍රෙව් 2:15, රෝම 8:21 සහ එළිදරව් 7:14.

## දිනපතා සටහන්

<u>ඉරිදා - නික්මයාම 1 -</u> වහලුන්ව සිටියත් මිසරයේදී ඉශ්‍රායෙල් සමෘද්ධිමත් විය. දුෂ්ඨ මිනිසුන් දෙවියන්වහන්සේගේ සෙනඟ ඉවත් කිරීමට උත්සහ කරනු ඇතත්, අවසානයේදී ඔවුන් අසාර්ථක වනු ඇත.

<u>සඳුදා - නික්මයාම 2 -</u> දෙවියන්වහන්සේගේ සෙනඟ මුදවා ගැනීමටත්, ඔවුනට දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව දීමටත් මෝසෙස්ට අයත් විය. තමාගේම පුත්‍රයා ඇතිදැඩි කිරීමට මවකට වැටුප් ගෙවන ලදී. (9 පදය) මෝසෙස්ගේ දෙමාපියන්ගේ විශ්වාසය ප්‍රතිපල දුනි. (හෙබ්‍රෙව් 11:23)

<u>අඟහරුවාදා - නික්මයාම 3 -</u> පිටුවහල්ව සිටි මෝසෙස්, තමන්වහන්සේගේ ක්‍රියාව කිරීමට දෙවියන්වහන්සේ විසින් කැඳවන ලදී. 6 වැනි පදයේ "ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේ" ආබ්‍රහම් හට දෙවියන්වහන්සේගේ පොරොන්දු වල සිහි කිරීමකි. (උදා: උත්පත්ති 15)

<u>බදාදා - නික්මයාම 4 -</u> "ඉශ්‍රායෙල් මාගේ පුත්‍රයාය, මාගේ කුලුඳුලාය." මෙතැන (22-23 පද) දසවෙනි පීඩාව ගැන පාරාවෝ කලින් අනතුරු හැඟවීම ලැබුවේය. (නික්මයාම 12:29)

<u>බ්‍රහස්පතින්දා - නික්මයාම 5 -</u> පාරාවෝගේ ආකල්පය (2 පදය) පසු දවස්වල අසිරියානුන්ගේ ආකල්ප හා සසඳන්න. (2 රාජාවලිය 18:35)

<u>සිකුරාදා - නික්මයාම 6 -</u> ආබ්‍රහම්ට දුන් පොරොන්දු හත (උපත්පත්ති 12:1-3) ඉශ්‍රායෙල්ට දුන් පොරොන්දු හත සමඟ ගැලපේ. (6-8 පද)

<u>සෙනසුරාදා - නික්මයාම 7 -</u> පාරාවෝ ප්‍රාතිහාර්යයක් ඉල්ලා සිටි නමුත් (9 පදය) ඔහු මනස්තාප වුයේ නැත. දෙවියන්වහන්සේ අප හට සාක්ෂි සපයන සේක. අපි එයට ඇහුම්කනන් දෙන්නෙමුද?





| | |
|---|---|
| ඉරිදා | මාර්ක් 10 |
| සඳුදා | මාර්ක් 11 |
| අඟහරුවාදා | මාර්ක් 12 |
| බදාදා | මාර්ක් 13 |
| බ්‍රහස්පතින්දා | මාර්ක් 14 |
| සිකුරාදා | මාර්ක් 15 |
| සෙනසුරාදා | මාර්ක් 16 |

## ප්‍රාතිහාර්යය

- ✦ යේසුස්වහන්සේ විසින් සිදුකරන ලද ප්‍රාතිහාර්යයන් ගැන බොහෝ සඳහන් මාර්ක්ගේ වාර්තාවේ අඩංගුය.
- ✦ ප්‍රාතිහාර්යයන් සිදුවිය නොහැකි හෝ අනවශයය ලෙස සලකා ඒවා බැහැර කිරීමට සමහරු උත්සාහ ගනී. ඒසේ වුවත්, ප්‍රාතිහාර්යයන් කෙතරම් වැදගත් දැයි අල්ප සිතුවිල්ලකට වුවද පෙනේ.
- ✦ ඉතිහාසයේ විසම යුගවල විසම ප්‍රාතිහාර්යයන් තිබී ඇත.

  (අ) පාරාවෝ සඳහා - පීඩා දසය
  (ආ) නව ගිවිසුම් කාලයේ - සුව කිරීමේ ප්‍රාතිහාර්යයන්
  (ඇ) පසු දවස්වල - බයිබලයේ සංරක්‍ෂණය
  (ඈ) <u>අද</u> - ඉශ්‍රායෙල්ගේ පැවැත්මේ ප්‍රාතිහාර්යය

- ✦ ප්‍රාතිහාර්යයන් යනු, විශ්වාසයට ගෙන ඒම සඳහා හෝ පැමිණෙන විනිශ්චය ගැන අනතුරු ඇඟවීම සඳහා හෝ මිනිසුන්ගේ ක්‍රියාකාරකම් තුළ දෙවියන්වහන්සේ සිදු කරන ක්‍රියාය. දිවැස්වරුන් සහ යේසුස් වහන්සේ තුළ දෙවියන්වහන්සේ ක්‍රියා කල බවට ඒවා සාක්ෂි විය.

## දිනපතා සටහන්

<u>ඉරිදා - මාර්ක් 10 -</u> තමන්වහන්සේගේ අති උත්තම ජිවිතයෙන් මිනිසුන් සහ ගැහැණුන් මුදවා ගැනීම සඳහා යේසුස්වහන්සේ පැමිණි සේක. (43-45 පද) මෙසායාගේ නිල නාමය වුයේ "දාවිත්ගේ පුත්‍රයා" (47 පදය) යන්නය. 2 සාමුවෙල් 7:12-16, යෙසායා 9:6-7 තුළ දෙවියන්වහන්සේගේ පොරොන්දුව බලන්න.

<u>සඳුදා - මාර්ක් 11 -</u> තමන්වහන්සේගේ ජිවිතයේ අවසන් සතිය සඳහා යේසුස් වහන්සේ යෙරුසලෙමට පැමිණි සේක. අත්තික්කා ගස (12-14 පද) ඉශ්‍රායෙල් ජාතියේ සංකේතයක්වූ අතර යේසුස්වහන්සේගේ ක්‍රියාව සංකේතාත්මකය. මාර්ක් 13:28-29 බලන්න.

<u>අඟහරුවාදා - මාර්ක් 12 -</u> "ආබ්‍රහම්ගේ දෙවියන්වහන්සේ" (26 පදය) අප පසුගිය සතියේ කියැවු නික්මයාම 3:6 හි තවත් ප්‍රතිරාවයකි.

<u>බදාදා - මාර්ක් 13 -</u> 33 පදය. ක්‍රිස්තුස්වහන්සේ ඉතා ආසන්නව පැමිණෙද්දී "ප්‍රවේසම් වී අවදිවසිඳ යාච්ඤා කරපල්ලා" යන්න අපට යහපත් අවවාදයකි.

<u>බ්‍රහස්පතින්දා - මාර්ක් 14 -</u> පූප කැඩීම, පැමිණෙන රාජ්‍යය දෙස බලාහිඳීමය (25 පදය) පේත්‍රුස්ගේ බිය සලකන්න. (66-71 පද) මෙය ක්‍රියා 4:31 සමඟ සසඳන්න. එවැනි පරිවර්තනයක හේතුව නැගිසිටි ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍යය පමණි.

<u>සිකුරාදා - මාර්ක් 15 -</u> යේසුස්වහන්සේගේ මරණය අවස්ථාවේ උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බැව් පෙන්වුයේ නම් (39 පදය) උන්වහන්සේගේ උත්තානය එය කෙතරම් ප්‍රමාණයක් ඔප්පු කරයිද !

<u>සෙනසුරාදා - මාර්ක් 16 -</u> ආදම් ඒදනය අතහැරියාට පසු පැමිණි විශිෂ්ටතම උදෑසණ ! යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. ගැළවුම්කරුවාණෝය, පැමිණෙන රජුය. මෙම සුභාරංචිය කෙරෙහි විශ්වාසය පසුපස බෞතිස්මය පැමිණිය යුතුය. (15-16 පද)

| | |
|---|---|
| ඉරිදා | නික්මයාම 8 |
| සඳුදා | නික්මයාම 9 |
| අඟහරුවාදා | නික්මයාම 10 |
| බදාදා | නික්මයාම 11 |
| බ්‍රහස්පතින්දා | නික්මයාම 12 |
| සිකුරාදා | නික්මයාම 13 |
| සෙනසුරාදා | නික්මයාම 14 |

## මිසරයෙන් මුදා ගැනීම

- නික්මයාම, බොහෝ මහත් ප්‍රාතිහාර්යයන් සමගින්, දෙවියන් වහන්සේ එකම දෙවියන්වහන්සේ බැව් පැහැදිලි කල සේක.
- සෑම පීඩාවක්ම මිසරයේ බල රහිත "දෙවිවරුන්" යැයි සැලකූ අයට එරෙහි සෘජු අභියෝගයක් විය.
- කුළුඳුලා මරණයට පත් කිරීම (මරණයේ පීඩාව) ගෙනෙනු ලැබුයේ නව වරක් ඉශ්‍රායෙලිතයන් මුදා හැරීමට මිසරය ප්‍රතික්ෂේප කල නිසාය. තමන්වහන්සේගේ ජනතාව, උන්වහන්සේගේ කුළුඳුලා, මුදවා ගැනීමේ අවසන් ක්‍රියාව මෙය විය.
- මිසරයෙන් මිදීම සහ "පාස්කු" බැටළු පැටවා මැරීම (එසේ හැඳින්වුයේ මරණයේ දූතයා රුධිරය ඉසින ලද නිවෙස් අතහැර යෑම නිසා) යුදෙව්වන් විසින් මෝසෙස්ගේ ව්‍යවස්ථාවේ වාර්ෂික පාස්කු උත්සවයේදී සමරනු ලබත්.
- යේසුස් ක්‍රිතුස්වහන්සේ, දෙවියන්වහන්සේ විසින් සපයන ලද, ක්‍රිස්තියානින්ගේ "පාස්කු බැටළුපැටවාණෝය." උන්වහන්සේගේ සැබෑ අනුගාමිකයන් විසින් නිතිපතා පූප සහ මිදියුෂ තුළින් සමරන පරිදි, උන්වහන්සේගේ රුධිරය පාපයෙන් සහ මරණයෙන් මුදවනවා ඇත.

## දිනපතා සටහන්

**ඉරිදා - නික්මයාම 8 -** මිසරයේ ප්‍රාතිහාර්යයන් ප්‍රත්ක්ෂේප කිරීම වනාහි, සිදුවිය නොහැකි සහසිද්ධීන් දසයක් පිළිගැනීමයි ! අප තවමත් මෙම ප්‍රශ්නය සමඟ සිටිනවා ඇත. ඉශ්‍රායෙල් මිසරයෙන් පලාගියේ කෙසේද?

**සඳුදා - නික්මයාම 9 -** "මාගේ සෙනඟ" (1 පදය) හෙබ්‍රෙව්වරු (ඉශ්‍රායෙල් දරුවෝ) දෙවියන්වහන්සේගේ සාක්ෂිකාරයෝය. (යෙසායා 43:12,21)

**අඟහරුවාදා - නික්මයාම 10 -** දෙවියන්වහන්සේ ගැනත් උන්වහන්සේගේ මාර්ග ගැනත් අපගේ දරුවන්ටත්, මුනුබුරන්ටත් අප ඉගැන්විය යුතුය. (2 පදය)

**බදාදා - නික්මයාම 11 -** පරිච්ඡේද හතක එකොලොස් වතාවක් "උඹලා දැනගන්නා පිණිස" යැයි දෙවියන්වහන්සේ පවසන සේක. මිසරවරුන්ට උන්වහන්සේගේ වැඩහිඳීමේ සාක්ෂි රාශියක් දුන්නද, ඔවුහු එය ප්‍රතික්ෂේප කලෝය.

**බ්‍රහස්පතින්දා - නික්මයාම 12 -** පාස්කු බැටළුපැටවා යේසුස්වහන්සේ දෙස යොමු කලේය. "ලෝකයේ පාපය දුරු කරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ" (යොහන් 1:29)

**සිකුරාදා - නික්මයාම 13 -** රතු මුහුද දෙසට ඉශ්‍රායෙල් මෙහෙය වීම දෙවියන්වහන්සේ තීරණය කල සේක. (පිලිස්තියාව සඳහා සම්මත තවලම් මාර්ගය නොවේ) (17-18 පද)

**සෙනසුරාදා - නික්මයාම 14 -** රතු මුහුද හරහා ප්‍රාතිහාර්යාත්මක ගමන (22 පදය) ඉශ්‍රායෙල් සඳහා බෞතිස්මයක් බඳු විය. 1 කොරින්ති 10:1-2 බලන්න. එය මිසරවරුනට මරණය ගෙන දෙන්නක් විය.





## ලූක්ගේ දිව්‍යමය අනුග්‍රහය ලැබූ යේසුස්වහන්සේගේ ජීවිත වාර්තාව

| | |
|---|---|
| ඉරිදා | ලූක් 1 |
| සඳුදා | ලූක් 2 |
| අඟහරුවාදා | ලූක් 4 |
| බදාදා | ලූක් 5 |
| බ්‍රහස්පතින්දා | ලූක් 7 |
| සිකුරාදා | ලූක් 9 |
| සෙනසුරාදා | ලූක් 10 |

- වෙදෙකුවූ ලූක්, අපෝස්තුලුවර පාවුල්ගේ කරුණාවන්ත උපස්ථායකයෙකු විය. ඔහු ක්‍රියා පොත ලියන ලදී. ක්‍රියා 1:1 බලන්න.
- රෝමානු යුගයේ ඓතිහාසික පසුබිම සමඟ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයේ සිද්ධීන් ඔහු "දැනගන්නා පිණිස" (3 පදය) සටහන් කලේය. උදාහරණ ලෙස බලන්න 1:5, 2:1, 3:1, 13:1, 21:4
- පළමුව ඉශ්‍රායලයේද නමුත් අන්‍ය ජාතීන්ගේද මහා වෛද්‍යවරයාණෝ සහ මනුෂ්‍ය පුත්‍රයා වශයෙන්ද, ගැළවුම්කාරයාණෝ ලෙසද වාර්තාව යේසුස් වහන්සේ පෙන්වයි. ලූක් 2:32 බලන්න.
- කාලයේ සිරිත අනුව ඇයගේ සැමියා වන යෝසෙප් සඳහන් කලද, 3 වැනි පරිච්ඡේදයේදී හේලිගේ දියණිය වූ මරියා හරහා යේසුස් වහන්සේගේ පෙළපත ලූක් අපට සපයයි. (23 පදය) දෙවියන්වහන්සේ විසින් තැනූ ආදම් දක්වා, දාවිත්ගේ පුත්‍රයෙකු වූ නේතන් තුළින් මෙම රේඛාව පසුපසට විහිදී ඇත. (38 පදය) එමගින් අප සියල්ලන් ආදම්ගෙන් පැවතෙන්නන් නිසා, සෑම මිනිසෙකුටම සම්බන්ධ ලෙස යේසුස් වහන්සේ පෙන්වාදී ඇත.

## දිනපතා සටහන්

**ඉරිදා - ලූක් 1 -** දෙවියන්වහන්සේගේ පුත්‍රයා (32-35 පද) යෙරුසලෙමේ දාවිත්ගේ සිංහාසනය මත සදාකාලයටම හිඳගන්නවා ඇත. (33 පදය) උන්වහන්සේ කන්‍යාවියකගේ පුත්‍රයා (27 පදය) සහ ශුද්ධාත්මය මගින් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පියාණෝය. (31, 35 පද)

**සඳුදා - ලූක් 2 -** දාවිත්ගේ නගරයේ උපන් යේසුස්වහන්සේ, තමන්වහන්සේ රජුවූ පසු ලෝකයට ප්‍රීතිය (10 පදය) සහ සාමය (14 පදය) ගෙනෙනවා ඇත.

**අඟහරුවාදා - ලූක් 4 -** යේසුස්වහන්සේ පරීක්ෂාව ජයගෙන, යෙසායා 61:2 අනාවැකි කී ලෙස දේශනාවේ සහ මිදීමේ මහා කර්තව්‍යය ආරම්භ කරයි.

**බදාදා - ලූක් 5 -** යේසුස්වහන්සේ තවමත් "මා පසුපස වරෙන්නැ"යි පවසයි. (11,27 පද) අප ප්‍රතිචාර දක්වන්නෙමුද? එය සඳහා අලුත් ආකල්පයක් අවශ්‍යය (38 පදය) පේත්‍රුස් එය දැන සිටියේය. (8 පදය)

**බ්‍රහස්පතින්දා - ලූක් 7 -** කිසියම් අයෙක් විශ්වාසය ප්‍රදර්ශනය කල විට, යේසුස්වහන්සේ නිතරම මවිත විය. (9 පදය) උන්වහන්සේ තවමත් අප කෙරෙන් විශ්වාසය බලාපොරොත්තු වන සේක. යේසුස්වහන්සේ සියල්ලන්ගේ හදවත් දන්නා සේක. (39-40, 47 පද)


**සිකුරාදා - ලූක් 9 -** ප්‍රොපේතවරු අතරින් යේසුස්වහන්සේ සැබැවින්ම විශිෂ්ටතමයාය, නමුත් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍ර, මෙසායාද විය. (19-20 පද)

**සෙනසුරාදා - ලූක් 10 -** උඩඟු අය හට යේසුස්වහන්සේ කවුදැයි යන දැනුම සැඟවී ඇතිව සේය. (21 පදය) යහපත් සමරිතානුවා සැමට අභියෝගයකි.

| | |
|---|---|
| ඉරිදා | නික්මයාම 16 |
| සඳුදා | නික්මයාම 17 |
| අඟහරුවාදා | නික්මයාම 19 |
| බදාදා | නික්මයාම 20 |
| බ්‍රහස්පතින්දා | නික්මයාම 24 |
| සිකුරාදා | නික්මයාම 25 |
| සෙනසුරාදා | නික්මයාම 32 |

## කාන්තාරයේ සංචාරය

✦ සිනයි කාන්තාරය හරහා ඉශ්‍රායෙල්ගේ සංචාරය තුළ අපට ආදර්ශ ඇත. "වහල්භාවය" කෙරෙන් පොරොන්දු දේශය කරා (දෙවියන්වහන්සේගේ රාජ්‍යය) සංචාරය කිරීමට අප කැඳවනු ලබයි.




නික්මයාමේ මාර්ගය

### දිනපතා සටහන්

<u>ඉරිදා - නික්මයාම 16 -</u> දෙවියන්වහන්සේගේ යහපත්කම ඉක්මනින් අමතක කල ඉශ්‍රායෙල් කෙඳිරිගෑමට පටන් ගනී. මන්නා (14-18 පද) දවස් පතා එකතු කර අනුභව කල යුතුව තිබුනි - ශුද්ධ ලියවිල්ලේ අපගේ දිනපතා කොටස මෙන්.

<u>සඳුදා - නික්මයාම 17 -</u> පහර දෙන ලද පර්වතය ( 6පදය) ජීවයේ උල්පතක් වන ක්‍රිස්තුස්වහන්සේ දෙස පෙන්විය. (1 කොරින්ති 10:4)

<u>අඟහරුවාදා - නික්මයාම 19 -</u> ඉශ්‍රායෙල්, දෙවියන්වහන්සේට විශේෂ විය. (5-6 පද) ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටින අය මෙන් (1 පේත්‍රුස් 2:9)

<u>බදාදා - නික්මයාම 20 -</u> දස පනත ඉශ්‍රායෙලයේ සන්තෝෂය සඳහා මග පෙන්වීමක් විය. මාර්ක් 12:28-34 සහ ලූක් 10:25-28 බලන්න.

<u>බ්‍රහස්පතින්දා - නික්මයාම 24 -</u> ඉශ්‍රායෙල් කීකරු වනවායැයි කිවද (7 පදය) අසාර්තක විය. අප සියල්ලන්ටම ගැළවුම්කරුවෙක් අවශ්‍යය !

<u>සිකුරාදා - නික්මයාම 25 -</u> කඳවුර මධ්‍යයේ තිබූ මණ්ඩපය, අපගේ ජීවිත මධ්‍යය තුළ සිටිය යුතු ක්‍රිස්තුස්වහන්සේ දෙසට ඉඳිරි දැක්විය.

<u>සෙනසුරාදා - නික්මයාම 32 -</u> අපගේ මාර්ගය තුළින් නොව, උන්වහන්සේගේ මාර්ගය තුළින් දෙවියන්වන්සේට වන්දනා කිරීම වැදගත්ය. (5 පදය) මිනිසා තම දෙවිවරුන් සාදාගන්නා නමුත් ඔවුන් සැම විටම අවමානයට පත්වේ.





| | |
|---|---|
| ඉරිදා | ලූක් 11 |
| සඳුදා | ලූක් 12 |
| අඟහරුවාදා | ලූක් 13 |
| බදාදා | ලූක් 14 |
| බ්‍රහස්පතින්දා | ලූක් 15 |
| සිකුරාදා | ලූක් 16 |
| සෙනසුරාදා | ලූක් 17 |

## යාච්ඤාව සහ වන්දනාව

✦ ස්වාමින්ගේ යාච්ඤාවෙහි (ලූක් 11) නිහතමානිකම, ප්‍රශංසාව, දෙවියන් වහන්සේගේ අපේක්ෂාව හඳුනා ගැනීම, උන්වහන්සේගේ පැමිණෙන රාජ්‍යය, උන්වහන්සේ-ගේ දිනපතා සැපයුම, සමාව සඳහා අපගේ අවශ්‍යතාවය සහ ශක්තිය නමැති සක්‍රිය සංඝටක අඩංගුය.

✦ දෙවියන්වහන්සේ ශුද්ධය. (ලූක් 11:2) අප උන්වහන්සේ වෙතට පැමිණෙන්නට නම් අපගේ පාප යේසුස්වහන්සේ තුළින් උන්වහන්සේ සපයන මාර්ගයෙන් ආවරණය කල යුතු වේ.

✦ යේසුස්වහන්සේ මාර්ගයය, සත්‍යයය, ජීවනයය. වෙනත් මාර්ගයක් නොමැත. වෙනත් සත්‍යයක් නොමැත. උන්වහන්සේගෙන් තොර සදාකාල ජීවිතයක් නොමැත.

✦ දෙවියන්වහන්සේ සහ මිනිසුන් අතර එකම සැබෑ අතරමැදියා ක්‍රිස්තුස්වහන්සේය. (1 තිමෝති 2:5) අවසානයේදී යාච්ඤාව සහ වන්දනාව පුදකල යුත්තේ උන්වහන්සේ හරහාය.

### දිනපතා සටහන්

<u>ඉරිදා - ලූක් 11 -</u> අපගේ දිනපතා භෝජනය, භෞතික සහ ආත්මික යන දෙකම පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන් වන අතර ඒ දෙකම සඳහා අපි උන්වහන්සේට ස්තුති කල යුතුවෙමු.

<u>සඳුදා - ලූක් 12 -</u> 31 පදය අප පළමුවෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යය සහ උන්වහන්සේගේ ධර්මිෂ්ඨභාවය සොයන්නේ නම් අපට සැබවින්ම අවශ්‍යය සියලුම දේ උන්වහන්සේ සපයනු ඇත.

<u>අඟහරුවාදා - ලූක් 13 -</u> ඔවුන් ගළවාගැනීම සඳහා යුදෙව්වන් මනස්තාප වේ යැයි යේසුස්වහන්සේ බලාපොරොත්තු විය. (34 පදය) ඉක්මනින් එක් දිනෙක එය සිදුවනු ඇත. (35 පදය සහ සෙකරියා 12:10)

<u>බදාදා - ලූක් 14 -</u> උන්වහන්සේගේ ආරාධනාව බාර ගැනීම වැලැක්විය හැකි කිසි දෙයක් දෙවියන්වහන්සේට ප්‍රමුඛව අපගේ ජීවිත වල නොතිබිය යුතුය. (15-20 පද) ක්‍රිස්තුස්වහන්සේගේ මාර්ගය නිහතමානිකමයි. (11 පදය)

<u>බ්‍රහස්පතින්දා - ලූක් 15 -</u> දෙවියන්වහන්සේ වෙතට නැවත යන නොක් (24 පදය) මිනිසුන් සහ ගැහැණුන් "මියගොස්ය" (එපිස 2:1) නමුත් උපමාවේ පියා ලෙස, මනස්තාප වන සියල්ලන් උන්වහන්සේ සතුටින් ආශිර්වාද කරනු ඇත.

<u>සිකුරාදා - ලූක් 16 -</u> "මෝසෙස් සහ අනාගතවක්තෘන්" සහ යේසුස් වහන්සේගේ උත්ථානය, සියල්ලන් සඳහා ඒකාබද්ධ සාක්ෂි සපයයි. (31 පදය)

<u>සෙනසුරාදා - ලූක් 17 -</u> පරිසිවරු ක්‍රිස්තුස්වහන්සේ එනතෙක් බලා හිඳිනවා යැයි ප්‍රකාශ කල නමුත්, උන්වහන්සේ පැමිණි විට හඳුනා නොගත්හ. උන්වහන්සේ ඔවුන් තුළ (අතර) සිටි නමුත් ඔවුන් උන්වහන්සේගේ උගැන්වීම් පිළිනොගත්හ. (21 පදය)


| | |
|---|---|
| ඉරිදා | ලෙවී කථාව 8 |
| සඳුදා | ලෙවී කථාව 10 |
| අඟහරුවාදා | ලෙවී කථාව 16 |
| බදාදා | ලෙවී කථාව 17 |
| බ්‍රහස්පතින්දා | ලෙවී කථාව 23 |
| සිකුරාදා | ලෙවී කථාව 25 |
| සෙනසුරාදා | ලෙවී කථාව 26 |

## මණ්ඩපය

- ✦ මණ්ඩපය (වචනයේ තේරුම කූඩාරමයි), කාන්තාරයේදී ඉශ්‍රායෙලය සඳහා වන්දනාවේ කේන්ද්‍රය විය යුතුව තිබුනි.
- ✦ සම්පූර්ණ ඉශ්‍රායෙල් ජනතාව උදෙසා සමාව යැදීමට වසරේ එක් දිනක්, සමගිකමේ දිනයේදී උත්තම පූජකයාට පමණක් ශුද්ධ ස්ථානයට (සැලැස්ම බලන්න) ඇතුළු වීමට අවසර දෙන ලදී.
- ✦ ව්‍යවස්ථාව සහ මණ්ඩපය පෙනී සිටි සියල්ල යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සම්පූර්ණ කල සේක.

## ලෙවී කථාව

- ✦ ලෙවී කථාව යනු පූජකයන් (ලෙවී ගෝත්‍රයෙන්), පූජා සහ සැබෑ වන්දනාවේ වැදගත්කම ගැන පොතය.




1. ගිවිසුම් පෙට්ටිය
2. තිරය
3. දුම් පූජාසනය
4. පහන් රුක
5. පිදීමේ රොටි තබන මේසය
6. සේදීමේ භාජනය
7. දවන පූජා පූජාසනය

මණ්ඩපයේ සැලැස්ම

### දිනපතා සටහන්

**ඉරිදා - ලෙවී කථාව 8 -** අප දෙවියන්වහන්සේට සේවය කරන්නට නම්, අපගේ හදවතේ සැලකිලිමත් සූදානමක් අවශ්‍යය. (5 පදය)

**සඳුදා - ලෙවී කථාව 10 -** නැවතවරක්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ මාර්ගය තුළින් සේවය කිරීම වැදගත්ය. (3 පදය)

**අඟහරුවාදා - ලෙවී කථාව 16 -** සමගි කිරීමේ දවස වාර්ෂිකව සමරන ලදී. නමුත් ක්‍රිස්තුස්වහන්සේ සදාකල් මිදීම ලබාදුන් සේක. (හෙබ්‍රෙව් 9:12, 10:19-22)

**බදාදා - ලෙවී කථාව 17 -** ජීවිතය ඇත්තේ රුධිරයේය. (11 පදය) ක්‍රිස්තුස් වහන්සේගේ "රුධිරය" යන්නෙහි අරුත උන්වහන්සේගේ ජීවිතය දීමයි. (හෙබ්‍රෙව් 13:20)

**බ්‍රහස්පතින්දා - ලෙවී කථාව 23 -** සෑම වර්ෂයක් සඳහා යුදෙව් ආත්මික දින දර්ශනය මෙම පරිච්ඡේදය විස්තර කරයි. මෙයින් අදහස් වන්නේ ජාතිය එකමුතුව සිටීමයි.

**සිකුරාදා - ලෙවී කථාව 25 -** ඉශ්‍රායෙල් දේශය දෙවියන්වහන්සේගේ දේශයයි. නමුත් වර්තමානයේ උන්වහන්සේ එහි හිමිකරු ලෙස තවම හඳුනා නොගැනේ. (23 පදය)

**සෙනසුරාදා - ලෙවී කථාව 26 -** 33 පදය සෑම අංගයකින්ම අනාගත වාක්‍යය සත්‍යවුනි. ආශිර්වාදයේදී හෝ ශාපයේදී හෝ උන්වහන්සේගේ වැඩ සිටීමට දෙවියන්වහන්සේගේ සාක්ෂිකාරයෝ ඉශ්‍රායෙල්ය.






## කුරුසියේ මාර්ගය

- ✦ කුරුසිය තමන් ඉදිරියේ ඇති බැව් යේසුස්වහන්සේ දැනගත් නමුත්, උන්වහන්සේ "යෙරුසලමට යන පිණිස ඔවුනට පෙරටුව ගියසේක" මෙම සසඳුම් රේඛාව දිගේ යන්න. ලූක් 9:51-53, 17:11, 19:28, 37, 41, 45, අවසානයේදී නගරයෙන් පිටත උන්වහන්සේ කුරුසිගත කරන ලදී. (හෙබ්‍රෙව් 13:12-14)

| | |
|---|---|
| ඉරිදා | ලූක් 18 |
| සඳුදා | ලූක් 19 |
| අඟහරුවාදා | ලූක් 20 |
| බදාදා | ලූක් 21 |
| බ්‍රහස්පතින්දා | ලූක් 22 |
| සිකුරාදා | ලූක් 23 |
| සෙනසුරාදා | ලූක් 24 |

## දේව මාලිගය සහ නගරය

- ✦ හෙරෝද්ගේ දේව මාලිගය විනාශ කිරීමටත් (ලූක් 21:6) අන්‍යජාතීන් විසින් නගරය පෙරළා දැමීමටත් තිබුනි. (ලූක් 21:24)
- ✦ "ගොඩනගන්නන් ප්‍රතික්ෂේප කල ගල" (යේසුස්වහන්සේ) (20:7) දෙවියන්වහන්සේගේ සැබෑ ගෘහයේ පදනමය, එනම් උන්වහන්සේ වාසස්ථානය කරගන්නා ජනතාවය. (එපීස 2:19-22)




### දිනපතා සටහන්

**ඉරිදා - ලූක් 18 -** අප දෙවියන්වහන්සේ වෙත පැමිණෙන විට, නිහතමානිත්වය සහ අපගේම නොවටිනා බව හඳුනා ගැනීම අත්‍යාවශ්‍යය. (14 පදය)

**සඳුදා - ලූක් 19 -** රාජ්‍යයේ ස්ථාපිතය අනාගතයේදිය. යේසුස්වහන්සේ නියෝජනය කරන වංශවතා (11-12 පද) නැවත පැමිණෙන විට දර්ශනය වීමටය.

**අඟහරුවාදා - ලූක් 20 -** දෙවියන්වහන්සේගේ පුත්‍රයා සහ දාවිත්ගේ "ස්වාමින්" (41-44 පද) හට තමන් සසඳමින් යේසුස්වහන්සේ ගීතාවලිය 110 උපුටා දක්වයි.

**බදාදා - ලූක් 21 -** යුදෙව් නොවන ආධිපත්‍යයෙන් යෙරුසලම නිදහස් කිරීම (24 පදය) ලෝක ව්‍යාප්ත ව්‍යසන (25-26 පද) සමඟ ඒකා බද්ධ වන අතර එය ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම ප්‍රකාශ කරයි. (27 පදය)

**බ්‍රහස්පතින්දා - ලූක් 22 -** උන්වහන්සේගේ රාජ්‍යයේදී තමන්වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ පූප සහ මිදියුෂ බෙදා ගැනීමට යේසුස්වහන්සේ අපේක්ෂා කල සේක. (16-18 පද)

**සිකුරාදා - ලූක් 23 -** පෘථිවිය "පාරාදීසයක්" (උයනක්) වූ විට, පැමිණෙන රාජ්‍යය කෙරෙහි (42 පදය) සොරා විශ්වාස කලේය. (43 පදය)

**සෙනසුරාදා - ලූක් 24 -** පැරණි ගිවිසුම වටහා ගැනීම එහි ඉගැන්වීම් හරහා ක්‍රිස්තුස්වහන්සේ දර්ශනය වීමට සම්බන්ධය (25-27, 44-45 පද) උත්ථාන වූ ක්‍රිස්තුස්වහන්සේ තවමත් පැරණි ගිවිසුම පාවිච්චි කලහ. සැබෑ ක්‍රිස්තියානියට එය අත්‍යාවශ්‍යය.

| | |
|---|---|
| ඉරිදා | ගණන් කථාව 14 |
| සඳුදා | ගණන් කථාව 17 |
| අඟහරුවාදා | ගණන් කථාව 20 |
| බදාදා | ගණන් කථාව 21 |
| බ්‍රහස්පතින්දා | ගණන් කථාව 22 |
| සිකුරාදා | ගණන් කථාව 23 |
| සෙනසුරාදා | ගණන් කථාව 24 |

## ගණන් කථාවේ පොත

- ✦ මෝසෙස්ගේ හතරවැනි පොත වූ ගණන් කථාව, එසේ හඳුන්වන්නේ කාන්තාරයේ සිටි ඉශ්‍රායෙල්ගේ ගණන් ගැනීම් (සංගණන) දෙකක් එහි අඩංගු බැවිනි. (ගණන් කථාව, 1 පරිච්ඡේදය සහ 26 පරිච්ඡේදය)
- ✦ විශ්වාසය නොමැතිකම නිසා නික්මයාම අවස්ථාවේ මිසරය අත්හැර පැමිණි පරම්පරාවේ සියල්ලන්ම පාහේ කාන්තාරයේදී මිය ගියහ. වඩා අධික විශ්වාසයක් පෙන්වීම සඳහා අලුත් පරම්පරාවකට අවස්ථා දෙන ලදී.
- ✦ කානාන් දේශය අයත් කර ගැනීමට සූදානම් ජාතියක් ලෙස ගෝත්‍ර 12 අනුරූප වූ වාර්තාව ගණන් කථාව කරගෙන යයි.

## ක්‍රිස්තුස්වහන්සේ සහ කාන්තාර ගමන

- ✦ ඉශ්‍රායෙල්ගේ අත්දැකීම, ක්‍රිස්තුස්වහන්සේ දෙසට බොහෝ "ආකෘති" හෝ "ජායා" සපයයි.
- ✦ ගණන් කථාව තුළ මේවා ඇතුළු උදාහරණ කිහිපයක් හමුවේ.

(අ) කලෙබ් - යූදා ගෝත්‍රයේ විශ්වාසය සපිරි මිනිසෙක්
(ආ) යෝෂුවා - ඔහුගේ හෙබ්‍රෙව් නම යේසුස් නමැති ග්‍රීක නමට සමය. ඔහුද දෙවියන්වහන්සේගේ ජනතාවගේ නායකයෙකු විය.
(ඇ) ඒරොන් - උත්තම පූජකයා, යේසුස්වහන්සේ වඩා උත්තම පූජකයාණෝය.
(ඈ) දළු දැමූ ඒරොන්ගේ සැරයටිය (17:8) පහත සටහන් බලන්න.
(ඉ) පහර දෙන ලද පර්වතය. (නික්මයාම 17:6, ගණන් කථාව 20:11, 1 කොරින්ති 10:4 සමඟ සසඳේ.)
(ඊ) පිත්තල සර්පයා - කුරුසිගත කල ක්‍රිස්තුස්වහන්සේට සමානය. (ගණන් කථාව 21: 8-9, යොහන් 3:14)

### දිනපතා සටහන්

**ඉරිදා - ගණන් කථාව 14 -** 21 පදය මනුෂ්‍යයා නොතකා, පෘථිවිය තමන්වහන්සේගේ මහිමයෙන් පිරවීමට දුන් පොරොන්දුව දෙවියන්වහන්සේ ඉටුකරන්නේය. (හබක්කුක් 2:14 සසඳන්න.)

**සඳුදා - ගණන් කථාව 15 -** 8 පදය මියගිය සැරයටියකින් කොට්ටම්බා හට ගැනීම, ක්‍රිස්තුස්වහන්සේ සහ උත්ථානය දෙසට අප යොමු කරයි.

**අඟහරුවාදා - ගණන් කථාව 20 -** මෙසෙස් හට පර්වතය අමතන්නට අණ කලද (8 පදය) ඔහු එයට පහර දී (11 පදය) දෙවියන්වහන්සේ අසතුටට පත් කලේය.

**බදාදා - ගණන් කථාව 21 -** මෙම අවස්ථාවේදී මණ්ඩපයටවත්, ව්‍යවස්ථාවේ පූජාවල් වලටවත් ඉශ්‍රායෙල් හට උදව් කිරීමට නොහැකි විය. නමුත් ක්‍රිස්තුස්වහන්සේ දෙස යොමුකල දෙවියන්වහන්සේගේ නියමයවූ විශ්වාසයට හැකිවෙයි.

**බ්‍රහස්පතින්දා - ගණන් කථාව 22 -** දෙවියන්වහන්සේගේ දූතයා ප්‍රතිවාදියෙක් වූයේ (හෙබ්‍රෙව් වචනය "සාතන්ය") බලාම් ඉශ්‍රායෙල් හට ශාප කිරීම වැලැක්වීමටය. (22 පදය)

**සිකුරාදා - ගණන් කථාව 23 -** ආබ්‍රහම්, ඊසාක් සහ යාකොබ් සඳහා කල පොරොන්දු දෙවියන්වහන්සේ ඉටුකරනු ඇත. (19 පදය සහ රෝම 11:29)

**සෙනසුරාදා - ගණන් කථාව 24 -** 17-19 පද මෙය "පසු කාලයේදී" දුශ්කර යුගයකදී යේසුස්වහන්සේ දර්ශණය වී ඉශ්‍රායෙල් ගළවා ගැනීම සඳහා අනාගත වාක්‍යයකි. (14 පදය)





## යොහන්ගේ දිව්‍යමය අනුග්‍රහය ලැබූ යේසුස්වහන්සේගේ ජීවිත වාර්තාව

| | |
|---|---|
| ඉරිදා | යොහන් 1 |
| සඳුදා | යොහන් 3 |
| අඟහරුවාදා | යොහන් 4 |
| බදාදා | යොහන් 10 |
| බ්‍රහස්පතින්දා | යොහන් 11 |
| සිකුරාදා | යොහන් 15 |
| සෙනසුරාදා | යොහන් 17 |

- ✦ යොහන්, "යේසුස්වහන්සේ ප්‍රේම කල ගෝලයා," උන්වහන්සේගේ ක්‍රියා ගැන ගැඹුරු, විචක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරයි. 20 වැනි පරිච්ඡේදයේ 30-31 පදවල ඔහු තම අභිප්‍රාය සටහන් කරයි.
- ✦ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ නියෝජිතයා වූ එකම ඒක ජාතක පුත්‍රයා ලෙසත්, මැවීමේ ක්‍රියාවලියට පෙර පවා දෙවියන්වහන්සේගේ මනස සහ අභිප්‍රාය තුළ සිටි බවත් හෙතෙම පෙන්වයි. එම අර්ථයෙන් යේසුස්වහන්සේ "පටන්ගැන්මේදී" පැවතුනත්, උන්වහන්සේ දෙවියන්වහන්සේගේ වචනය (සැලැස්ම හෝ අභිප්‍රාය) ක්‍රිස්තුස්වහන්සේගේ උපතේදී "මාංශගත වීම" දක්වා නොපැවතුනු බවත් පෙන්වයි. (1 පේත්‍රුස් 1:19-20 හි පේත්‍රුස් මෙය කෙසේ විස්තර කරන්නේදැයි බලන්න.)
- ✦ යේසුස්වහන්සේ ගැන තුලනාත්මක දැක්මක් සඳහා මෙම සුභාරංචිය අවධානයෙන්, අඛණ්ඩව සහ යාච්ඤාවෙන් කියැවිය යුතුය. යොහන්ගේ සුභාරංචිය පමණක් කියවන බොහෝ අය තුළ උන්වහන්සේ ගැන වැරදි සංකල්පයක් ඇත. දෙවියන්වහන්සේ අපට සුභාරංචි හතරක් දුන් බව සිහිතබා ගන්න.
- ✦ බයිබල් උගැන්වීම් සංක්ෂිප්තයක් සඳහා 60-63 පිටු බලන්න.

### දිනපතා සටහන්

**ඉරිදා - යොහන් 1 -** දෙවියන්වහන්සේගේ ස්වරූපය අපට පෙන්වීම සඳහා යේසුස්වහන්සේ පැමිණි සේක. දෙවියන්වහන්සේම දර්ශණය නොවූ සේක. (18 පදය) එසේ වුවත්, යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

**සඳුදා - යොහන් 3 -** දෙවියන්වහන්සේගේ පුත්‍රයා තුළ විශ්වාස කිරීම අතිශයින් වැදගත්ය. (15-18, 34-36 පද), බෞතිස්මයද අත්‍යාවශ්‍යය. (5 පදය)

**අඟහරුවාදා - යොහන් 4 -** යේසුස්වහන්සේ කවුරුන් වී දැයි ස්ත්‍රියගේ වටහා ගැනීමේ වැඩීම දෙස බලන්න. (9, 15, 19, 25, 29 පද).

**බදාදා - යොහන් 10 -** තම බැටළු පැටවුනට යේසුස්වහන්සේ සදාකාල ජීවිතය දෙනු ඇත. (උන්වහන්සේ විශ්වාස කර අනුගමනය කරන්නන්) (28 පදය)

**බ්‍රහස්පතින්දා - යොහන් 11 -** උත්ථානය යනු මරණින් ශාරීරිකව නැගිටීමකි. අවසන් දවසේදී උත්ථානය ගැන අදහන්නැයි යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන්විය. (24 පදය සහ යොහන් 5:29)

**සිකුරාදා - යොහන් 15 -** අප ක්‍රිස්තුස්වහන්සේගේ මිත්‍රයෝද? (13 පදය) මිත්‍රත්වයේ කොන්දේසි උන්වහන්සේ දීග හරියි. (10 සහ 14 පද)

**සෙනසුරාදා - යොහන් 17 -** එම කාලයේ තම අනුගාමිකයන් හට සහ ඔවුන් තුළින් ඇදහීමට පැමිණෙන අය සඳහා යේසුස්වහන්සේගේ මහත් යාච්ඤාව මෙයය. (20 පදය)

| | |
|---|---|
| ඉරිදා | ද්විතීය කථාව 1 |
| සඳුදා | ද්විතීය කථාව 2 |
| අඟහරුවාදා | ද්විතීය කථාව 3 |
| බදාදා | ද්විතීය කථාව 6 |
| බ්‍රහස්පතින්දා | ද්විතීය කථාව 8 |
| සිකුරාදා | ද්විතීය කථාව 18 |
| සෙනසුරාදා | ද්විතීය කථාව 28 |

## ද්විතීය කථාව

- ✦ නමෙහි අරුත "ව්‍යවස්ථාව පුනරුච්චාරණය" කිරීමය. ද්විතීය කථාව 17:18 බලන්න.
- ✦ තම මරණයට ස්වල්ප කාලයකට ප්‍රථම, කාන්තාරයේ සංචාරය ගැන ඉතිහාසයත්, තමන් වහන්සේගේ ජනතාවට දෙවියන් වහන්සේ කල සියල්ල ගැනත් මොසෙස් නැවත පැවසිය. ඔහු අලුත් පරම්පරාවක් ආමන්ත්‍රණය කරමින් සිටිය නමුත් ජාතියක් වශයෙන් ඉශ්‍රායලය කීකරු නොවන බැව් දෙවියන්වහන්සේ දැන සිටි සේක.
- ✦ විශ්වාසය මුදුන්පත් කරගන්නා සහ නඩත්තු කරගන්නා ක්‍රමයේ නොවෙනස් ප්‍රතිපත්ති ගැන හෙතෙම පැවසිය. මෙම ප්‍රතිපත්තිම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ සේක. ඒ මත ජීවත් වූ සේක.
- ✦ නමුත් ඉශ්‍රායෙල් වටහාගත්තේවත්, කීකරුවුවේවත් නැත. ද්විතීය කථාවේ 28 හි දෙවියන්වහන්සේ විසින් දෙන ලද මෝසෙස්ගේ අනාවැකිය, විශේෂයෙන් ක්‍රි. ව. 70 සිට යුදෙව්වන් විඳි වේදනාවන් ගැන පැහැදිලි අනාවැකියකි.

## දිනපතා සටහන්

<u>ඉරිදා - ද්විතීය කථාව 1 -</u> ඔවුන් මිසරය අත හැරියාට පසු ගණන් ගන්නා ලද සියළුම මිනිසුන් අතරින්, පොරොන්දුවූ දේශයට ඇතුළු වන්නේ දෙදෙනෙකු පමණි, කාලෙබ් (36 පදය) සහ යෝෂුවා (38 පදය)

<u>සඳුදා - ද්විතීය කථාව 2 -</u> මිසරය අතහැරිය පරම්පරාවේ අතිබහුතරය කාන්තාරයේදී මියගියහ. හෙබ්‍රෙව් 3:17-19 බලන්න.

<u>අඟහරුවාදා - ද්විතීය කථාව 3 -</u> යෝෂුවා, කනාන් තුළට ඉශ්‍රායෙල් මෙහෙය වනු ඇත. (21 පදය) දෙවියන්වහන්සේගේ රාජ්‍යය තුළට තමන් හට කීකරු සියල්ල මෙහෙයවන නායකයා යේසුස්වහන්සේය.

<u>බදාදා - ද්විතීය කථාව 6 -</u> දෙවියන්වහන්සේගේ වචනය <u>අපගේ</u> හදවත් තුළ තිබිය යුතුය. (6 පදය) අප එය අපගේ දරුවනට ඉගැන්විය යුතු අතර ඒ ගැන නිතරම කථාකල යුතුය. (7 පදය)

<u>බ්‍රහස්පතින්දා - ද්විතීය කථාව 8 -</u> දෙවියන්වහන්සේගේ වචනයෙන් මිස අපට සැබවින්ම <u>ජීවත් විය</u> නොහැක. (3 පදය) යේසුස්වහන්සේ මෙය දැන සිටියහ. (මතෙව් 4:4)

<u>සිකුරාදා - ද්විතීය කථාව 18 -</u> යේසුස්වහන්සේ මෝසෙස් වැනි <u>දිව්‍යස්වරයාණෝය</u>. (15, 18 පද) උන්වහන්සේට අප සවන් දිය යුතුය. ක්‍රියා 3:22-16 සමඟ සසඳන්න.

<u>සෙනසුරාදා - ද්විතීය කථාව 28 -</u> ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමෙන් (යොහාන් 5:46-47 බලන්න) සහ ක්‍රි. ව. 70 දී ඉශ්‍රායෙල් පෙරලා දැමීමෙන්, දෙවියන් වහන්සේගේ ප්‍රොපේතවරයාවූ මෝසෙස්ගේ වචන සත්‍ය විය.





## ක්‍රියා පොත

| | |
|---|---|
| ඉරිදා | ක්‍රියා 1 |
| සඳුදා | ක්‍රියා 2 |
| අඟහරුවාදා | ක්‍රියා 3 |
| බදාදා | ක්‍රියා 4 |
| බ්‍රහස්පතින්දා | ක්‍රියා 5 |
| සිකුරාදා | ක්‍රියා 6 |
| සෙනසුරාදා | ක්‍රියා 7 |

- ✦ ක්‍රියා පොත ලූක් විසින් ලියන ලදුව (ක්‍රියා 1:1) එය ඔහුගේ සුභාරංචි වාර්තාවේ සන්තතයක් විය.
- ✦ එය සැබවින්ම "යේසුස් වහන්සේගේ සහ උන්වහන්සේගේ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා" ලෙස හැඳින්විය හැක. 2 පදය බලන්න. "යේසුස්වහන්සේ විසින් කර වන්නටත්, උගන්වන්නටත් <u>පටන්ගත්</u> සියල්ල."
- ✦ මරණය ජයගත් ක්‍රිස්තුස්වහන්සේ, අපෝස්තුලුවරයන් තුළින් ක්‍රියාකරමින්, අදහිලිවන්ත සමූහයන් ඉශ්‍රායලය තුළ, සමාරියාව තුළ සහ සැම තැනම ස්ථාපිත කලහ. (ක්‍රියා 1:8)
- ✦ පැරණි ගිවිසුමේ අඩංගු පොරොන්දු පාදක කරගනිමින්, එම තේමාවට ඉදිරියට ගෙනේ:

(අ) පෘථිවිය මත පැමිණෙන රාජ්‍යය
(ආ) ගැළවුම්කරු සහ රජු වශයෙන් යේසුස්වහන්සේගේ ක්‍රියාව
(ඇ) යේසුස්වහන්සේගේ උත්ථානය, උන්වහන්සේගේ අනුගාමිකයන්ගේ උත්ථානයත්, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන සහතිකයකි.
(ඇ) මනස්තාපයටත්, සුභාරංචි තුළ විශ්වාසයටත්, බෞතිස්මය ලැබීමටත් මිනිසාගේ අවශ්‍යතාවය.

## දිනපතා සටහන්

<u>ඉරිදා - ක්‍රියා 1 -</u> පොතේ පළමුවෙන් ඇති, යේසුස්වහන්සේ පුද්ගල විලාශයෙන් පෘථිවියට නැවත පැමිණීම ගැන පැහැදිලි පොරොන්දුව බලන්න. (11 පදය)

<u>සඳුදා - ක්‍රියා 2 -</u> තෙවරක් යේසුස්වහන්සේ ප්‍රතිෂේප කල පේත්‍රැස්, දැන් අභීතව යෙරුසලමේ සාක්ෂි දරයි. මනස්තාපය (හැරීම, නැවත සිතීම) විශ්වාසය සහ බෞතිස්මය අත්‍යාවශ්‍යය. (38, 41 පද)

<u>අඟහරුවාදා - ක්‍රියා 3 -</u> යේසුස්වහන්සේ ඇතුළුව දෙවියන්වහන්සේගේ සියලු ප්‍රොපේතවරු විසින් සඳහන් කරන ලද පරිදි, දේව රාජ්‍යය නැවත පිහිටු වීමට යේසුස්වහන්සේ නැවත පැමිණෙනු ඇත. (20-21 පද)

<u>බදාදා - ක්‍රියා 4 -</u> කෙතරම් මහත් ප්‍රකාශයක්ද ! (12 පදය) ගැළවීම දිය හැක්කේ ක්‍රිස්තුස්වහන්සේටත්, උන්වහන්සේගේ උගන්වීමටත් පමණි. වෙනත් කිසිම "ආගමකට" නොහැක.

<u>බ්‍රහස්පතින්දා - ක්‍රියා 5 -</u> යේසුස්වහන්සේගේ උත්තානයට ප්‍රකාශවන සාක්ෂියත් (30 පදය) උන්වහන්සේ ගැළවුම්කරු සහ රජු වශයෙන් ප්‍රකාශ කිරීම (31 පදය) සලකන්න.

<u>සිකුරාදා - ක්‍රියා 6 -</u> උත්ථානයට සාක්ෂිය ඉතා ප්‍රබල විය. බොහෝ යුදෙව් පූජකයන් පවා පිළිගත්හ. (7 පදය)

<u>සෙනසුරාදා - ක්‍රියා 7 -</u> ක්‍රිස්තුස්වහන්සේ සඳහා සාක්ෂි දැරූ ඇදහිලි-වන්තයෙකුගේ පළමුවැනි මරණය. ඉශ්‍රායෙල් ජාතියක් ලෙස සැම විටම දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කල අයුරු සහ දැන් උන්වහන්සේගේ පුත්‍රයා ප්‍රතික්ෂේප කල අයුරු ස්තේපන් පෙන්විය. (52 පදය) ටාර්සස්හි සාවුල් මෙම ඝාතනයට හවුල් විය. (ක්‍රියා 8:1)

| | | |
|---|---|---|
| ඉරිදා | යෝෂුවා | 1 |
| සඳුදා | යෝෂුවා | 2 |
| අඟහරුවාදා | යෝෂුවා | 3 |
| බදාදා | යෝෂුවා | 4 |
| බ්‍රහස්පතින්දා | යෝෂුවා | 6 |
| සිකුරාදා | යෝෂුවා | 20 |
| සෙනසුරාදා | යෝෂුවා | 24 |

## කානාන් යටත් කිරීම

- ✦ යෝෂුවාගේ කාලයේදී පොරොන්දු දේශය (කානන්) පිළිම වන්දනා කරන සහ තම ජිවන මාර්ග දූෂිතවූ අමෝරිවරු සහ කනාන්වරු වාසභූමි කොට සිටියහ. ඔවුන් මත දඬුවම් පැමිණ විමට පෙර බොහෝ කලක් දෙවියන්වහන්සේ බලා සිටි සේක. (උත්පත්ති 15:16)
- ✦ දෙවියන්වහන්සේ ඔවුන් සමඟ සිටි නිසා ඉශ්‍රායෙල්ට එම දේශයේ ජනතාව පරාජය කිරීමට හැකිවිය. එම පාපවලටම තමන් නොවැටෙන්නට, ප්‍රදේශ වාසභූමි කරන්නට මත්තෙන් ඔවුන් විනාශ කිරීමට නියම විය. යෝෂුවා යටතේ භූමිය යටත් කිරීම ප්‍රාතිහාර්යාත්මක විය.
- ✦ නමුත් පසුව, ඉශ්‍රායෙල්ගේ විශ්වාසය නොමැතිකමේ සහ සම්මුතියේ ප්‍රතිපලයක් ලෙස, පසුව හිරිහැර කිරීම සඳහා, දෙවියන්වහන්සේගේ සතුරන් බොහෝමයක් දේශයේ ඉතිරි විය.

## දිනපතා සටහන්

**ඉරිදා - යෝෂුවා 1 -** යෝෂුවා (යේසුස්වහන්සේ මෙන්) දෙවියන්වහන්සේගේ වචනය තුළ භාවනා කිරීම තම ජිවිතයේ අත්‍යාවශ්‍යය අංගයක් ලෙස සැලකිය. (8 පදය)

**සඳුදා - යෝෂුවා 2 -** 8-11 පද රාහබ් දෙවියන්වහන්සේගේ ජනයා පිළිගැනීම ඇයගේ විශ්වාසයේ සාක්ෂියයි. හෙබ්‍රෙව් 11:31 බලන්න. වසර 40 ක් පැරණි වූ, ඉශ්‍රායෙල්ගේ කීර්තිය බලන්න. (10 පදය)

**අඟහරුවාදා - යෝෂුවා 3 -** ගිවිසුම් පෙට්ටිය (11 පදය) පළමුව ගියේය. යේසුස්වහන්සේ අප සඳහා කරන පරිදි - දෙවියන්වහන්සේ රාජ්‍යය දෙසට ඉශ්‍රායෙල් මෙහෙයවිය.

**බදාදා - යෝෂුවා 4 -** පොරොන්දු දේශයට ඇතුළු විම සඳහා ඉශ්‍රායෙල් යොර්දාන් නදිය තරණය කලේය. ආබ්‍රහම්ට දුන් පොරොන්දු මල්පල ගැනෙන්ට විය. වසර ගණනකට පසු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒවා සහතික විය.

**බ්‍රහස්පතින්දා - යෝෂුවා 6 -** යෙරිකෝවේ පවුරු කඩා වැටුනු අතර අද එම නටඹුන් ඇත. රාහාබ්ගේ විශ්වාසය අමතක නොකල අතර මුදාගන්නේ යැයි ඇයට වූ පොරොන්දුව ඉටු කරන ලදී.

**සිකුරාදා - යෝෂුවා 20 -** විශ්වාසය සහ බෞතිස්මය තුළින්, අප ඇතුළු විය යුතු අපගේ "රැකරවණයේ නගරය" ක්‍රිස්තුස්වහන්සේය.

**සෙනසුරාදා - යෝෂුවා 24 -** ඉශ්‍රායෙල් හට කලාසේ (1-13 පද) අප මුදා ගැනීම පිණිස දෙවියන්වහන්සේගේ සූදානම කෙරෙහි අපගේ ප්‍රතිචාරයක් පැමිණිය යුතුය. (14, 24 පද)






## සුභාරංචියේ ව්‍යාප්තිය

| | | |
|---|---|---|
| ඉරිදා | ක්‍රියා | 8 |
| සඳුදා | ක්‍රියා | 9 |
| අඟහරුවාදා | ක්‍රියා | 10 |
| බදාදා | ක්‍රියා | 11 |
| බ්‍රහස්පතින්දා | ක්‍රියා | 12 |
| සිකුරාදා | ක්‍රියා | 13 |
| සෙනසුරාදා | ක්‍රියා | 14 |

- ✦ යෝෂුවා සහ ඉශ්‍රායෙල් තරණය කල යෝර්දාන් නදියේ තම බෞතිස්මයෙන් අනතුරුව, යේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ මෙහෙය ආරම්භ විය. තමන්ගේ මරණයට පෙර, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන දේශනා කරමින්, යේසුස්වහන්සේ තම රටෙහි සැම තැනම සංචාරය කලහ. (ලූක් 8:1)
- ✦ ස්වර්ගයට නැගුනායින් පසුව, උන්වහන්සේගේ අපෝස්තුලුවරුන් මගින් යෙරුසලෙමේ සිට පිටතට සුභාරංචිය ව්‍යාප්ත කිරීමට යේසුස්වහන්සේ ක්‍රියාකල සේක.
- ✦ සුභාරංචිය පළමුව යුදෙව්වන්ටද, ඉන්පසු සමරිතානුවන්ටද, ඉනික්බිතිව පරාවර්තිකයන්ටද (යුදා ආගමට පරිවර්තනය වූවන් - ක්‍රියා 8:27 හි ඉතියෝපියානුවා මෙන්) දේශනා කරන ලදී. ඉන්පසුව අන්‍ය ජාතිකයන් (යුදෙව් නොවන) කැඳවන ලදී. (ක්‍රියා 10)

අපෝස්තුලුවරුන්ගේ කාලයේ ඉශ්‍රායලයේ සිතියම




## දිනපතා සටහන්

**ඉරිදා - ක්‍රියා 8 -** දෙවියන්වහන්සේගේ රාජ්‍යය සම්බන්ධ දේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයත්, පසුපස පැමිණෙන බෞතිස්මයත් කෙරෙහි විශ්වාසයේ වැදගත්කම නිරීක්ෂණය කරන්න. (12, 27-38 පද)

**සඳුදා - ක්‍රියා 9 -** පාවුල් ද විශ්වාස කර බෞතිස්මය ලැබිය. (18 පදය) ක්‍රියා 22:16 බලන්න. බෞතිස්මයේදී ඔහුගේ පාප ක්ෂමා කරන ලදී.

**අඟහරුවාදා - ක්‍රියා 10 -** කොරනේලියස් වැනි යහපත් ජිවිතයක් ඇති කෙනෙකු (2 පදය) පවා, තමා කල යුත්තේ කුමක්දැයි ඉගෙන ගත යුතුව තිබුනි. (6 පදය) ඔහු විශ්වාස කර (42-43 පද) බෞතිස්මය ලැබිය. (48 පදය)

**බදාදා - ක්‍රියා 11 -** අන්‍යජාතින්ට යුදෙව්වන් හට මෙන් ජිවනයේ පොරොන්දු උරුමකරගත හැක. (18 පදය) "ක්‍රිස්තියානි" නමැති වචනයේ ප්‍රථම සඳහන නිරීක්ෂණය කරන්න. (26 පදය)

**බ්‍රහස්පතින්දා - ක්‍රියා 12 -** සිපිරිගෙයින් පේත්‍රුස්ගේ නිදහස් විම සඳහා ගෝලයෝ යාච්ඥා කලද (5 පදය) පිළිතුර පැමිණි විට ඔවුන් විශ්මයට පත් විය. (12-15 පද)

**සිකුරාදා - ක්‍රියා 13 -** ගීතාවලිය 16:10 දී ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය ගැන අනාවැකි පවසා තිබුනි. (30-37 පද) 2 සාමුවෙල් 7:13 වැනි පැරණි ගිවිසුම් අනාවැකි උන්වහන්සේ ඉටුකරනු ඇත. මෙහි අපටද සම්බන්ධ විය හැක. යෙසායා 55:3 බලන්න.

**සෙනසුරාදා - ක්‍රියා 14 -** අපට ධෛර්යය ගත හැක, විශ්වාසයේ දොරටුව තවමත් විවෘතය. (27 පදය)

| | |
|---|---|
| ඉරිදා | විනිශ්චයකාරයන්ගේ පොත 4 |
| සඳුදා | විනිශ්චයකාරයන්ගේ පොත 7 |
| අඟහරුවාදා | විනිශ්චයකායරන්ගේ පොත 14 |
| බදාදා | රූත් 1 |
| බ්‍රහස්පතින්දා | රූත් 2 |
| සිකුරාදා | රූත් 3 |
| සෙනසුරාදා | රූත් 4 |

## විනිශ්චයකාරයන්ගේ පොත

- යෝෂුවාගේ මරණින් පසු සාමුවෙල් දක්වා ඉශ්‍රායෙල්, දෙවියන්වහන්සේට සේවය කිරීමේ නිවැරදි මාර්ගය නිතරම අත්හැර දමා, පිළිම වන්දනාවට හුරුනු වකවානුවේ, වසර 400ක් විනිශ්චයකාරයන් ආණ්ඩු කලහ. උන්වහන්සේ කලින් කලට "විනිශ්චයකාරයන්" හෝ නායකන් ඔවුන් ගැළවීම සඳහා නැගිටවුවද, දෙවියන්වහන්සේ ඔවුන් තම සතුරන්ගේ අත්වලට පාවා දුන්හ. විනිශ්චයකාරයන්ගේ පොත 2:16-19 බලන්න.
- ඩෙබෝරා සහ බරාක්, ගිඩියන්, සහ සැම්සන් වැනි විනිශ්චයකාරයෝ මහත් විශ්වාසයකින් යුතු මිනිසුන් වූහ. අතිවිශිෂ්ට විශ්වාසයක් තිබූ අයගේ සටහනේ ඔවුන්ගේ නාමය ඇතුලත් විය. (හෙබ්‍රෙව් 11)

## රූත්ගේ කථාව

- විනිශ්චයකාරයන්ගේ යුගයේ, මෝවබ් ස්ත්‍රියක් වූ රූත්ගේ ප්‍රසන්න කථාව ආරම්භ විය.
- යුදා ගෝත්‍රයේ බෙත්ලෙහෙමේදී බෝවාස්ගේ භාර්යාව වීමෙන් ඇය ඉශ්‍රායෙලයට විවාහ විය. ඔවුන්ගේ පුත්‍රයා වර්ගයා නොකඩවා ගෙනගිය අතර අවසානයේදී ගැළවුම්කාරයා දෙසට මෙහෙය විය.

බෝවාස් = රූත්
ඔබෙද්
යෙසේ
දාවිත්
ක්‍රිස්තුස්

රූත් 4:18-22 බලන්න.

## දිනපතා සටහන්

**ඉරිදා - විනිශ්චය 4 -** ඩෙබෝරා සහ බරාක්ගේ තීරණාත්මක ජයග්‍රහණය (14-15 පද) ඉශ්‍රායලය මර්ධනයෙන් මුදාගත් අතර, පසු කාලීනව එය පාපයට එරෙහිව ක්‍රිස්තුස්වහන්සේගේ ජයග්‍රහණය රූපණය කිරීමට යොදා ගැනෙයි. විනිශ්චය 5:12, ගීතාවලිය 68:18, එපීස 4:8 බලන්න.

**සඳුදා - විනිශ්චය 7 -** දෙවියන්වහන්සේට මහත් හමුදාවක් අවශ්‍ය නොවිය. අවශ්‍යවූයේ සටනට සූදානම් විශ්වාසවන්ත මිනිසුන්ය. (1-8 පද)

**අඟහරුවාදා - විනිශ්චය 14 -** 5-6 පද. සැම්සන්ගේ ශක්තිය පැමිණියේ දෙවියන්වහන්සේගෙන්ය. දාවිත්ගේ සටන (1 සාමුවෙල් 17:34-36) සහ පාවුල්ගේ මුදා ගැනීම (2 තිමෝති 4:17) බලන්න.

**බදාදා - රූත් 1 -** රූත් මෝවබ් වලින් පැමිණි අමුත්තෙක් විය. නමුත් ඇය ඉශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ තෝරාගත් අතර (16 පදය), දෙවියන්වහන්සේ ඇයට ආශිර්වාද කල සේක. (රූත් 4:13)

**බ්‍රහස්පතින්දා - රූත් 2 -** 11 පදය තමාගේ ජනතාව අත්හැර දැමූ ඇය (ආබ්‍රහම් කලාසේ) ඉශ්‍රායෙල් දෙවියන්වහන්සේගේ පියාපත් යටතේ සරණ ලද්දීය. (12 පදය)

**සිකුරාදා - රූත් 3 -** කිහිප ආකාරයකින් ක්‍රිස්තුස්වහන්සේ දෙස පෙරට පෙන්වූ බෝවාස්, තමාගේ ගෞරවය ඔප්පු කර, සැබෑ ඥාතියෙක් - මිදුම්කරුවෙක් - ලෙස ක්‍රියා කලේය. (13 පදය)

**සෙනසුරාදා - රූත් 4 -** තම මනාලිය ලෙස සභාව ක්‍රිස්තුස්වහන්සේ මිළයට ගත්තා සේ, රූත් මිළයට ගන්නා ලදී. (10 පදය)





වසරේ ඉතිරි කොටස - සති 26 ක් - හයවැනි පියවර ඔබ රැගෙන යයි.

- දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි (අප සැමවිටම එවැනි භාෂිතයෙන් සිතිය යුතුය. මතෙව් 4:15 බලන්න.) දැනටමත් එලා ඇති පදනම් මත ගොඩනගන්නට ඔබට හැකිවිය යුතු අතර දෙවියන්වහන්සේගේ වචනයේ සියලු කොටස් සැලැස්මකට අයුරු ගැලපෙන බැව්ද පෙනෙනවා ඇත.

## පවත්වාගෙන යන්න !

- බයිබලය කියැවීම පහසුවෙන් ලඟාවෙන පුරුද්දක් නොවේ.

  දෙවියන්වහන්සේ මෙසේ පවසන සේක:


  "මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය..... අහස පොළවට වඩා උස්ව තිබෙන්නාක් මෙන් මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ." (යෙසායා 55:8-9)
- එසේ වුවත්, අපගේ මනස දෙවියන්වහන්සේගේ වචනයෙන් බලපෑම් ඇති වීමට ඉඩහරින්නේ නම්, එය දෙවියන්වහන්සේගේ මාර්ග කෙරෙහි වර්ධනයක් අපට දෙනු ඇත. "රසබලා ස්වාමීන්වහන්සේ යහපත් බැව් වටහාගන්න. !"

## දෙවියන්වහන්සේගේ වචනය බලසම්පන්නය

- අප නිවැරදි ප්‍රතිපත්ති තුළ දැනමුතුකම් දීමටත්, වැරදි අදහස් ඉවත් කිරීමටත්, යහපත් සියලු දෙසින් මනස පුරවන්නටත්, ගැළවීම සඳහා අප නැණවත් කරවන්නටත් දෙවියන්වහන්සේ විසින් එය සැලසුම් කර ඇත. (2 තිමෝති 3:15-16)
- මෙම ක්‍රියාවලිය ස්ථිරය, නිශ්චිතය. අපගේ වර්තමාන ප්‍රීතියටත් අනාගත සුභ සිද්ධියටත් එය අත්‍යාවශ්‍යය. උන්වහන්සේගේ වචනයේ සඳහන් පරිදි, සදාකාල ජීවිතය පවතින්නේ අප දෙවියන්වහන්සේගේ වචනය පිළිගැනීම මතය. (ක්‍රියා 29:32)
- සැමදා කියැවීමටත්, අවධානයෙන්, අඛණ්ඩව සහ යාච්ඤාවෙන් කියැවීමටත් මතක තබා ගන්න.

## හත්වැනි පියවර සඳහා ඇනවුම් කරන්න.

- 64 පිටුවේ විස්තර බලන්න.
- 64 පිටුවේ ලිපිනයට, ඕනෑම ප්‍රශ්නයක් හෝ අදහසක් කරුණාකර එවන්න.




පාවුල් ගමන්ගත් ස්ථානවල සිතියමක් (ක්‍රියා 13-21)

| | |
|---|---|
| ඉරිදා | ක්‍රියා 15 |
| සඳුදා | ක්‍රියා 16 |
| අඟහරුවාදා | ක්‍රියා 17 |
| බදාදා | ක්‍රියා 18 |
| බ්‍රහස්පතින්දා | ක්‍රියා 19 |
| සිකුරාදා | ක්‍රියා 20 |
| සෙනසුරාදා | ක්‍රියා 21 |

## පාවුල්ගේ සංචාර

- ✦ යේසුස්වහන්සේ සහ අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා ඇතුළු සිත්බඳනා කථාව අපි කරගෙන යන්නෙමු.
- ✦ බොහෝ විට තමනට මහත් විපත්දායක ධර්මදූත ගමන් පාවුල් කලේය. අන්‍යජාතීන්ට දේශනා කිරීම සඳහා ක්‍රිස්තුස් වහන්සේ ඔහු විශේෂයෙන් පත් කලද, සිරිතක් ලෙස ප්‍රථමයෙන් යුදෙව් සිනගෝගයට තම ප්‍රණාමය පුද කලේය.
- ✦ රෝමානු ලෝකය, සංවර්ධනය කරන ලද නව මහාමාර්ග සහ පොදු භාෂාව සමඟ, වේගයෙන් සුභාරංචිය ව්‍යාප්ත වූ පසු බිමයි. මෙය අහම්බෙන් සිදුවූවක් නොවිය. තම වචනයේ ව්‍යාපතිය සඳහා දෙවියන් වහන්සේ රෝමානු ආධිරාජ්‍යයේ යහපත් සංනිවේදන මාර්ග තෝරාගත් සේක.

### දිනපතා සටහන්

**ඉරිදා - ක්‍රියා 15** - 14-17 පද සුභාරංචියේ සාර්ථකත්වය සඳහා මෙම පරිච්ඡේදයේ සිද්ධීන් තිරණාත්මක විය. අන්‍ය ජාතීන්ගේ කැඳවීම පැරණි ගිවිසුම් අනාවැකි පළකොට තිබුනි. (උදාහරණ ලෙස, ආමෝස් 9:11-12)

**සඳුදා - ක්‍රියා 16** - ඇදහිම (21 පදය) සහ බෞතිස්මය (33 පදය), ගැළවීම (30 පදය) අවශ්‍ය සියල්ල සඳහා උවමනා බැව් නැවත පෙනෙයි.

**අඟහරුවාදා - ක්‍රියා 17** - යේසුස්වහන්සේගේ උත්ථානය, නැවත උන්වහන්සේ ලෝකය විනිශ්චය කිරීම සඳහා එවන බවට දෙවියන්ගේ සහතිකයයි.

**බදාදා - ක්‍රියා 18** - මෙසායා = ක්‍රිස්තුස් = දෙවියන්වහන්සේගේ ආලේපිත දිව්‍යස්වරයා, පූජකයා සහ රජු සඳහා යුදෙව්වෝ බලාපොරොත්තුවෙන් සිටියහ. යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේය. (28 පදය)

**බ්‍රහස්පතින්දා - ක්‍රියා 19** - නිශ්චය නොකරන විලාසයෙන් ජන රැල්ල සමඟ යෑම ඉතා පහසුය. 32 පදය බලන්න. ඩයනා, හෝ මිනිසා වන්දනා කරන අන් සියල්ලට වඩා, ක්‍රිස්තුස්වහන්සේ උතුම්ය.

**සිකුරාදා - ක්‍රියා 20** - ගෝලයන් අතර තිබූ දයාව නිරීක්ෂණය කරන්න. (1, 31, 36-38 පද)

**සෙනසුරාදා - ක්‍රියා 21** - තවත් විශ්වාසිකයන් සමඟ සමානවය (සහෝදරත්වය) ක්‍රිස්තුස්වහන්සේ තුළ ජීවිතයේ මහත් ආශිර්වාදයකි (4, 5, 7, 8, 17, 17 පද) එකිනෙකා කෙරෙහි සැලකිල්ලත්, එකිනෙකාගේ ප්‍රීතිය සහ ගැටළු බෙදා ගැනීමත් එහි සම්බන්ධකමකි.





## ඉශ්‍රායෙල් හට තවත් රජෙකු උවමනාවෙයි.

| | |
|---|---|
| ඉරිදා | 1 සාමුවෙල් 1 |
| සඳුදා | 1 සාමුවෙල් 2 |
| අඟහරුවාදා | 1 සාමුවෙල් 3 |
| බදාදා | 1 සාමුවෙල් 8 |
| බ්‍රහස්පතින්දා | 1 සාමුවෙල් 9 |
| සිකුරාදා | 1 සාමුවෙල් 10 |
| සෙනසුරාදා | 1 සාමුවෙල් 15 |

- ✦ සාමුවෙල්ගේ පොත, රාජධානිය ආරම්භය තෙක් ඉශ්‍රායෙල් ඉතිහාසය ගෙනයයි. සාමුවෙල් "විනිශ්චයකාරයන්ගේ" අන්තිමයා වූ අතර, තම අවට ජාතීන්ට මෙන් රජෙකු සඳහා ඔහු ඉවත් විය යුතුයැයි ඉශ්‍රායෙල් ඉල්ලා සිටියේය.
- ✦ නමුත් දෙවියන්වහන්සේ තම රජු බැව් ඉශ්‍රායෙල් හට අමතක වී තිබුනි. සාමුවෙල් ප්‍රතික්ෂේප කරමින් ඔවුහු දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කලහ. සාවුල් ඔවුන් සඳහා රජු වශයෙන් දෙන ලද නමුත්, හෙතෙම දෙවියන් වහන්සේට කිකරු නොවීමෙන් (1 සාමුවෙල් 15) අවසානයේදී දෙවියන්වහන්සේට ඔහු ඉවත් කිරීමට සිදු විය.
- ✦ කථාව ආරම්භ වන්නේ සාමුවෙල්ගේ උපත සහ ධර්ම දූත මෙහෙවරිනි. එම කාලයේ ඉශ්‍රායෙල්ගේ ප්‍රධාන සතුරා වූයේ පිලිස්තිනුවන්ය. එය ඔවුනට ගැටළු ඇති කලද (1 සාමුවෙල් 5) ඔවුන් විසින් ගිවිසුම් පෙට්ටිය පැහැර ගන්නා ලදී. (1 සාමුවෙල් 4)
- ✦ සාමුවෙල් යටතේ ඉශ්‍රායෙල්, නැවත දෙවියන්වහන්සේගේ වන්දනා කිරීම ආරම්භ කල විට (1 සාමුවෙල් 7), ඔවුන් පරාජය කරන ලදී.

### දිනපතා සටහන්

**ඉරිදා - 1 සාමුවෙල් 1** - දේව මාලිගය (9 පදය) වූයේ ෂිලෝහි පිහිටුවන ලද මණ්ඩපයයි. (කූඩාරම) ඉශ්‍රායෙල් පිරිහී තිබූ අතර ඔවුන්ගේ පූජකයෝ ආත්ම කේන්ද්‍රිය සහ කෑදර විය.

**සඳුදා - 1 සාමුවෙල් 2** - 1-10 පද, ලූක් 1:46-65 හි මරියාගේ වචන සමඟ සසඳන්න. හැනාගේ විශ්වාසයේ යාච්ඤාවට පිළිතුරු ලැබී තිබුනු අතර ඇය ප්‍රමුදිත විය. පොරොන්දු වූ පරිදි, උන්වහන්සේට දේව මාලිගයේ සේවය කිරීම සඳහා, සාමුවෙල් නැවත දෙවියන්වහන්සේ හට දෙන ලදී.

**අඟහරුවාදා - 1 සාමුවෙල් 3** - 4 පදය දෙවියන්වහන්සේ විසින් සාමුවෙල් කැඳවන ලද අතර, එලි නමැති මහලු මිනිසා පිළිතුරු දෙන ආකාරය ඔහුට කියා දුන්නේය. තමන්වහන්සේගේ ක්‍රියා තුළින් දෙවියන්වහන්සේ කථා කරන විට අපද සවන්දිය යුතුය.

**බදාදා - 1 සාමුවෙල් 8** - තමන් ප්‍රතික්ෂේප කලාවූ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ගේ විනිශ්චයකාරයා සහ රජු වූ සේක. (7 පදය) එම යුගයේ දෙවියන්වහන්සේගේ රාජ්‍යය ඉශ්‍රායෙල් වූවද, එය ඔවුන් අගය නොකලහ.

**බ්‍රහස්පතින්දා - 1 සාමුවෙල් 9** - සාවුල් උස්වූ මනුෂ්‍යයෙකු වූවද (2 පදය) 15 වැනි පරිච්ඡේදය පෙන්වන පරිදි දෙවියන්වහන්සේගේ රාජ්‍යය සඳහා ආත්මික විශාලත්වයෙන් මද විය.


**සිකුරාදා -1 සාමුවෙල් 10** - ප්‍රථමයෙන් දෙවියන්වහන්සේ සාවුල්ට උදව් කල ආකාරය බලන්න. (6, 9, 26 පද) තමන්වහන්සේ විශ්වාස කිරීමටත්, ඔහුගේ රාජභාවය තුළ සාර්ථකත්වය සහතිකවීමටත් දෙවියන්වහන්සේගේ අවශ්‍යතාවය විය.

**සෙනසුරාදා - 1 සාමුවෙල් 15** - ප්‍රථම ස්ථානය දෙවියන්වහන්සේට දීමට සාවුල් අසමත් වූ අතර උන්වහන්සේගේ උපදෙස් සම්පූර්ණයෙන් ඉටු කලේ නැත. යාගපූජාව ව්‍යවස්ථාගත කලද, එය අවසානයක් කරා - කිකරුකම - යා හැකි මාර්ගයක් පමණක් විය. කීකරුකම සියල්ලට ඉහලින් වැදගත් විය. (22-23 පද)

| | |
|---|---|
| ඉරිදා | ක්‍රියා 22 |
| සඳුදා | ක්‍රියා 23 |
| අඟහරුවාදා | ක්‍රියා 24 |
| බදාදා | ක්‍රියා 25 |
| බ්‍රහස්පතින්දා | ක්‍රියා 26 |
| සිකුරාදා | ක්‍රියා 27 |
| සෙනසුරාදා | ක්‍රියා 28 |

## ක්‍රිස්තුස්වහන්සේගේ මාර්ගය

- යෙරුසලමට යාම, සිදුවිය හැකිව තිබූ, මරණය සහ යුදෙව්වන් සහ රෝමානුවන් ඉදිරිපිට ඔහුගේ විවිධ නඩුවිභාග තුළ පාවුල්ගේ අත්දැකීම්, ඔහුගේ දයාබර ස්වාමියාවූ යේසුස් වහන්සේගේ වැනිය. (25 පිට බලන්න.)
- පසුව, කෙසේ වෙතත්, සිරකරුවෙකු ලෙස මුහුදින් රෝමයට යන්නටත්, එහිදී රෝමානු අධිරාජ්‍යයාවූ නිරෝ ඉදිරිපිට නඩු විභාගයට මුහුණ දීමටත්, ඔහුට නියම වී තිබුනි. ඔහුගේ ගමනේ ප්‍රතිඵලයක් ලෙස සුභාරංචිය තවත් පුළුල් ලෙස ව්‍යාප්ත විය. නව ගිවිසුමේ කොටසක් වන ලිපි කිහිපයක් ඔහු විසින් රෝමයේ සිට ලියන ලදී.




පාවුල්ගේ රෝම ගමන

## දිනපතා සටහන්

**ඉරිදා - ක්‍රියා 22 -** ක්‍රිස්තියානිය හඳුන්වනු ලැබුයේ මාර්ගය ලෙසිනි (4 පදය) ක්‍රියා 9:2, 19:9, 23, ආදිය බලන්න. දෙවියන්වහන්සේ සමීපයට මාර්ගය යේසුස්වහන්සේය. (යොහන් 14:6)

**සඳුදා - ක්‍රියා 23 -** සුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා උපකාරවීමට සහ පාවුල් ආරක්‍ෂා කිරීමට රෝම හමුදාව පවා දෙවියන්වහන්සේ යොදාගත් සේක. (23-24 පද)

**අඟහරුවාදා - ක්‍රියා 24 -** මාර්ගය හසුකර ගත්තේ පැරණි ගිවිසුමේ පොරොන්දු තුළ විශ්වාසය (14 පදය) සහ උත්ථානයත්ය. (15 පදය)

**බදාදා - ක්‍රියා 25 -** යෙරුසලමේදී යේසුස්වහන්සේ විසින් මුහුණ දුන් පරීක්‍ෂණ වලට පාවුල්ගේ අත් දැකීම් සමාන විය. (2, 6, පද)

**බ්‍රහස්පතින්දා - ක්‍රියා 26 -** 18 පදයේ සුභාරංචියේ සංක්‍ෂිප්තයක් අඩංගුය. පාවුල්ගේ බලවත් දේශනා කිරීම අග්‍රිපා රජු මත අනපේක්‍ෂිත ප්‍රතිඵලයක් පෑවේය. (28 පදය)

**සිකුරාදා - ක්‍රියා 27 -** "ධෛර්යවත්ව සිටින ලෙස" (22 පදය) "ධෛර්යය ගන්න" යන සර්වගුණවාදී ප්‍රකාශයට අමතරව දෙයකි. එය බලාපොරොත්තුවෙන් සහ නිර්භීතකමින් සපිරිව සිටිමට අපට හේතු ඇති බැව් සිහි කිරීමකි.

**සෙනසුරාදා - ක්‍රියා 28 -** යුද සෙබලෙකුට දම්වැලකින් හිරකර තිබීම, බොහෝ සංචාරය කල දේශනාකරුට දුශ්කරවන්නට ඇත. නමුත් එය දෙවියන් වහන්සේගේ ක්‍රමය විය. මෙහි සිට බොහෝ අලුත් ගිවිසුම් ලිපි ලියන ලදී.






| | |
|---|---|
| ඉරිදා | 1 සාමුවෙල් 16 |
| සඳුදා | 1 සාමුවෙල් 17 |
| අඟහරුවාදා | 2 සාමුවෙල් 1 |
| බදාදා | 2 සාමුවෙල් 2 |
| බ්‍රහස්පතින්දා | 2 සාමුවෙල් 5 |
| සිකුරාදා | 2 සාමුවෙල් 7 |
| සෙනසුරාදා | 2 සාමුවෙල් 24 |

## රජකෙනෙකු සඳහා දෙවියන්වහන්සේගේ තේරීම

- සාවුල් ප්‍රත්ක්ෂේප කල දෙවියන් වහන්සේ (1 සාමුවෙල් 15:23-23) රූත්ගෙන් පැවතෙන්නෙකු වූ, යෙසේගේ පුත්‍රයාවන <u>දාවිත්</u> , රජු ලෙස ආලේපිත කිරීමට සාමුවෙල් යැවුවේය. (1 සාමුවෙල් 16)
- දාවිත් නමෙහි අරුත "පෙම්බර" යනුයි. ඔහුගේ හදවත නිවැරදි නිසා දෙවියන්වහන්සේ ඔහුට ප්‍රේම කරන ලදී. (ක්‍රියා 13:22)
- රජවීම සඳහා දාවිත් හට බලා සිටීමට සිදුවිය. සාවුල් වසර 40ක් රාජ්‍ය කල අතර, දාවිත් කෙරෙහි කෙතරම් ඊර්ශ්‍යා සහගත වී දයත්, ඔහු මැරීමට පවා අවස්ථාව සෙව්වේය.

## දෙවියන්වහන්සේගේ පැමිණෙන රජ

- ඉශ්‍රායෙල් සතු වූ යහපත්ම රජු දාවිත් විය.
- "තමාගේ හදවත සඳහාම වූ මනුෂයෙකු" ලෙස දෙවියන්වහන්සේ ඔහුට ප්‍රේම කල සේක.
- දෙවියන්වහන්සේ ඔහුට මෙසායා ගැන පොරොන්දු දුන්හ.
- යේසුස්වහන්සේ දාවිත්ගේ පුත්‍රයාය. (2සාමුවෙල් 7:12-16 සහ මතෙව් 1:1)
- යේසුස්වහන්සේ යෙරුසලමේ දාවිත්ගේ සිංහාසනයෙහි හිඳගන්නවා ඇත.
- දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ රාජ්‍යය පාලන කිරීම සඳහා තෝරා ගන්නා යේසුස්වහන්සේ <u>සම්පූර්ණ රජුය.</u> 2 සාමුවෙල් බලන්න.




ක්‍රි.පූ. 1000දී ඉශ්‍රායෙල් සිතියම

## දිනපතා සටහන්

**ඉරිදා - 1 සාමුවෙල් 16 -** දෙවියන්වහන්සේගේ තෝරා ගැනීම සැලකිලිමත් වූයේහදවත කෙරෙහිය. අපගේ සියලු සිතුවිලි හා චේතනා උන්වහන්සේ දන්නා සේක. උන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස්වහන්සේටද එම බලයම තිබේ. යොහන් 2:24-25 බලන්න.

**සඳුදා - 1 සාමුවෙල් 17 -** දාවිත්ගේ ජයග්‍රහණය සමහර පැතිවලින් පාපයට එරෙහිව යේසුස්වහන්සේගේ ජයග්‍රහණය වැනිය. උත්. 3:15 සමඟ හෙබ්‍රෙව් 2:14-15 සසඳන්න.

**අඟහරුවාදා - 2 සාමුවෙල් 1 -** තම මිතුරාවූ යොනාතන් සහ තමාට වෛර කල සාවුල් සඳහා දාවිත්ගේ වැලපීම, බයිබලය තුළ සත්‍ය ප්‍රේමයේ උදාර ප්‍රකාශ අතර ඇත.

**බදාදා - 2 සාමුවෙල් 2 -** පළමුවෙන් දාවිත් තමාගේම ගෝත්‍රයවූ යුදා විසින් පිළිගෙන හෙබ්රොන්හි රජු කරවන ලදී.

**බ්‍රහස්පතින්දා - 2 සාමුවෙල් 5 -** පසුව සියලු ඉශ්‍රායෙල් විසින් දාවිත් පිළිගත් අතර ඔහු යෙරුසලමේ රාජ්‍ය කරන ලදී.

**සිකුරාදා - 2 සාමුවෙල් 7 -** ආබ්‍රහම්ටවූ පොරොන්දු සමඟ මෙය සෘජුවම සම්බන්ධ වේ. දාවිත්ගේ මුණුබුරු පුත්‍රයා, යේසුස්වහන්සේ, යෙරුසලෙමේ රාජ්‍ය කරන අතර දේව මාළිගය ගොඩනගනු ඇත. (12-16 පද)

**සෙනසුරාදා - 2 සාමුවෙල් 24 -** 16 පදය, යේසුස්වහන්සේ පුජා කිරීමට තිබූ සහ පසුව දේව මාළිගය තනවන ලද ස්ථානයවූ යෙරුසලමේ දේව දූතයා නතර විය. (2 ලේකම් 3:1)

| | | |
|---|---|---|
| ඉරිදා | රෝම | 5 |
| සඳුදා | රෝම | 6 |
| අඟහරුවාදා | රෝම | 8 |
| බදාදා | රෝම | 9 |
| බ්‍රහස්පතින්දා | රෝම | 10 |
| සිකුරාදා | රෝම | 12 |
| සෙනසුරාදා | රෝම | 13 |

## පාවුල්ගේ ලිපි

✦ නව ගිවිසුමේ බොහෝ පොත් අපොස්තුලු පාවුල් විසින් ලෝකයේ විවිධ කොටස් වල හුන් පුද්ගලයන්ට සහ ඇදහිලි කණ්ඩායම් වෙත ලියන ලද ලිපිය.

✦ ක්‍රියා පොතේ විස්තර කර ඇති පරිදි, සමහර ඒවා ලේඛන ගත කරන ලද්දේ පාවුල් සංචාර කරන අතරේය.

## රෝමවරුන්ට ලියන ලද ලිපිය

✦ මේ ලිපිය ලියන ලද්දේ පාවුල්ගේ තෙවැනි සංචාරයේදිය. ක්‍රියා 19:21 සහ රෝම 15:15-26 බලන්න.

✦ රෝමයේ "එක්ලේසියාවට" යුදෙව්සහ අන්‍යජාතික පරිවත්තකයන් අඩංගු විය. ලෝකයට පාපය සහ මරණය ගෙන ආ ආදම්ගේ දරුවන් ලෙස ඔවුන් සියල්ලන්ට ගැළවීම අවශ්‍ය බැව් පාවුල් ඔවුනට පවසයි. සියල්ලට ගැළවීම සපයා ඇති ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔහු දෙවියන් වහන්සේගේ දයාව සහ කරුණාව ප්‍රශංසා කරයි.

✦ අප සියල්ලෝ "ආදම් තුළ" උපත ලබා ඇති බැවින්, සියල්ලන් හට විශ්වාසය සහ ක්‍රිස්තුස්වහන්සේ තුළ බෞතිස්මය මගින් ගැළවීම අවශ්‍යය.

## දිනපතා සටහන්

**ඉරිදා - රෝම 5 -** ආදම්ගේ පැවතෙන්නන් ලෙස අපි, ස්වභාවයෙන්ම පවුකාරයෝ වෙමු. (12පදය) ධර්මිෂ්ඨකම සහ සදාකාල. ජිවිතය පිළිගන්-වන්නේ ක්‍රිස්තුස්වහන්සේ හරහා පමණි. (19, 21 පද)

**සඳුදා - රෝම 6 -** "පැරණි මිනිසා" (ආදම් සමඟ හවුල් වීමෙන්) මිහිදන් කලයුතු අතර "නව මිනිසා" (ක්‍රිස්තුස්වහන්සේ සමඟ හවුල් වීමෙන්) බෞතිස්මය තුළ පැළඳගත යුතුය. (4 පදය)

**අඟහරුවාදා - රෝම 8 -** 8 පදය, "මාංශය තුළ" (තවමත් ආදම් තුළ) සිටින අය හට දෙවියන්වහන්සේ ප්‍රසන්න කල නොහැක. නමුත් අප ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කරන්නේ නම්, උන්වහන්සේගේ පරිත්‍යාගයෙන් සහ ප්‍රේමයෙන් ගැළවීම ලබනවා ඇත. (28, 38-39 පද)

**බදාදා - රෝම 9 -** අපගේ "ක්‍රියා" තුළින් ධර්මිෂ්ඨභාවය මුදුන් පමුණුවා ගත නොහැකි නමුත් එය ලැබිය හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාසයෙන් පමණි (30-32 පද) එය දීමනාවක් මිස අයිතිවාසිකමක් නොවේ.

**බ්‍රහස්පතින්දා - රෝම 10 -** යේසුස්වහන්සේ තුළ විශ්වාසය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගේ වචනය ශ්‍රවණය කිරීමෙනි (13-17 පද) යේසුස්වහන්සේ මිය ගොස් නැවත නැගිටි බවත්, උන්වහන්සේ ස්වාමීන්වහන්සේ බවත් අපි පිළිගත යුතුවෙමු. (9 පදය)

**සිකුරාදා - රෝම 12 -** දෙවියන්වහන්සේ ඉල්ලන්නේ සජීවී සේවයයි. මළ පරිත්‍යාග නොවේ. (1 පදය)

**සෙනසුරාදා - රෝම 13 -** ලෝකයේ රාජ්‍යයන් පිහිටුවන්නේ දෙවියන් වහන්සේය. (1 පදය, දානියෙල් 4:17, 25, 32 සසඳන්න) කාලය මාහැඟිය (11 පදය) අපි ක්‍රිස්තුස්වහන්සේ "පැළඳගත යුතුවෙමු. (14 පදය)





## ඉශ්‍රායෙල් සහ යුදාහි රජවරු

| | | |
|---|---|---|
| ඉරිදා | 1 රාජාවලිය | 3 |
| සඳුදා | 1 රාජාවලිය | 5 |
| අඟහරුවාදා | 1 රාජාවලිය | 12 |
| බදාදා | 1 රාජාවලිය | 17 |
| බ්‍රහස්පතින්දා | 1 රාජාවලිය | 18 |
| සිකුරාදා | 2 රාජාවලිය | 5 |
| සෙනසුරාදා | 2 ලේකම් | 36 |


✦ දෙවියන්වහන්සේගේ රාජ්‍යය මත රජු ලෙස දාවිත්ට පසුව පිහිටු වීමට දෙවියන්වහන්සේ විසින් සලමොන් තෝරා ගන්නා ලදී. ඔහුගේ ඥානය යන වස්තුව ප්‍රකටය. යෙරුසලමේ ප්‍රථම දේව මාළිගය ඔහු ගොඩනැගීය.

✦ ඔහුගේ දවස් වලදී සාමයේ ප්‍රමාණයක් තිබුනද, ඔහු ජිවත්ව සිටි කාලයේදීම කරදර වල බීජ තිබුනු අතර ඔහුගේ මරණින් පසු රාජ්‍යය දෙකට බෙදුනි. (1 රාජාවලිය 12)

රාජ්‍යයන් දෙකක්

ඉශ්‍රායෙල්
(ගෝත්‍ර දසය)
දූෂිත රජවරු
යෙරෝබෝවම් 1 - ක්‍රි.පූ. 975
හොසෙයා දක්වා
ගෝත්‍ර දසය සිරකරුවන් ලෙස
ඇසිරියාවට ගෙන යන ලදී
(ක්‍රි.පූ. 721)

යුදා
(ගෝත්‍ර දෙක)
දුෂ්ඨ (සහ යහපත් ස්වල්පයක්)
රජවරු රෙහෝබෝවම්, ක්‍රි.පූ. 975
සෙදකියා, ක්‍රි.පූ. 599
දක්වා
ගෝත්‍ර දෙක සිරකරුවෝ ලෙස
බැබිලෝනියාවට
ගෙනයන ලදී. ක්‍රි. පූ. 588




රාජාවලිය යුගයේ ඉශ්‍රායෙල් සහ යුදයේ සිතියම

## දිනපතා සටහන්

**ඉරිදා - 1 රාජාවලිය 3 -** නිවැරදි දීමනාව සලමොන් ඉල්ලුවේය. (9 පදය) හිතෝපදේශ 4:7 ආදිය බලන්න.

**සඳුදා - 1 රාජාවලිය 5 -** අන්‍යජාතින් සහ යුදෙව්වෝ එකතුව දේවමාලිගය ගොඩනැගුවෝය. එසේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ යුදෙව් සහ අන්‍යජාතින් දෙකොටසම දෙවියන්වහන්සේ විසින් පිලිගන්නවා ඇත.

**අඟහරුවාදා - 1 රාජාවලිය 12 -** සලමොන්ගේ පාපය (1 රාජාවලිය 11:1-3) සහ රෙහෝබෝවම්ගේ අල්ප ඥානය (11 පදය) රාජ්‍යයේ දෙකඩවීම ඇති කලේය.

**බදාදා - 1 රාජාවලිය 17 -** ප්‍රයත්නයක් දරා ඉශ්‍රායෙල් තමන්වහන්සේ දෙසට නැවත හැරවීම උත්සහ කිරීමට දෙවියන්වහන්සේ විසින් එලිජා එවන ලදී. ඔහු දෙවියන්වහන්සේ වෙතින් යැයි පෙන්වීමට එලිජා විසින් ප්‍රාතිහාර්ය සිදු කරන ලදී. (24 පදය)

**බ්‍රහස්පතින්දා - 1රාජාවලිය 18 -** සලමොන් සහ ජෙරෝබෝවම් විසින් හඳුන්වා දෙන ලද පිළිම වන්දනාව (1 රාජාවලිය 12:28-30), එලිජාගේ යාච්ඤා (36 පදය) සහ ක්‍රියා (40 පදය) මගින් තාවකාලිකව නැවතුනි.

**සිකුරාදා - 2 රාජාවලිය 5 -** ඉශ්‍රායෙල් කැරළිකාරවූ නමුත්, සිරියානුවෙක්වූ නාමන් කිකරුවී පිරිසිදු කරනු ලැබිය. ලූක් 4:25-27 බලන්න.

**සෙනසුරාදා - 2 ලේකම් 36 -** තම ජනතාවට පණිවිඩකරුවන් සහ දිවැස්වරුන් දෙවියන්වහන්සේ එවන ලදී. (15 පදය) නමුත් ඔවුන් තවමත් කැරලිකාරී විය. දඬුවමක් ලෙස 70 වසරකට ඔවුන් සිරකරුවන් ලෙස බැබිලෝනියට ගෙනයන ලදී. (17-21 පද)

| | |
|---|---|
| ඉරිදා | 1 කොරින්ති 1 |
| සඳුදා | 1 කොරින්ති 2 |
| අඟහරුවාදා | 1 කොරින්ති 3 |
| බදාදා | 1 කොරින්ති 10 |
| බ්‍රහස්පතින්දා | 1 කොරින්ති 11 |
| සිකුරාදා | 1 කොරින්ති 13 |
| සෙනසුරාදා | 1 කොරින්ති 15 |

## කොරින්තිවරුන්ට ලියන ලද පළමුවැනි පත්‍රය

- ✦ අපෝස්තුලු පාවුල්ගේ දෙවැනි ධර්මදූත සංචාරයේදී ඔහු ග්‍රීසියේ කොරින්ති කරා ගියේය. (ක්‍රියා 18:1-11)
- ✦ පසුව, ඔහුගේ තෙවැනි ගමනේදී එපීසයේදී (ක්‍රියා 19) ඔහු කොරින්තියේ සිටි සහෝදර සහෝදරියන්ට ලිවේය. එහි අසමගිය සහ දබරය ඇති වී තිබුනු අතර සමහර චාර්ය සහ ඇදහිම් ප්‍රතිපත්ති බරපතල ලෙස පැහැර හැර තිබුනි.
- ✦ "යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේ කුරුසියෙහි ඇණ ගසනු ලැබූ බව" පාදකවූ සුභාරංචියේ ඒකත්වය පාවුල් අවධාරණය කරයි. (1 කොරින්ති 2:2) කුරුසිගත කරනු ලැබූ මෙසායා කෙනෙකු ගැන සුභාරංචිය යුදෙව්වනට බාධාවක් (සිතිමට පවා නොහැකි) විය. එය ග්‍රීකයන්ට (අන්‍යජාතීන්) මෝඩකමක් විය. එය ගැළවීම ගෙන ආ හැකි එකම මාර්ගය විය. (1 කොරින්ති 1:23)
- ✦ මෙම ආශ්වර්යමත් ලිපියේ තේමාව වූයේ, "ක්‍රිස්තුස්වහන්සේ තුළ" සිටිමත්, උන්වහන්සේ නොමැතිව අපට බලාපොරොත්තුවක් නොමැති, සභාවේ ශීර්ෂය ලෙස උන්වහන්සේ සිහි කිරීමයි. සැබවින්ම ක්‍රිස්තුස් වහන්සේ නැගී සිටින අතර, උන්වහන්සේ නිසා අපගේ විශ්වාසය සජීවිය.

### දිනපතා සටහන්

<u>ඉරිදා - 1 කොරින්ති 1 -</u> 26-31 පද සියලුම ලෞකික ප්‍රඥාවනට එරෙහිව ක්‍රිස්තුස්වහන්සේ තුළ නිහතමානි විශ්වාසය වඩා යහපත්ය. (යෙරමියා 9:23-24)

<u>සඳුදා - 1 කොරින්ති 2 -</u> තමන්ගේ ප්‍රඥාව බයිබලය පාදක කොට ගත්තවුන් හට දෙවියන්වහන්සේ බොහෝ දේ පොරොන්දු වී ඇත. (9-10 පද) මෙහි අදහස වනුයේ අපට ක්‍රිස්තුස්වහන්සේගේ මනස ඇති බවත්, උන්වහන්සේ සිතූ ලෙස සිතිමට පටන් ගන්නා බවත්ය. (16 පදය)

<u>අඟහරුවාදා - 1 කොරින්ති 3 -</u> 18-20 පද, දෙවියන්වහන්සේ තුළ විශ්වාසය ඇති තැනැත්තේ සියල්ල උරුමකර ගන්නවා ඇත. නමුත් අදේව වාදීන්ගේ ප්‍රඥාවෙනුත්, හැසිරීමෙනුත් ප්‍රවේසම් වෙන්න. (17 පදය)

<u>බදාදා - 1 කොරින්ති 10 -</u> 1-12 පද කාන්තාරයේදී ඉශ්‍රායෙල් අසාර්ථකවූ ලෙස අපටද එසේ විය හැකි බැව් හඳුනා ගැනීම නිහතමානිත්වය බලවත්ව ඉල්ලයි. පෙළඹ වීමේදී පවා දෙවියන්වහන්සේ දයාවන්තය (13 පදය) යාච්ඤාවෙන් උන්වහන්සේගේ උදව් පැවතුවහොත්, උන්වහන්සේ අපට සාර්ථක විමට උදව් කරනවා ඇත.

<u>බ්‍රහස්පතින්දා - 1 කොරින්ති 11 -</u> 23-26 පද "ස්වාමින්වහන්සේ එනතුරු" නිතිපතා ක්‍රිස්තුස්වහන්සේ සිහි කිරීම (පුප සහ මිදී යුෂ තුළ) උන්වහන්සේ නියම කරන ලදී. (26 පදය) උන්වහන්සේගේ පූජාවීම සහ තමන් පාපයෙන් මුදාගත් මාර්ගය සිහි කිරීම පිණිස මෙය උන්වහන්සේගේ ශ්‍රාවකයන් විසින් කල යුතුය.

<u>සිකුරාදා - 1 කොරින්ති 13 -</u> මෙය බයිබලයේ ඇති ආදරණීය පරිච්ඡේද වලින් එකකි. "ත්‍යාගශීලි" භාවය ලෙස සමහර පැරණි සංස්කරණ වල පරිවර්තනය කල වචනය, නව සංස්කරණ තුළ "ප්‍රේමය" ලෙස පරිවර්තනය කර ඇත. ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රදර්ශනය වූ දිව්‍යමය ප්‍රේමයේ පවත්නා ගුණය, අප තුළද දැකිය යුතුය.

<u>සෙනසුරාදා - 1 කොරින්ති 15 -</u> පැරණි ගිවිසුම තුළ ක්‍රිස්තුස්වහන්සේගේ මරණය සහ උත්තානය ගැන අනාවැකි පවසා තිබුනි. (3-4 පද සහ ලූක් 24:25-27,44) ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටිනා අප උන්වහන්සේගේ පැමිණිමේදී නැගිටවනු ඇත. 22-23 පද බලන්න.





## ගීතාවලිය

| | |
|---|---|
| ඉරිදා | ගීතාවලිය 1 |
| සඳුදා | ගීතාවලිය 2 |
| අඟහරුවාදා | ගීතාවලිය 6 |
| බදාදා | ගීතාවලිය 16 |
| බ්‍රහස්පතින්දා | ගීතාවලිය 19 |
| සිකුරාදා | ගීතාවලිය 22 |
| සෙනසුරාදා | ගීතාවලිය 23 |

- ✦ දෙවියන්වහන්සේගේ වචනය මධ්‍යයේ ගීතාවලිය හෝ ගිතිකා ඇත.
- ✦ ඒවා යාච්ඤා සහ වන්දනා ගැන සැලකිලිමත් වේ. (23 පිට බලන්න) පසුගිය යුගයන්හි පුද්ගලයන්ගේ අත්දැකිම් ඒවා ප්‍රකාශ කලද, එහි පණිවිඩය බොහෝ විට සදාකාලිකය.
- ✦ නිහතමානිත්වය, ප්‍රශංසා, පාපොච්චාරණ, හදවතෙහි ප්‍රකාශ වැගිරවිම්, ඉශ්‍රායෙලයේ බලාපොරොත්තුව ගැන නැවත ප්‍රකාශන සහ දෙවියන් වහන්සේගේ පොරොන්දු ගැන සටහන් මෙහි ඔබට සොයාගත හැක.
- ✦ සියලුම ශුද්ධ ලියවිලි මගින් මෙන්ම, මේවා මගින්ද ස්වාමිවූ යේසුස් වහන්සේ සැනසුම සහ ශක්තිය ලබා ගත් සේක. සමහර ගිතිකා මෝසෙස්, සලමොන්, හෙසකියා හෝ අනෙකුත් අය විසින් ලියා ඇති නමුත්, බොහෝ ඒවා දාවිත්ගේ ගිතිකාය. ඒවායේ අඩංගු දෑ සාධනය කරන පරිදි මේ සියල්ලට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ලැබී තිබේ.
- ✦ බොහෝ ගිතිකා "ගැළවුම්කරු අපේක්ෂිතය", එනම් ඒවා ගැළවුම්කරු, උන්වහන්සේගේ විඳවිම සහ මරණය, උත්ථානය, උන්වහන්සේගේ දිව්‍යමය පුත්‍රභාවය සහ උන්වහන්සේගේ පැමිණෙන රාජ්‍යයේ මහිමය දෙස ඉදිරියට යොමුවෙයි.
- ✦ නව ගිවිසුම තුළ ගිතාවලියේ උද්දෘත රාශියක් ඇත.
- ✦ ඔබ ශෝකයෙන් හෝ ප්‍රීතිමත්ව, බියෙන් හෝ ප්‍රමෝදයෙන් සිටියත්, සියලු කන්නයටම සහ අවස්ථාවකටම ගිතිකා ඇත.

### දිනපතා සටහන්

<u>ඉරිදා - ගීතාවලිය 1 -</u> දේව වචනය කෙරේ අතිශය සතුටක් ක්‍රිස්තුස් වහන්සේටද තිබුනි. දිවා රෑ දෙකෙහි උන්වහන්සේ එය භාවනා කළ සේක. (2 පදය)

<u>සඳුදා - ගීතාවලිය 2 -</u> ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. (7 පදය) සියොන්හි රාජ්‍ය කරන නම්කල රජු (6 පදය) මුලු පෘතුවියම පාලනය කරනවා ඇත. (8 පදය) (ක්‍රියා 4:25,13:33 සහ හෙබ්‍රෙව් 1:5,5:5 උපුටා දැක්විම්).

<u>අඟහරුවාදා - ගීතාවලිය 6 -</u> මරණය සතුරෙක්ය. (5 පදය) මුදා ගැනීම ක්‍රිස්තුස්වහන්සේ තුළ අදහන අයට පමණි. (යොහන් 3:16)

<u>බදාදා - ගීතාවලිය 16 -</u> ක්‍රිස්තුස්වහන්සේ උදෙසාද මරණින් මුදා ගැනීම පොරොන්දු විය. (8-11 පද) (ක්‍රියා 2:30-32, 13:35 උපුටා දක්වා ඇත.)

<u>බ්‍රහස්පතින්දා - ගීතාවලිය 19 -</u> දෙවියන්වහන්සේගේ වචනයට පමණක් (7-11) අප සැබවින්ම කවුරුන්දැයිද (12 පදය) අප සැබවින්ම කවුරුන් විය යුතුදැයිද (7-9 පද) පෙන්විය හැක.

<u>සිකුරාදා - ගීතාවලිය 22 -</u> යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ පවුකාරයන් බේරි ගැනීම සඳහාය. (5 පදය) මෙම පරිච්ඡේදයේ උන්වහන්සේගේ විඳවිම් කලින් ප්‍රකාශ කොට ඇත. (උදාහරණ ලෙස 16, 18 පද)

<u>සෙනසුරාදා - ගීතාවලිය 23 -</u> මරණින් අප බේරා ගැනීම සඳහා දෙවියන් වහන්සේ මෙන්ම, ක්‍රිස්තුස්වහන්සේටද අපගේ එඬේරා විය හැකි (4 පදය) අතර සදාකාල ජිවිතය දෙසට අප යොමු කල හැක. (6 පදය)

| | | |
|---|---|---|
| ඉරිදා | 2 කොරින්ති | 11 |
| සඳුදා | ගලාති | 1 |
| අඟහරුවාදා | ගලාති | 2 |
| බදාදා | ගලාති | 3 |
| බ්‍රහස්පතින්දා | ගලාති | 4 |
| සිකුරාදා | ගලාති | 5 |
| සෙනසුරාදා | ගලාති | 6 |

## සුභාරංචිය

✦ සුභාරංචියේ අරුත "සුභ ආරංචිය" හෝ "යහපත් පුවත්" වේ.

✦ එය දෙවියන්වහන්සේගේ රාජ්‍යය සහ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැනත්, මිනිසා ගැළවීම ලද හැක්කේ කෙසේද කියාත් ගැනය.


✦ ඇත්තේ එක සුභාරංචියකි. එය වෙනස් කල නොහැක. (යුද්. 1:3)

## ගලාතිවරුන්ට ලියන ලද පත්‍රය

✦ පැරණි ව්‍යවස්ථාවේ වතාවත් පිළිපැදින්නැයි පවසමින් එක සුභාරංචිය කෙරෙන් ගලාති අදහන්නන් ඉවතට ගෙනයන්නට සමහර යුදෙව්වන් යත්න දරා තිබුනි. එම නිසා ඔවුන් හට ලිව්ය.

✦ සුභාරංචිය යනු, යේසුස්වහන්සේ ස්ත්‍රිය තුළින් (උත්පත්ති 3:15, ගලාති 4:4) සහ ආබ්‍රහම් තුළින් (උත්පත්ති 12:3, ගලාති 3:13) පොරොන්දු වූ බීජය (පැවතෙන්නා) බව සහ ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ තුළ පමණක් නම් (3:27) යුදෙව්වනට සහ අන්‍ය ජාතිකයන්ට පොරොන්දු කෙරෙහි කොටස් කරුවන් ලෙස විශ්වාසය මගින් උරුමයක් ලබාගත හැකි බවත්ය.

ගලාතියේ "සභා"
(ක්‍රියා 13-18 බලන්න.)




### දිනපතා සටහන්

**ඉරිදා - 2 කොරින්ති 11 -** ඇත්තේ එකම සුභාරංචියකි (3, 4 පද) එය වෙනස් නොකල යුතුය. සුභාරංචියේ ආරක්ෂාව සඳහා පාවුල් වේදනා වින්ද ආකාරය නිරීක්ෂණය කරන්න.

**සඳුදා - ගලාති 1 -** ඇත්තේ අකම සුභාරංචියකි. (6-9 පද) එය වෙනස් නොකල යුතුය ! අපද ඇදහිය යුතු සුභාරංචිය එයයි.

**අඟහරුවාදා - ගලාති 2 -** පැරණි ව්‍යවස්ථාව ක්‍රිස්තුස්වහන්සේගේ දයාව විසින් අදේශ කොට ඇත. (20-21 පද)

**බදාදා - ගලාති 3 -** ආබ්‍රහම් හට සුභාරංචිය දේශනා කල බැව් නිරීක්ෂණය කරන්න. (8 පදය) ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාසය සහ උන්වහන්සේ තුළ බෞතිස්මය, අපත් පොරොන්දුවේ උරුමක්කාරයන් කරයි. (29 පදය)

**බ්‍රහස්පතින්දා - ගලාති 4 -** පෘථිවිය උරුමකර ගන්නට නම් අප දෙවියන් වහන්සේගේ දරුවන් (6 පදය) සහ පොරොන්දුවේ දරුවන් (28 පදය) වීම අවශ්‍යය.

**සිකුරාදා - ගලාති 5 -** ක්‍රිස්තුස්වහන්සේට අයත් අය වැරදි ආශාවල් නැසිය යුතුය. (24 පදය)

**සෙනසුරාදා - ගලාති 6 -** යේසුස්වහන්සේ නැවත පැමිණීමේදී විනිශ්චයක් තිබෙනු ඇත. (7-8 පද)





| | |
|---|---|
| ඉරිදා | ගීතාවලිය 32 |
| සඳුදා | ගීතාවලිය 37 |
| අඟහරුවාදා | ගීතාවලිය 45 |
| බදාදා | ගීතාවලිය 46 |
| බ්‍රහස්පතින්දා | ගීතාවලිය 48 |
| සිකුරාදා | ගීතාවලිය 49 |
| සෙනසුරාදා | ගීතාවලිය 51 |

## ගීතාවලියෙහි ආත්මික තේමා

✦ බයිබලයේ සෑම පෙතක් සේම, ගීතාවලිය තුළ, එය දෙවියන් වහන්සේගෙන් පැමිණෙන බැවින්, ඉගැන්වීමේ එම ඒකත්වයම සහ පණිවිඩය අඩංගුය.

✦ හමුවිය හැකි සමහර සුභාරංචි තේමා:

**ක්‍රිස්තුස්වහන්සේ -**

වේදනා විඳින මෙසායා

දෙවියන්වහන්සේගේ පුත්‍රයා

අනාගත රජු

**දෙවියන්වහන්සේගේ රාජ්‍යය -**

ඉශ්‍රායෙලය කේන්ද්‍ර කොට සහ යෙරුසලෙම මුලස්ථානය කොට ගෙන පෘථිවිය මත සැබැවින්ම ස්ථාපිත කරනු ඇත.

**මරණයද ජීවිතයද -**

පාපය, වේදනාව සහ මරණය යන කරුණු අවධාරණය කොට ඇත. දෙවියන්වහන්සේගේ කරුණාව තුළින් ජීවනයේ බලාපොරොත්තුව, සමාව සොයන සහ උන්වහන්සේ තුළ විශ්වාස කරන අයට සහතිකය.

### දිනපතා සටහන්

**ඉරිදා - ගීතාවලිය 32 -** අවස්ථාවේදී අප උන්වහන්සේ සොයන්නේ නම් (6 පදය) දෙවියන්වහන්සේ අපගේ පාපයන්ට ආවරණයක් සපයන සේක. (1-2 පද) උත්පත්ති 3:21, ගලාති 3:27, මතෙව් 22:11 බලන්න.

**සඳුදා - ගීතාවලිය 37 -** යටහත් (නිහතමානී) අය දෙවියන්වහන්සේ අදහන අතර, ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ සමඟ සදාකාලයටම පෘථිවිය උරුමකර ගන්නවා ඇත. (11, 18, 22,29, 34, 37 පද)

**අඟහරුවාදා - ගීතාවලිය 45 -** මෙම ගිතිකාව රජු සහ උන්වහන්සේගේ මනාලිය ප්‍රකාශයට පත්කරයි. යේසුස්වහන්සේ රජුවන අතර රාජ්‍යයේ ජනතාව මනාලිය නියෝජනය කරයි.

**බදාදා - ගීතාවලිය 46 -** උන්වහන්සේ තම රාජ්‍යය පිහිටවූ පසු, සියලු තැන්හි යුද්ධ දෙවියන්වහන්සේ නවතනවා ඇත. (9 පදය) සියල්ලෝ උන්වහන්සේට ගෞරව කරනු ඇත. (10 පදය)

**බ්‍රහස්පතින්දා - ගීතාවලිය 48 -** ලෝක අර්බුද කාලයකට පසුව (6,8,-9 පද) සියොන් (යෙරුසලෙම) අනාගත රාජ්‍යයේ අගනුවර වනු ඇත. (2 පදය) (මතෙව් 5:35)

**සිකුරාදා - ගීතාවලිය 49 -** සුභාරංචිය නොමැතිව, මිනිසාට බලාපොරොත්තුවක් නැත. ජීවිතයේ අවසානය මරණයයි. සැබෑ ඇදහිලිවන්තයා මරණින් නැගිටුවනු ඇත.

**සෙනසුරාදා - ගීතාවලිය 51 -** මෙම ගීතාකාවේ පසුතැවෙන පවුකාරයා දාවිත් වුවත්, එය අපටද බලාපොරොත්තු දිය හැක. (8-19 පද) පසුතැවීම සිදුවන්නේ හදවත තුළය. (6, 10 පද)

| | |
|---|---|
| ඉරිදා | එපීස 4 |
| සඳුදා | එපීස 5 |
| අඟහරුවාදා | එපීස 6 |
| බදාදා | පිලිප්පි 1 |
| බ්‍රහස්පතින්දා | පිලිප්පි 2 |
| සිකුරාදා | පිලිප්පි 3 |
| සෙනසුරාදා | පිලිප්පි 4 |

## රෝමයේ සිට පාවුල් ලියන ලද ලිපි

- ✦ ක්‍රියා 27-28 විස්තර කල රෝම ගමනින් පසු, පළමු සංචාර වලදී තමා මුණගැසුණු සමහර සහෝදර සහෝදරියන් වෙත තවත් ලිපි (සන්දේශ) අපෝස්තුලු පාවුල් ලිවේය. (33 පිටේ සිතියම බලන්න.)

## එපීසවරුනට ලියන ලද පත්‍රය

- ✦ සභාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ලෙස ඇති ආශ්චර්යමත් තේමාව මෙහි අඩංගුය.
- ✦ උන්වහන්සේ තුළ ඒකාබද්ධ සහ පූජනීය ජීවිතයකට එය ඇදහිලිවන්තයන් කැඳවයි.

## පිලිප්පිවරුනට ලියන ලද පත්‍රය

- ✦ අපගේ ආත්මික සටනේදී ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකත්වයේ අවශ්‍යතාවය මෙයද ප්‍රකාශ කරයි. මේ ලිපිය ප්‍රමෝදයෙන් පිරී ඇත.
- ✦ පිලිප්පිය රෝමානු මුරපොලක් හෝ විජිතයක් වූ නිසා, සෙබළු, ආයුධ වැන්නෙහි සඳහන සිත් ගන්නා සුළුය. සැබෑ සභාව ස්වර්ගීය වටිනාකම් පෘථිවිය මත පෙන්විය යුතුවාසේය. (පිලිප්පි 3:20)

### දිනපතා සටහන්

<u>ඉරිදා - එපීස 4 -</u> එක විශ්වාසය (4-6 පද) සහ අලුත් ආකල්ප (22-24 පද) සතු වූ අය එකතුව "ක්‍රිස්තුස්වහන්සේ ශරීරය" වෙයි. (13-16 පද)

<u>සඳුදා - එපීස 5 -</u> ශරීරයේ සිරස ක්‍රිස්තුස්වහන්සේය. (සැබෑ සභාව) (23 පදය), උන්වහන්සේ ස්වර්ගීය මනාළයාය. (25-27 පද) යහපත් විවාහයක මූලධර්ම නිරීක්ෂණය කරන්න. (22-29 පද)

<u>අඟහරුවාදා - එපීස 6 -</u> සෑම විධියේ අයෙකුටම ගෝලයෙකු වීමට හැකිය. (1, 4, 5, 9 පද) සත්‍යය වෙනුවෙන් අභීත වීම සඳහා පාවිච්චි කිරීමට ආත්මික අසිපත දෙවියන්වහන්සේගේ වචනයයි. (17 පදය)

<u>බදාදා - පිලිප්පි 1 -</u> යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ යහපත් සොල්දාදුවෙකු මෙන්, සත්‍යවූ දේ සඳහා අභීත වන්න. (27-28 පද)

<u>බ්‍රහස්පතින්දා - පිලිප්පි 2 -</u> ක්‍රිස්තුස්වහන්සේ සියල්ල අත්හලහ. (7-8 පද) එම නිසා පසුව දෙවියන්වහන්සේ, උන්වහන්සේ සියල්ලේ ස්වාමියා ලෙස උසස් කළ සේක. (9-11 පද)

<u>සිකුරාදා - පිලිප්පි 3 -</u> ක්‍රිස්තුස්වහන්සේ සමඟ සමාගමය සඳහා සියල්ල අත්හැරීම අපට වටනේය. (7-14 පද) උන්වහන්සේ නැවත පෘථිවියට පැමිණෙන අතර (20-21 පද) උන්වහන්සේගේ පාලනයේ පංගුකාරයෙකු වීම සඳහා අප උසස් කරනු ඇත.

<u>සෙනසුරාදා - පිලිප්පි 4 -</u> යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් ජයග්‍රහණය සහ සාමය අප සඳහා දෙවියන්වහන්සේට දිය හැක. (7 පදය) පවිත්‍ර සිතුවිල මිනිසුන් පවිත්‍ර කරයි. (8-9 පද)





## මරණයද ජීවිතයද ?

| | |
|---|---|
| ඉරිදා | ගීතාවලිය 67 |
| සඳුදා | ගීතාවලිය 72 |
| අඟහරුවාදා | ගීතාවලිය 88 |
| බදාදා | ගීතාවලිය 90 |
| බ්‍රහස්පතින්දා | ගීතාවලිය 91 |
| සිකුරාදා | ගීතාවලිය 95 |
| සෙනසුරාදා | ගීතාවලිය 96 |

- ✦ මරණය නිත්‍යය (ගීතාවලිය 88, 90) පාපය නිසා එය ලොවට පැමිණුනි.
- ✦ දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සදාකාලික ජීවිතය බයිබල බලාපොරොත්තුවෙයි. එම නිසා රාජ්‍යය උරුමවූවනට මරණින් නැගිටීමක් තිබිය යුතුය.
- ✦ දෙවියන්වහන්සේ තුළ විශ්වාසය තබන්නන්, සදාකාල ප්‍රීතිය සහ සාමයෙන් මහත්සේ ආශිර්වාද ලබනු ඇත.
- ✦ මෙම තේමාව ගීතාවලිය ඉදිරියට ගෙනයන අතර, මරණය සහ ජීවිතය අතර තෝරා ගැනීමේ අවස්ථාව <u>දැන්</u> බැව්ද පෙන්වයි.

### දිනපතා සටහන්

<u>ඉරිදා - ගීතාවලිය 67 -</u> මෙම ගීතිකාව දෙවියන්වහන්සේගේ අනාගත රාජ්‍යය විස්තර කරයි. <u>සාමයෙන්</u> ආශිර්වාද කල හැක්කේ දෙවියන්වහන්සේට පමණි. ගණන් කථාව 6:24-26 බලන්න.

<u>සඳුදා - ගීතාවලිය 72 -</u> නැවත අනාගත රාජ්‍යය විස්තර කර ඇත. මෙසායා වන ක්‍රිස්තුස්වහන්සේ රජුවෙනු ඇත. ඇතිවන අති ප්‍රබල සදාචාර, සමාජීය සහ දේශපාලනික වෙනස්කම් නිරීක්ෂණය කරන්න. 19 පදය ගණන් කථාව 14:21 සමඟ සසඳන්න.

<u>අඟහරුවාදා - ගීතාවලිය 88 -</u> 10-12 පද මරණයේදී සිහිකල්පනාවක් නොමැති. දැනට ජීවත් වන තුරා යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම සඳහා සූදානම් වීමට අවස්ථාව අපට ඇත.

<u>බදාදා - ගීතාවලිය 90 -</u> මෙම ගීතිකාව මෝසෙස් විසින් ලියන ලදී, දෙවියන් වහන්සේගේ සදාකාලිකත්වය සමඟ මිනිස් ජීවිතයේ කෙටි බව එහි ප්‍රභේදනය කරයි. එමනිසා අපි අපගේ කාලය ඥාණන්විතව පාවිච්චි කල යුතු වෙමු. (12 පදය)

<u>බ්‍රහස්පතින්දා - ගීතාවලිය 91 -</u> උන්වහන්සේ තුළ විශ්වාසය තබන්නන්ගේ සරණය සහ ආරක්ෂාව දෙවියන්වහන්සේය. විශ්වාසය ඇති අය ගළවාගනු ලබන්නෝය. මෙම ගීතිකාව යේසුස්වහන්සේ තමන් සඳහාම ව්‍යවහාර කරන ලදී. (11-12 පද මතෙව් 4:6)

<u>සිකුරාදා - ගීතාවලිය 95 -</u> අප ජීවත්ව සිටිනා තුරු අවශ්‍ය විශ්වාසය සහ ක්‍රියාවේ අවශ්‍යතාවය ගැන තවත් සඳහන් මෙන්න. විශ්වාස වන්තයාට අවසන් විවේකී දවසක් ඇත. (11 පදය)

<u>සෙනසුරාදා - ගීතාවලිය 96 -</u> යේසුස්වහන්සේ පැමිණි විට දෙවියන්වහන්සේ ලෝකය ධර්මිෂ්ඨව විනිශ්චය කරනවා ඇත. (13 පදය සහ ගීතාවයලිය 98:9) මෙම ගීතිකාව ප්‍රතිරාවය කරන ක්‍රියා 17:31 බලන්න.

| | |
|---|---|
| ඉරිදා | 1 තෙසලෝනික 1 |
| සඳුදා | 1 තෙසලෝනික 2 |
| අඟහරුවාදා | 1 තෙසලෝනික 3 |
| බදාදා | 1 තෙසලෝනික 4 |
| බ්‍රහස්පතින්දා | 1 තෙසලෝනික 5 |
| සිකුරාදා | 2 තෙසලෝනික 1 |
| සෙනසුරාදා | 2 තෙසලෝනික 2 |

## යේසුස්වහන්සේගේ නැවත පැමිණීම

✦ දෙවියන්වහන්සේගේ සැලැස්ම විශ්මය දනවන ලෙස පරිසමාප්ත වන මාර්ගය නම්, බලයෙන් සහ මහිමයෙන් යුතුව පෘථිවිය මතට යේසුස්වහන්සේගේ පෞද්ගලික නැවත පැමිණීමයි.

✦ උන්වහන්සේ නැවත නොපැමිණිය හොත් :
සියල්ලෙහි අවසානය මරණයයි.
උත්ථානයක් හෝ අනාගත ජීවිතයක් නොමැතිවනු ඇත.
ධර්මිෂ්ඨයන් සඳහා ගැළවීමක් නැතිවනු ඇත.
පාපයෙන් සහ ආත්මාර්ථත්වයෙන් මිනිසා තමන් සහ පෘථිවිය විනාශ කරනු ඇත.
දෙවියන්වහන්සේගේ ජනතාව ආශිර්වාද නොලබනු ඇත.
උන්වහන්සේගේ පොරොන්දු ඉටු නොවී තිබෙනු ඇත.
උන්වහන්සේගේ මහිමය පෘථිවිය නොපුරවනු ඇත.
උන්වහන්සේගේ සැලැස්ම අසාර්ථක වී යනු ඇත.

## තෙසලෝනිකවරුන්ට ලියන ලද පත්‍රය

✦ තෙසලෝනිකයේ අදහන්නෝ ප්‍රථමයෙන් පිළිම වන්දනා කල අය වූහ. නව ජීවිතය තුළ ඔවුනට දැනමුතුකම් සහ ධෛර්ය දීම සඳහා දෙවියන් වහන්සේගේ ආනුභාවය යටතේ අපෝස්තුළු පාවුල් ඔවුනට ලිපි දෙකක් ලිව්ය. (33 පිටුවේ සිතියම බලන්න.)

✦ විශ්වාසිවන්තයන්ගේ මහත් සැනසීම ලෙස, යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන තව තවත් සඳහන් මෙහි ඇත.

## දිනපතා සටහන්

**ඉරිදා - 1 තෙසලෝනික 1 -** ස්වර්ගයෙන් යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන සඳහන් සඳහා 10 පදය බලන්න.

**සඳුදා - 1 තෙසලෝනික 2 -** තම අනුගාමිකයන් වෙතට යේසුස්වහන්සේගේ නැවත පැමිණීම 19 පදය සඳහන් කරයි. අදහන්නන් තම තමන් සැලකූ ලෙස "සහෝදරයන්" ගැන නිතර සඳහන් ඇත.

**අඟහරුවාදා - 1 තෙසලෝනික 3 -** තම අනුගාමිකයන් විනිශ්වය කිරීම සඳහා යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන විස්තර සඳහා 13 පදය බලන්න.

**බදාදා - 1 තෙසලෝනික 4 -** ජීවනය දෙන්නටත්, තම ජනතාව සමඟ ජීවත් වන්නටත් යේසුස්වහන්සේගේනැවත පැමිණීම ගැන විස්තර සඳහා 13-17 පද බලන්න.

**බ්‍රහස්පතින්දා - 1 තෙසලෝනික 5 -** තම ජනතාවට ගැළවීම ගෙන ඒම සඳහා යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන විස්තර සඳහා 23 පදය බලන්න. උන්වහන්සේගේ නැවත පැමිණීම ක්ෂණික වන අතර අප දැන්ම ඒ සඳහා සූදානම් විය යුතුය.

**සිකුරාදා - 2 තෙසලෝනික 1 -** දුෂ්ඨයන්ට දඬුවම් කිරීමට පැමිණෙන යේසුස් වහන්සේ ගැන සඳහන් සඳහා 7-10 පද බලන්න.

**සෙනසුරාදා - 2 තෙසලෝනික 2 -** තම ජනතාව වෙතට යේසුස්වහන්සේගේ පැමිණීම සඳහා 1 පදයත්, දුෂ්ටයන් විනාශ කිරීම සඳහා 6 පදයත් බලන්න.






## යෙරුසලෙම, ශුද්ධ නගරය

| | |
|---|---|
| ඉරිදා | ගීතාවලිය 103 |
| සඳුදා | ගීතාවලිය 104 |
| අඟහරුවාදා | ගීතාවලිය 110 |
| බදාදා | ගීතාවලිය 122 |
| බ්‍රහස්පතින්දා | ගීතාවලිය 146 |
| සිකුරාදා | ගීතාවලිය 149 |
| සෙනසුරාදා | ගීතාවලිය 150 |

✦ "තමන් නාමය තබන පිණිස" යෙරුසලෙම දෙවියන්වහන්සේ විසින් තෝරාගන්නා ලදී. (ද්විතිය කථාව 12:5, 1 රාජාවලිය 8:29, ගීතාවලිය 87)

✦ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අධිකාරිය සහ බලය තුළින්, යෙරුසලෙම, දෙවියන්වහන්සේගේ ලෝක ව්‍යාප්ත රාජ්‍යයේ ආගමික සහ සිවිල් ව්‍යවස්ථාවේ කේන්ද්‍රස්ථානය වෙනු ඇත. (යෙසායා 2:3-4)

✦ යේසුස්වහන්සේ කී පරිදි (මතෙව් 5:35) මහාද්වීප මධ්‍යයේ එය මහ රජුගේ අගනුවර වෙනු ඇත. (ගීතාවලිය 2, 122, 149)




යෙරසලෙම මහාද්වීප වල කේන්ද්‍රය කරගනිමින් ලෝක සිතියම

## දිනපතා සටහන්

**ඉරිදා - ගීතාවලිය 103 -** දෙවියන්වහන්සේ නොගිණිය හැකි ආධාර මිනිසා මත ප්‍රදානය කරන නමුත්, අවසානයේදී මිනිසා මිය යයි. (14-16 පද) දෙවියන් වහන්සේ තමන්ගේ දරුවන්වෙන අය බේරා ගනු ඇත. (3-4, 11-13 පද)

**සඳුදා - ගීතාවලිය 104 -** මනුෂ්‍ය වර්ගයා සඳහා කරුණාවන්ත දීමනාවෙන් දෙවියන්වහන්සේ තමන්වහන්සේ හඳුන්වා දෙනසේක. ප්‍රමාදවීමට පෙර (29 පදය) මිනිසා දෙවියන්වහන්සේගේ ගුණවත්භාවය ස්තුති පූර්වකව පිළිගත යුතුය. (33 පදය)

**අඟහරුවාදා - ගීතාවලිය 110 -** තම දිව්‍යමය සම්භවය ඔප්පු කිරීම සඳහා යේසුස්වහන්සේ උපුටා දැක්වූයේ මෙම ගීතිකාවයි (මතෙව් 22:44) එය පෘථිවිය මතට පැමිණෙන උන්වහන්සේගේ රාජ්‍යය ගැන ප්‍රකාශ කරයි.

**බදාදා - ගීතාවලිය 122 -** යෙරුසලෙමේ සාමය (6 පදය) අදහස් කරනුයේ තම සහායකයන් සමඟ යේසුස්වහන්සේ රාජ්‍ය කරන කල්හි මුළු ලෝකය සඳහාම සමයයි. (5 පදය)

**බ්‍රහස්පතින්දා - ගීතාවලිය 146 -** අසරණ අය හට දෙවියන්වහන්සේ යහපත්ය. (7-9 පද) කෙසේ වෙතත් මිය යන, පෘථිවියේ මහා මිනිසුන් නොව ජනතාව උන්වහන්සේ විශ්වාස කල යුතුය. (3-4 පද)

**සිකුරාදා - ගීතාවලිය 149 -** යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ අනුගාමිකයෝ සියොන් සිට රාජ්‍ය කරන කල්හි (1-2 පද) ඔවුන් වැළැක්විය නොහැකි අධිකාරියකින් ආණ්ඩු කරනු ඇත. (6-9 පද)

**සෙනසුරාදා - ගීතාවලිය 150 -** ඔබ දැනටමත් ජීවත්ව සිටිනා වේලේ, දෙවියන්වහන්සේගේ යහපත් භාවයට සහ ගැළවීමේ මාර්ගය සඳහා ස්තුති පුද කරන්න. (6 පදය)

| | |
|---|---|
| ඉරිදා | 1 තිමෝති 1 |
| සඳුදා | 1 තිමෝති 2 |
| අඟහරුවාදා | 1 තිමෝති 6 |
| බදාදා | 2 තිමෝති 1 |
| බ්‍රහස්පතින්දා | 2 තිමෝති 2 |
| සිකුරාදා | 2 තිමෝති 3 |
| සෙනසුරාදා | 2 තිමෝති 4 |

## තිමෝතිට යවන ලද පත්‍රවල පළමුවැනි මූලධර්ම

✦ තිමෝති, අපෝස්තුලු පාවුල් විසින් පරිවර්තනය කරන ලද තරුණයෙකු විය. ශුද්ධ ලියවිලි පිළිබඳ දැනීමේ යහපත් පදනමක් මත ඔහු ලිස්ත්‍රාවේ හැදී වැඩී තිබුනි. (2 තිමෝති 3:15)

✦ ඔහු එපිසයේ ඇදහිලිවන්තයන් හට "රදගුරු" හෝ මඟපෙන්වන්නා වූ විට, නිවැරදි අවවාදාත්මකව පාවුල් ඔහුට ලිවීය.

✦ එක සත්‍ය සුභාරංචියෙන් වෙන් වීමේ අනතුර ගැන පාවුල් අවවාද කර තිබුනේ එපීසියේදීය (ක්‍රියා 20:28-32)

✦ රෝමයේදී තම දිවි පිදීම ලබාවීමට පෙර ලියන ලද මෙම ලිපි වල, වෙනස් නොකල හැකි, විශ්වාසයේ උගැන්වීම් පදනමේ අත්‍යාවශ්‍ය දේ පාවුල් නැවතත් සංක්ෂේප කරයි. (බයිබල් ඉගැන්වී වල සාරාංශය 60-63 පිටුවල බලන්න.)

## දිනපතා සටහන්

**ඉරිදා - 1 තිමෝති 1 -** පළමුවැනි මූලධර්ම: "පව්කාරයන් ගළවන්නට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආසේක." (15 පදය) සියල්ලට ඉහලින් රජු දෙවියන්වහන්සේ පමණි: සියලුම ගෞරවය සහ මහිමය උන්වහන්සේට වේවා. (17 පදය)

**සඳුදා - 1 තිමෝති 2 -** පළමුවැනි මූලධර්මයක්: ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක් මැදිහත්කාර කෙනෙක්වූ ක්‍රිස්තුස් යේසුස් නම් මනුෂ්‍යයායා. (5 පදය)

**අඟහරුවාදා - 1 තිමෝති 6 -** පළමුවැනි මූලධර්මයක්: දෙවියන්වහන්සේට පමණක් අමරණීයත්වය ඇති අතර කිසිම මනුෂ්‍යයෙකු විසින් දර්ශණය කර නොමැත. (16 පදය)

**බදාදා - 2 තිමෝති 1 -** පළමුවැනි මූලධර්මයක්: අමරණීයත්වය පොරොන්දු වුවද එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් පමණි. (10 පදය)

**බ්‍රහස්පතින්දා - 2 තිමෝති 2 -** පළමුවැනි මූලධර්මයක්: යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දාවිත්ගේ බීජයෙන්ය, උන්වහන්සේ මරණින් නැගිටුවන ලදී. (8 පදය)

**සිකුරාදා - 2 තිමෝති 3 -** පළමුවැනි මූලධර්මයක්: සියලුම ශුද්ධ ලියවිලි දෙවියන්වහන්සේගේ ආනුභාවයෙන් දෙන ලදී. (15-16 පද)

**සෙනසුරාදා - 2 තිමෝති 4 -** පළමුවැනි මූලධර්මයක්: යේසුස්වහන්සේ නැවත පැමිණ, මළවුන් නැගිටුවා ඔවුන් විනිශ්චය කර, පෘථිවිය මත තමන් වහන්සේගේ රාජ්‍යය ස්ථාපිත කරනවා ඇත. (1-8 පද)






## දිවැස්වරු

| | | |
|---|---|---|
| ඉරිදා | යෙසායා | 1 |
| සඳුදා | යෙසායා | 2 |
| අඟහරුවාදා | යෙසායා | 9 |
| බදාදා | යෙසායා | 11 |
| බ්‍රහස්පතින්දා | යෙසායා | 25 |
| සිකුරාදා | යෙසායා | 26 |
| සෙනසුරාදා | යෙසායා | 32 |

✦ දෙවියන්වහන්සේ තම දිවැස්වරු ඉශ්‍රායෙල් සහ යුදා හට යැව්වේ (පිටුපස කවරයේ ඇතුල් පැත්තේ ඇති සටහන බලන්න.) පිළිම වන්දනාවන් සහ මිත්‍යා ආගම් වලින් හැරවීමේ උත්සාහය සඳහාය. නමුත් "ඔවුහු සුවයක් නැතිතරම්... පණිවිඩකාරයන්ට සරදම්" කලෝය. (2 ලේකම් 36:16)

✦ අසිරියානුන් යුදා වටලා සිටියේදී, උස්සියා, යෝතම් අහාස් සහ හෙසකියා යන යුදා රජවරුන්ගේ රාජ්‍යකාල වලදී යෙසායා කථා කලේය. (සිතියම බලන්න.) යේසුස්වහන්සේ ගැනත් පෘථිවිය ගැනත් විශ්මිත පොරොන්දු ඔහු කලේය.




යෙසායාගේ කාලයේ ඇසිරියාව සහ මිසරය

## දිනපතා සටහන්

**ඉරිදා - යෙසායා 1 -** පාපය, ලාදුරු (5-6 පද) සහ අශුද්ධභාවය (16 පදය) වැනිය. නමුත් පසුතැවෙන්නා පිරිසිඳු කිරීමට දෙවියන්වහන්සේ කැමතිය. උන්වහන්සේට හැකිය. (16-18 පද)

**සඳුදා - යෙසායා 2 -** රාජ්‍යයේ මහිමාන්විත රූපිකයකට (2-4 පද) පෙර පාපය සහ උඩඟුබවට එරෙහිව දෙවියන්වහන්සේගේ කෝපය ගැන අවවාදයක් ඇත. (10-22 පද)

**අඟහරුවාදා - යෙසායා 9 -** යේසුස්වහන්සේ දාවිත්ගේ සිංහාසනයෙහි සදාකාලයටම හිඳගන්නවා ඇත. (6-7 පද) සහතික කරන්නා දෙවියන් වහන්සේමය. (7 පදය)

**බදාදා - යෙසායා 11 -** පොරොන්දුවූ දරුවා යෙසේ සහ දාවිත්ගේ පෙළපතේ (පරම්පරාවේ) යේසුස්වහන්සේය. (1 පදය)

**බ්‍රහස්පතින්දා - යෙසායා 25 -** දෙවියන්වහන්සේ විශ්වාස කරන්නන් ප්‍රීතිය සහ සදාකාල ජීවිතය උරුමකර ගන්නවා ඇත. (8-9 පද) 1 කොරින්ති 15:54 සහ එළිදරව් 21:4 බලන්න.

**සිකුරාදා - යෙසායා 26 -** දෙවියන්වහන්සේ විශ්වාස කරන්නන් හට බලාපොරොත්තු සහ සාමය ඇත. (1-3 පද) සමහර මිනිසුන් මරණින් කිසිදා නොනැගිටිනු ඇති අතර (14 පදය) අනෙක් අය නැගිටිනු ඇත. (19 පදය)

**සෙනසුරාදා - යෙසායා 32 -** යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ අනුගාමිකයන් පෘථිවිය පාලනය කරන විට (1 පදය) ධර්මිෂ්ඨභාවය පදනම් කරගත් සැබෑ සාමය තිබෙනු ඇත. (17 පදය)

| | |
|---|---|
| ඉරිදා | හෙබ්‍රෙව් 1 |
| සඳුදා | හෙබ්‍රෙව් 2 |
| අඟහරුවාදා | හෙබ්‍රෙව් 3 |
| බදාදා | හෙබ්‍රෙව් 4 |
| බ්‍රහස්පතින්දා | හෙබ්‍රෙව් 5 |
| සිකුරාදා | හෙබ්‍රෙව් 10 |
| සෙනසුරාදා | හෙබ්‍රෙව් 11 |

## හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද පත්‍රය

- ✦ යුදෙව් (හෙබ්‍රෙව්) අදහන්නන්ට පළමුව ආමන්ත්‍රණය කල මෙම හසුන, පළමුව ගිය සැමට ඉහලින් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්තරීතර තත්ත්වය පෙන්වයි.
- ✦ දෙවියන්වහන්සේට පමණක් හැර - අන් සියල්ලන්ට හෝ සියල්ලට වැඩියෙන් උන්වහන්සේ යහපත්ය.
- ✦ <u>පොරොන්දු</u> ඉටු කිරීමට සහ සියලුම යුගයන්හි සිටි විශ්වාස වන්තයන්ට දිමනා දීම සඳහා නැවත පැමිණෙන උන්වහන්සේ, පැරණි ගිවිසුම තුළ පොරොන්දු වූ තැනන්වහන්සේය. (11 පරිච්ඡේදය බලන්න.)

### දිනපතා සටහන්

<u>ඉරිදා - හෙබ්‍රෙව් 1 -</u> දිවැස්වරු සහ දේවදූතයන් මගින් දෙවියන්වහන්සේ තම වචනය එවුවද, සියල්ලටම වඩා විශිෂ්ටවූ උන්වහන්සේගේ පුත්‍රයා, යේසුස් වහන්සේ මගින් (1 පදය) එය එවූ සේක.

<u>සඳුදා - හෙබ්‍රෙව් 2 -</u> උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රය වුවද, "යක්ෂයා" (පාපය) පරාජය කිරීමට (14 පදය) සහ බොහෝ අය සඳහා ගැළවීම ලබා දෙන්නට (10 පදය) යේසුස්වහන්සේ අපගේ ස්වභාවය බෙදාගත්හ.

<u>අඟහරුවාදා - හෙබ්‍රෙව් 3 -</u> දෙවියන්වහන්සේගේ පුත්‍රයා තුළ අපට විශ්වාසය තිබිය යුතුය. (6 පදය) නමුත් විශ්වාස කර අවසානය දක්වා නොසැලෙන ලෙස සිටිය යුතුය. (14 පදය)

<u>බදාදා - හෙබ්‍රෙව් 4 -</u> යෝෂුවා, ඉශ්‍රායෙල් පොරොන්දු දේශයට ඇතුල් වූ පසු සදාකාලික විවේකය නොදුන්නද (8 පදය) යේසුස්වහන්සේ තම ජනතාව සඳහා අවසානයේදී එය සපයනවා ඇත. (9-11 පද)

<u>බ්‍රහස්පතින්දා - හෙබ්‍රෙව් 5 -</u> යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වුවත්, කීකරුකම ඉගෙන ගන්නටත්, මරණයෙන් බේරා ගන්නටත් උවමනා විය. (8 පදය) නමුත් උන්වහන්සේ මෙල්කිසදෙක් මෙන් පූජක රජෙකු වෙනු ඇත. (10 පදය) උත්පත්ති 14:18 බලන්න.

<u>සිකුරාදා - හෙබ්‍රෙව් 10 -</u> පාපය සඳහා එකම සහ අවසන් පරිපූර්ණ පූජාව යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. (11-13 පද) පූජාව කෙරෙහි විශ්වාසය අපට අවශ්‍යය (38 පදය)

<u>සෙනසුරාදා - හෙබ්‍රෙව් 11 -</u> විශ්වාසය යනු දෙවියන්වහන්සේගේ පොරොන්දු තුළ සහතිකයයි. (1 පදය) විශ්වාසය නොමැතිව දෙවියන්වහන්සේ ප්‍රසන්න කල නොහැකිය. (6 පදය) මෙම පරිච්ඡේදයේ සියලුම නාමයන් දෙවියන් වහන්සේගේ පොරොන්දු තුළ විශ්වාසය තිබූ අයගේය. (39-40) ඔවුන්ගේ විශ්වාසය ඔවුන් ගත කල ජීවිත වෙනස් කලේය.





## දෙවියන්වහන්සේගේ සාක්ෂි - කාරයෝ

| | |
|---|---|
| ඉරිදා | යෙසායා 40 |
| සඳුදා | යෙසායා 42 |
| අඟහරුවාදා | යෙසායා 52 |
| බදාදා | යෙසායා 53 |
| බ්‍රහස්පතින්දා | යෙසායා 55 |
| සිකුරාදා | යෙසායා 60 |
| සෙනසුරාදා | යෙසායා 61 |

- ✦ තමන් දෙවියන්වහන්සේ බවටත්, තමන් සත්‍ය බවටත් දෙවියන් වහන්සේ විපුල සාක්ෂි සපයයි.
- ✦ අහස සහ එහි ආශ්චර්යයන් උන්වහන්සේගේ බලය ගැන පවසත් (ගීතාවලිය 19)
- ✦ ප්‍රාතිහාර්යාත්මකව ආරක්ෂිතවූ උන්වහන්සේගේ වචනය (1 පේත්‍රුස් 1:25) උන්වහන්සේගේ සැලැස්ම සහ අභිප්‍රාය ප්‍රකාශ කරයි.
- ✦ තමන්ගේ ජීවන මාර්ගය, ප්‍රාතිහාර්යය, මරණය සහ උත්ථානය මගින් සැබෑ දෙවියන්වහන්සේ සහ සදාකාල ජීවිතය ප්‍රකාශ කල යේසුස් ක්‍රිස්තුස්වහන්සේ (1 යොහන් 1:1-2) උන්වහන්සේගේ විශ්වාසවන්ත සහ සත්‍ය සාක්ෂිකරුවණෝය. (එළිදරව් 1:5)
- ✦ තමන්ගේ ක්‍රියා සහ ජීවන විලාශය මගින් අපොස්තුලුවරු, දිවැස්වරු සහ සියලුම සැබෑ අදහන්නන් දෙවියන්වහන්සේ සත්‍ය බවට සාක්ෂි දරත්.
- ✦ දෙවියන්වහන්සේ එකම දෙවියන් බවටත් උන්වහන්සේ ප්‍රකාශ කරන දේ සැම විටම සත්‍ය වන බවටත් විශේෂ සාක්ෂිය ඉශ්‍රායෙලයයි. (යෙසායා 43:12)

### දිනපතා සටහන්

<u>ඉරිදා - යෙසායා 40 -</u> දුබල මිනිස් වර්ගයා හට සැනසිලි වදන්ද (1-8 පද) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් විශ්මිත පොරොන්දුද (6-11, 31 පද) දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන සේක.

<u>සඳුදා - යෙසායා 42 -</u> "සේවකයා" ගැන පොරොන්දු මාලාවක පළමු වැන්න මෙයයි. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ සේවකයා සහ සාක්ෂිකරුවා විය. (1-8 පද) නව ගිවිසුමෙහි මෙම පරිච්ඡේදය උපුටා දක්වා ඇත. (මතෙව් 12:18-21, 3:17)

<u>අඟහරුවාදා - යෙසායා 52 -</u> යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පණිවිඩකරු (7 පදය) සහ සේවකයා (13 පදය) විය. දෙවියන්වහන්සේගේ ජනතාව ශුද්ධවූ හෝ වෙන්වූ හෝ විය යුතුය. (11 පදය)

<u>බදාදා - යෙසායා 53 -</u> එය සිදුවීමට වසර 700 කට පෙර, යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබීම ගැන විශ්මිත විස්තරයක්. දෙවියන්වහන්සේගේ සේවකයා (යේසුස්වහන්සේ) පාපය සහ පව්කාරයන් නිසා වේදනා විඳින බවත් (11 පදය) නමුත් අන්තිමේදී ජයග්‍රාහීවන බවත්. (10, 12 පද)

<u>බ්‍රහස්පතින්දා - යෙසායා 55 -</u> සාක්ෂිකරුවෙකු සහ නායකයෙකු (4 පදය) වශයෙන් දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ දී ඇත. අප දැන් ප්‍රතිචාර දැක්වුවහොත් (6 පදය) අපට සමාව ලැබීමටත් (7 පදය) පොරොන්දු වල උරුමකාරයන් වීමටත් හැකිය. (3 පදය)

<u>සිකුරාදා - යෙසායා 60 -</u> දෙවියන්වහන්සේගේ විශේෂ ජනතාව වූ ඉශ්‍රායෙල් ප්‍රතිස්ථාපනය කරනු ඇත. දෙවියන්වහන්සේගේ යහපත්භාවයට, විශ්වාසී භාවයට සහ බලයට තවත් සාක්ෂියකි.

<u>සෙනසුරාදා - යෙසායා 61 -</u> 1-2 පද හැඟවූයේ තමන් බැව් යේසුස්වහන්සේ දැනගත් අතර නාසරෙත් හිදී එය උන්වහන්සේ ශබ්ද නගා කියැවිය. (ලූක් 4:16-21) ජාතීන් ආශීර්වාද කරන මනාලයා උන්වහන්සේය. (10-11 පද)

| | |
|---|---|
| ඉරිදා | හේබ්‍රෙව් 12 |
| සඳුදා | හේබ්‍රෙව් 13 |
| අඟහරුවාදා | යාකොබ් 1 |
| බදාදා | යාකොබ් 2 |
| බ්‍රහස්පතින්දා | යාකොබ් 3 |
| සිකුරාදා | යාකොබ් 4 |
| සෙනසුරාදා | යාකොබ් 5 |

## විශ්වාසය සහ ක්‍රියා

- ✦ විශ්වාසය, දෙවියන්වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයේ පදමයි. (හේබ්‍රෙව් 11:6) උන්වහන්සේගේ දයාවන්ත පොරොන්දු කෙරෙහි විශ්වාස කරන්නට අප ඉගෙන ගත යුතුය. ඒවා අපට __ලැබීමට සුදුසු__ යැයි සිතීමට නොහැක.
- ✦ නමුත් එය අපගේ ජීවිත වල ප්‍රදර්ශනය නොකලහොත් විශ්වාසට පවතින්නට නොහැක. ක්‍රියා නොමැති විශ්වාසය මිය ගොසින්ය. අර්ථ විරහිතය.
- ✦ විශ්වාසවන්ත මිනිසුන් සහ ගැහැණුන් විශ්වාසවන්තව ජීවත් විය යුතුය.

## යාකොබ්ගේ පත්‍රය

- ✦ යාකොබ් යේසුස්වහන්සේගේ පොදු සොහොයුරෙකු වූ අතර, යේසුස් වහන්සේගේ උත්ථානය තෙක් ඔහු පරිවර්තනය නොවුනි. පසුව ඔහු යෙරුසලමේ සභාවේ (හෝ එක්ලේසියා) රදගුරු විය. (ක්‍රියා 15)
- ✦ ඔහුගේ ලිපිය බොහෝ ප්‍රායෝගික වන අතර ක්‍රියාවෙන් ප්‍රදර්ශනය කල යුතු විශ්වාසයේ මගහැරිය නොහැකි අවශ්‍යතාවය පෙන්වයි.

### දිනපතා සටහන්

__ඉරිදා - හෙබ්‍රෙව් 12 -__ අනුගමනය කිරීම සඳහා බොහෝ යහපත් ආදර්ශ අපට ඇතත් (1 පදය) ඒ අතරින් ඉතාම යහපත් ආදර්ශය යේසුස්වහන්සේ වන අතර, අප __උන්වහන්සේ__ දෙස බැලිය යුතුය. (2 පදය)

__සඳුදා - හේබ්‍රෙව් 13 -__ අප සියල්ලන් සඳහා විශිෂ්ටතම ආදර්ශය යේසුස් වහන්සේය. (7-8 පද) උන්වහන්සේගේ මරණින් සහ උත්ථානයෙන් පමණක් අපට බලාපොරොත්තු ඇත. (20-21 පද)

__අඟහරුවාදා - යාකොබ් 1 -__ පෙළඹවීම ඇතුලාන්තයෙන්ය. (14 පදය) මාර්ක් 7:21 හි යේසුස්වහන්සේ පැවසුවේ කුමක්දැයි බලන්න. ඥාණවන්තභාවය. නැවත උත්පත්තිය සහ අවසානයේදී ජීවනයේ කිරීටයක්, විශ්වාසවන්ත මිනිසුන් සහ ගැහැණුන් සඳහා දෙවියන්වහන්සේගේ ආශිර්වාදයන්ය. (8, 18, 12 පද)

__බදාදා - යාකොබ් 2 -__ විශ්වාසවන්ත සිතුවිලි, විශ්වාසවන්ත ක්‍රියා සඳහා ප්‍රතිපල දිය යුතුය. (21-26 පද)

__බ්‍රහස්පතින්දා - යාකොබ් 3 -__ දිව පාලනය කල හැක්කේ, දෙවියන් වහන්සේගේ වචනයෙන් පිරි මනසකට පමණි. (17 පදය)

__සිකුරාදා - යාකොබ් 4 -__ “ලෝකය” යනු (4 පදය) දෙවියන්වහන්සේ විරහිතව ජීවත් වන්නවුන්ය. “ලෝකය” සහ දෙවියන්වහන්සේ අතර අප තෝරාගත යුතුය. නිහතමානිත්වය අත්‍යාවශ්‍යය (10 පදය)

__සෙනසුරාදා - යාකොබ් 5 -__ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම තෙක් දෙවියන්වහන්සේගේ ජනතාව ඉවසීමෙන් ජීවත් වීම සහ ක්‍රියා කල යුතුය. (7 පදය)





## යෙරමියා තුළින් පැමිණි දෙවියන්වහන්සේගේ අනාවැකිය

| | |
|---|---|
| ඉරිදා | යෙරමියා 1 |
| සඳුදා | යෙරමියා 17 |
| අඟහරුවාදා | යෙරමියා 30 |
| බදාදා | යෙරමියා 31 |
| බ්‍රහස්පතින්දා | යෙරමියා 33 |
| සිකුරාදා | යෙරමියා 36 |
| සෙනසුරාදා | යෙරමියා 38 |

- ✦ යෙරමියා යුදෙව් පූජකයෙකුගේ පුත්‍රයා විය. දිවැස්වරයෙකුසේ ඔහුගේ මෙහෙය යුදහි රජු වූ යෝෂියාගේ පාලන සමයේදී ආරම්භ වී, බැබිලෝනියේ වහල් භාවයට ගෙනයන තෙක් වසර 40 ක් පැවතුනි. (පසු පිට කවරයේ ඇතුල් පැත්තේ සටහන බලන්න)
- ✦ ඔහු හට දිවැස්වරයෙකු වීමට උවමනාවන් නොතිබුනද (යෙරමියා 1:6) දෙවියන්වහන්සේ තම වචනය ඔහුගේ මුවට දමා (9 පදය) ඉශ්‍රායලය සහ අවට සියළු ජාතීන් ගැන අනාගත වාක්‍යය කියැව්වේය. (10 පදය)
- ✦ යෙරමියා පොතේ සහ ඊට පසු පැමිණි විලාප ගී පොතේ, දෙවියන් වහන්සේගේ ජනතාවට අනාගතයේදී විඳින්නට සිදුවන වේදනා ගැන බොහෝ දේ කීමට ඔහුට තිබුනි.
- ✦ දෙවියන්වහන්සේගේ දිවැසිවරු සියල්ල මෙන්, තමාගේ ක්‍රියා නිසා යෙරමියා වේදනා වින්දේය. (38 පරිච්ජේදය) පැමිණෙන මෙසායාගේ විඳවීමත්, වසර ගණනක විඳවීමට පසුව ජාතියේ ප්‍රතිසංස්කරණයන් ගැන හෙතෙම ප්‍රකාශ කලේය. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ස්ථාපිත කරවීම ගැනද ඔහු අනාවැකි ප්‍රකාශ කලේය.

### දිනපතා සටහන්

__ඉරිදා - යෙරමියා 1 -__ තමා කුමක් ප්‍රකාශ කල යුතු දැයි දෙවියන්වහන්සේ යෙරමියා හට කීහ. (9 පදය) යුදා ජාතියේ ජනතාවගේ පාපයට දඬුවම් ලැබෙනු ඇත. (16 පදය) එය පැමිණෙන්නේ උතුරිනි (බැබිලෝනියානු ආක්‍රමණය) (14 පදය සහ යෙරමියා 4:6, 6:1)

__සඳුදා - යෙරමියා 17 -__ යුදාගේ එකම බලාපොරොත්තුව දෙවියන්වහන්සේ තුළ විය (13-14 පද) අපගේත් එසේ විය යුතුය. (7-8 පද) ගීතාවලිය 1:3 සහ එළිදරව් 22:1-2 බලන්න.

__අඟහරුවාදා - යෙරමියා 30 -__ ඉශ්‍රායෙලයේ රැක ගැනීම සහ ප්‍රතිස්ථාපනය ගැන අනාවැකි පවසා ඇත. (10, 11, 24 පද) පළමු වැනි ලෝක යුද්ධයේදී ආරම්භවූ මෙය දෙවැනි ලෝක යුද්ධයේදී වැඩි දියුණු විය.

__බදාදා - යෙරමියා 31 -__ ජාතියක් ලෙස ඉශ්‍රායෙලයට අවසානයේදී අලුත් හදවතක් ලැබෙනු ඇත. (31-34 පද) හේබ්‍රෙව් 8:7-13 බලන්න. ඇය අවසානයේදී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම රජු ලෙස පිළිගනු ඇත.

__බ්‍රහස්පතින්දා - යෙරමියා 33 -__ පෘථිවිය ආරක්ෂා කිරීමට දෙවියන් වහන්සේගේ පොරොන්දුව (උත්පත්ති 8:22) උන්වහන්සේ ඉශ්‍රායෙලයටවූ පොරොන්දුවේ සහතිකයකි (19-26 පද)

__සිකුරාදා - යෙරමියා 36 -__ යෙහොයියාකිම් ප්‍රතිපල විරහිතව දෙවියන් වහන්සේගේ වචනය විනාශ කරන්නට තැනුවද (23 පදය) තවත් ලියැවිල්ලක් ලියැවුනු අතර (32 පදය) දෙවියන්වහන්සේගේ වචනය සත්‍ය වුනි.

__සෙනසුරාදා - යෙරමියා 38 -__ යෙරමියාගේ අත්දැකීම් (6 පදය) ඉදිරියට යොමු වී “වලෙහි” (මිනිවල) දැමූ යේසුස්වහන්සේ සිහිකරයි.

| | | |
|---|---|---|
| ඉරිදා | 1 පේතෘස් | 1 |
| සඳුදා | 1 පේතෘස් | 2 |
| අඟහරුවාදා | 1 පේතෘස් | 3 |
| බදාදා | 1 පේතෘස් | 5 |
| බ්‍රහස්පතින්දා | 2 පේතෘස් | 1 |
| සිකුරාදා | 2 පේතෘස් | 2 |
| සෙනසුරාදා | 2 පේතෘස් | 3 |

## පේතෘස්ගේ හසුන්

✦ ධීවරයෙකු වූ පේතෘස් වසර තුනක් යේසුස්වහන්සේගේ විශ්වාසවන්තවූ අනුගාමිකයෙකු වුවද, තම වේදනාකාරී පසු තැවිමට, යේසුස්වහන්සේ හට තමන්ගේ සහාය අවශ්‍යම වූ අවස්ථාවේ උන්වහන්සේ ප්‍රතික්ෂේප කරන ලදී.

✦ ස්වාමිවූ යේසුස්වහන්සේගේ උත්ථායෙන් පේතෘස්ගේ විශ්වාසය යලි දැල්වුනු අතර "රැළ පෝෂණය කිරීමට" වගකිම යේසුස්වහන්සේ ඔහුට දුන්සේක. (යොහන් 21:15-18)

✦ පේතෘස්, සුභාරංචියේ වැදගත්, පළමු දේශකයෙක්වූ අතර පළමුව යුදෙව්වනට (ක්‍රියා 2-9) සහ අන්‍ය ජාතීන්ට (යුදෙව් නොවන) (ක්‍රියා 10-12) දේශනා කලේය. කිහිපවතාවක්ම හෙතෙම සිරගත වූ අතර, යේසුස් වහන්සේ අනාවැකි කී ලෙස, මතයට අනුව අවසානයේදී ධර්මය වෙනුවෙන් දිවි පිදුවේය.

✦ ලෝකය පුරා විසිරී සිටි යුදෙව් අදහන්නන් ආමන්ත්‍රණය කල ඔහුගේ ලිපි, රැළේ ප්‍රධාන එඬේරා ලෙස යේසුස්වහන්සේගේ නායකත්වය ප්‍රකාශ කරයි. අඳුරු ලෝකයක් තුළ තමන්ගේ ශුද්ධවූ කැඳවීම අදහන්නන්ට සිහිගන්වයි. වේදනාව සහ විනිශ්චයන් ඔවුන් බලාපොරොත්තු විය යුතුය. නමුත්, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ පොරොන්දු නිසැකය. උන්වහන්සේ මගින්, ලෝකයට පැමිණෙන විනිශ්චයන්ගේන් බේරීමට අපටත් පුලුවන.

### දිනපතා සටහන්

**ඉරිදා - 1 පේතෘස් 1 -** ස්වර්ගයේ දෙවියන්වහන්සේ විශ්වාසවන්තයන් සඳහා උරුමයක් වෙන්කර ඇත. එය අන්තිමේදී පෘථිවිය මත (4-5 පද) එළිදරව් වන්නේ යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමේදීය. (7 පදය)

**සඳුදා - 1 පේතෘස් 2 -** පැරණි ඉශ්‍රායලය මෙන්, ප්‍රතිවිපාක ලැබෙන වගකීම් සහිත (12 පදය) විශේෂ ජනතාවක් (9-10 පද) වීමට අදහන්නන් කැඳවනු ලැබේ. තම දිනපතා ජිවිතයේදී යේසුස්වහන්සේ මෙන් නිදොස් වීමට ඔවුන් උත්සහ කල යුතුය.

**අඟහරුවාදා - 1 පේතෘස් 3 -** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ආදර්ශය වන අතර, අවශ්‍ය නම් උන්වහන්සේ සඳහා වේදනා විඳිය යුතුය. (14 පදය) (නෝවා ලෙසින්) ගැළවීම ලැබීමට අප උන්වහන්සේ තුළට බෞතිස්ම විය යුතුය. (21 පදය)

**බදාදා - 1 පේතෘස් 5 -** තම ජනතාවගේ එඬේරා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වන අතර උන්වහන්සේ නැවත පැමිණි විට ඔවුන් කිර්තියට පත්කරනු ඇත. (4 පදය)

**බ්‍රහස්පතින්දා - 2 පේතෘස් 1 -** තම රාජ්‍යයේ සදාකාලික විභූතියේ (11 පදය) මහත් සහ වටිනා පොරොන්දු ක්‍රිස්තුස්වහන්සේ මගින් දෙවියන්වහන්සේ ප්‍රකාශ කරන සේක. (4 පදය)

**සිකුරාදා - 2 පේතෘස් 2 -** අප, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විශ්වාසවන්ත ඇදහිලිකාරයන් ලෙස සිටි නම් (20 පදය) පැමිණෙන විනිශ්චයන්ගෙන් (9 පදය) දෙවියන්වහන්සේ නෝවා (5 පදය) සහ ලොත් (7 පදය) ගලවාගත් ලෙසින් අප බේරා ගැනීමටද හැකිය.

**සෙනසුරාදා - 2 පේතෘස් 3 -** "අහසද පොළොවද" (7 පදය) යනු මිනිස් රාජ්‍යයන් සහ ජනතාවය. ("ලෝකය") ඒවා දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙන් ආදේශ කරනු ඇත. (13 පදය) යෙසායා 65:17-25 බලන්න.





## එසෙකියෙල්ගේ අනාවැකිය

| | | |
|---|---|---|
| ඉරිදා | එසෙකියෙල් | 2 |
| සඳුදා | එසෙකියෙල් | 3 |
| අඟහරුවාදා | එසෙකියෙල් | 18 |
| බදාදා | එසෙකියෙල් | 36 |
| බ්‍රහස්පතින්දා | එසෙකියෙල් | 37 |
| සිකුරාදා | එසෙකියෙල් | 38 |
| සෙනසුරාදා | එසෙකියෙල් | 39 |

✦ බැබිලෝනියට සිරකරුවෙකු වශයෙන් ගෙන යන ලදුව, එහිදී අනාවැකි පැවසූ එසෙකියෙල් පූජකයෙකු විය. (පසුපිට කවරයේ ඇතුල් පැත්තේ ඇති සටහන බලන්න.)

✦ බොහෝ අනාවැකි පවසන්නට ඔහුට පවරන ලදී. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙස යොමු කරමින්, ඔහු "සලකුණු වල මනුෂ්‍යයෙකු" සහ "මනුෂ්‍ය පුත්‍රයෙකු" ලෙද හඳුන්වනු ලැබිය.

✦ 37 පරිච්ඡේදයේ ඇති සිත්ගන්නා අනාවැකියක් අපගේ කාලයට සම්බන්ධය ! නූතන ප්‍රාතිහාර්යයක් වූ ඉශ්‍රායෙලයේ පුනරුදයත්, ඇයගේ පැමිණෙන රජු ගැනත් එය විස්තර කරයි. (22 පදය) එසේ වුවත්, දේශය නැවතත් උතුරින් ආක්‍රමණය කරනු ලබන අතර (38 පරිච්ඡේදයේ) දෙවියන්වහන්සේ මැදිහත් වෙනු ඇත.

### දිනපතා සටහන්

**ඉරිදා - එසෙකියෙල් 2 -** ශ්‍රවණය කරන්නන්ගේ ප්‍රතිචාරය කුමක් වුවත්, දෙවියන්වහන්සේගේ පණිවිඩය බෙදා හැරිය යුතුය. (5 පදය)

**සඳුදා - එසෙකියෙල් 3 -** සත්‍යය දැනගත් අය හට, එය අන්‍යයන්ට ප්‍රකාශ කිරීමේ වගකීමක් ඇත (17-18 පද) එසෙකියෙල් මෙම කාර්යය විශ්වාස වන්තව කලේය

**අඟහරුවාදා - එසෙකියෙල් 18 -** පුද්ගලයෝ තේරුම්ගත් විට, තම පාප සඳහා වගකිම භාරගත යුතුය. (4, 32 පද)

**බදාදා - එසෙකියෙල් 36 -** ඉශ්‍රායෙලයේ ස්ථාපනයට අරාබි විරෝධය මෙම පරිච්ඡේදය විස්තර කරයි. උන්වහන්සේගේ හස්තයේ ක්‍රියාකාරීත්වය ඔවුන් හඳුනා නොගත්තද, දෙවියන්වහන්සේ විසින් ඉශ්‍රායෙලය කලකට ආරක්ෂා කරනු ඇත.

**බ්‍රහස්පතින්දා - එසෙකියෙල් 37 -** වසර 2000 කට පසුව අද ඉශ්‍රායලයේ පුනරුදය ප්‍රාතිහාර්යයක් මෙන්ම දෙවියන්වහන්සේගේ වචනයට සාක්ෂියකි. ඉශ්‍රායෙලයේ අනපේක්ෂිත පුනරුදය ගැන වෙනත් විග්‍රහයක් තිබේද?

**සිකුරාදා - එසෙකියෙල් 38 -** උතුරින් ඉශ්‍රායෙලයට පැමිණීමට නියමිත ආක්‍රමණයක් (15 පදය) දිව්‍යමය මැදිහත් වීමකින් පෙරලා දමනු ඇත. (18-23 පද)

**සෙනසුරාදා - එසෙකියෙල් 39 -** ඇය දෙවියන්වහන්සේ දෙසට හැරුණු විට ඉශ්‍රායෙලය සාමය සොයාගන්නා අතර ඇයගේ සතුරන් විනාශ කරනු ඇත. එවිට දෙවියන්වහන්සේ ඇයට ආශිර්වාද කොට ඇයගේ පාපයන්ගෙන් ඇය පිරිසිදු කරනු ඇත.

| | | |
|---|---|---|
| ඉරිදා | 1 යොහන් | 1 |
| සඳුදා | 1 යොහන් | 2 |
| අඟහරුවාදා | 1 යොහන් | 3 |
| බදාදා | 1 යොහන් | 4 |
| බ්‍රහස්පතින්දා | 2 යොහන් | |
| සිකුරාදා | 3 යොහන් | |
| සෙනසුරාදා | | යුද් |

## යොහන්ගේ ලිපි, යුද්ගේ ලිපිය

✦ යේසුස්වහන්සේගේ ගෝලයා වූ යොහන්, සුභාරංචි වාර්තාවක්, කෙටි ලිපි තුනක් සහ එළිදරව් පොත ලිවීය.

✦ ඔහු "යේසුස්වහන්සේ ප්‍රේමකල ගෝලයා" ලෙස හැඳින්වූ අතර (උන්වහන්සේ ඔවුන් සියල්ලටම ප්‍රේමකලහ!) ඔහුගේ ලිපිවල නිතරම ප්‍රේමය සහ සත්‍යය යන තේමා දෙක පවතියි.

✦ දැනටමත් මිත්‍යා ඉගැන්වීම් සභාව තුළට රිංගා ඒම ආරම්භ වී තිබුනි. ක්‍රි.ව. දෙවැනි සියවස අවසානය වන විට යේසුස්වහන්සේගේ සත්‍ය ඉගැන්වීම්, ක්‍රිස්තියානි යැයි කියාගත් අය අතර, අදද පොදුවේ ඇති මිත්‍යා ධර්ම වලින් අදේශ කර තිබුනි.

✦ මෙම සටහන් පොතේ 60-63 පිටුවල ඇති බයිබල් ඉගැන්වීම් සමඟ අද බොහෝ "ආගම්" වල අදහස් සසඳන්න ! යේසුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයෝ පිළිගන්නේ බයිබලයේ ඉගැන්වීම් පමණි. මිනිසුන්ගේ ඉගැන්වීම් නොවේ.

✦ යේසුස්වහන්සේගේ පොදු සහෝදරයෙකු විය හැකි යුද්, අපගේ පොදු ගැළවීම පිළිබඳ ලියූ නිබන්ධනයක් නවතා, විශ්වාසය ආරක්‍ෂා කිරීම සඳහා හදිසි ආයාචනයක් සටහන් කලේය.

### දිනපතා සටහන්

**ඉරිදා - 1 යොහන් 1 -** දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ සමඟ සහභාගිත්වය විය හැක්කේ දෙවියන්වහන්සේගේ වචනය නම් ආලෝකයේ ගමන් කරන්නන්ට පමණි. (7 පදය) අපගේ පාපයන් පැවසීම, සමාව සහ පවිත්‍ර වීම සඳහා මාර්ගය සකසයි. (9 පදය)

**සඳුදා - 1 යොහන් 2 -** ආලෝකයේ ගමන් කරන්නෝ දෙවියන්වහන්සේගේ දරුවෝය. ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම ඔවුන් එකමුතුව බලා හිඳිති (28 පදය) ලෝකයේ මාර්ගය සහ එය අනුගමනය කරන්නෝ මිය යන්නාහුය. (17 පදය)

**අඟහරුවාදා - 1 යොහන් 3 -** දෙවියන්වහන්සේ අප සඳහා පෙන්වා ඇත්තේ කෙතරම් විශ්මිත ප්‍රේමයක්ද (1 පදය) දෙවියන්වහන්සේගේ දරුවන්, ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමේදී උන්වහන්සේට සමාන කරනවා ඇත. (2 පදය)

**බදාදා - 1 යොහන් 4 -** දෙවියන්වහන්සේගේ දරුවන් සත්‍යය දනි. (1 පදය) එකිනෙකාට ප්‍රේම කරති. (7 පදය) විනිශ්චයේ දවස සඳහා සූදානම් වීමට උත්සාහ ගනී. (17 පදය)

**බ්‍රහස්පතින්දා - 2 යොහන් -** දෙවියන්වහන්සේගේ දරුවන් සත්‍යය දනි. (1 පදය) එකිනෙකාට ප්‍රේම කරති. (5 පදය)

**සිකුරාදා - 3 යොහන් -** දෙවියන්වහන්සේගේ දරුවන් සත්‍යයේ ගමන් කරති. (1-4 පද) සියල්ලට ප්‍රේමය පෙන්වති. (5 පදය)

**සෙනසුරාදා - යුද් -** ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ අය, සියලු යුගයයන් සඳහා දුන්නාවූ විශ්වාසය ගැන අවංකව සටන් වැදිය යුතුය. (3 පදය) යේසුස් වහන්සේ නැවත පැමිණෙන තෙක් දෙවියන්වහන්සේට අපගේ පියවර ආරක්‍ෂා කළ හැක. (24-25 පද)





## දානියෙල්ගේ අනාවැකිය

| | | |
|---|---|---|
| ඉරිදා | දානියෙල් | 2 |
| සඳුදා | දානියෙල් | 3 |
| අඟහරුවාදා | දානියෙල් | 5 |
| බදාදා | දානියෙල් | 6 |
| බ්‍රහස්පතින්දා | දානියෙල් | 7 |
| සිකුරාදා | දානියෙල් | 9 |
| සෙනසුරාදා | දානියෙල් | 12 |

✦ දානියෙල්, බැබිලෝනියේ රජු නොබුකද්නසාර් විසින් බැබිලෝනියේ සිරභාරයට රැගෙන ගිය යුදෙව් කුමරෙකු විය.

✦ ඔහුගේ අනුග්‍රාහිත පොත, අනාගතය හෙළිකරන ස්වප්න සහ තම ජනතාව කෙරෙහි දෙවියන්වහන්සේගේ සැලකිල්ල පෙන්වන මුසුවකි.

## රජතුමාගේ ස්වප්නය

✦ දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙන් අවසන්වන්නාවූ, සමහර අධිරාජ්‍යයන්ගේ ඉතිහාසය රූපනය කල සිහිනයක් දෙවියන්වහන්සේ නොබුකද්නසාර්ට දුන්හ. දානියෙල්ගේ අනාවැකියේ ඉතිරි කොටස මෙම තේමාව ගොඩනගයි.




### දිනපතා සටහන්

**ඉරිදා - දානියෙල් 2 -** සදාකල් පවත්නා දෙවියන්වහන්සේගේ රාජ්‍යය, වර්තමාන මිනිස් රාජ්‍යයන්ගේ තැන ගන්නවා ඇත. (44 පදය)

**සඳුදා - දානියෙල් 3 -** අපි දෙවියන්වහන්සේට පමණක් වන්දනා කල යුතු වෙමු. විශ්වාසය මගින් අපට පැමිණෙන ධෛර්යය, මිනිසා විසින් අපට කල හැකි ඕනෑම දෙයකට මුහුණ දීමට ශක්තිය දෙනවා ඇත. (17-18 පද)

**අඟහරුවාදා - දානියෙල් 5 -** මනුෂ්‍යයාගේ රාජ්‍යයන් (බැබිලෝනිය මෙන්) "තරාදියේ කිරනු ලැබ, අඩු බව පෙනුනේය." (27 පදය) ඒවා වෙනස් කරනු ඇත.

**බදාදා - දානියෙල් 6 -** දානියෙල්ගේ අත්දැකීම්, මුද්‍රා තබන ලද සොහොන් ගැබක දමනු ලැබූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙසට යොමුවූ නමුත් (17 පදය) දෙවියන්වහන්සේ උන්වහන්සේ ගළවා ගත් සේක.

**බ්‍රහස්පතින්දා - දානියෙල් 7 -** දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරිපිට, මිනිසාගේ රාජ්‍යයන් තිරිසනුන් මෙන්ය. දෙවියන්වහන්සේ තමන්ගේම රාජ්‍යය පිහිටුවනු ඇත. (14, 27 පද)

**සිකුරාදා - දානියෙල් 9 -** ඉශ්‍රායෙල්ගේ පාපය නොතකා, දානියෙල්ගේ යාච්ඤාවට ක්ෂණික ප්‍රතිචාරයක් ලෙසින් (21 පදය) දෙවියන්වහන්සේ මෙසායා සහ ගැළවුම්කරුවෙකු පොරොන්දු වූ සේක. (25-26 පද)

**සෙනසුරාදා - දානියෙල් 12 -** දෙවියන්වහන්සේගේ ජනතාව මුදවාගනු ලබනු ඇත. (1 පදය) උත්ථානයක් සහ විනිශ්චයක් තිබෙනු ඇත. (2 පදය)

| | |
|---|---|
| ඉරිදා | හොෂෙයා 13 |
| සඳුදා | යෝවෙල් 3 |
| අඟහරුවාදා | මීකා 5 |
| බදාදා | සෙකරියා 8 |
| බ්‍රහස්පතින්දා | සෙකරියා 12 |
| සිකුරාදා | මලාකි 3 |
| සෙනසුරාදා | මලාකි 4 |

## "සුළු" දිවැස්වරු

- ✦ පැරණි ගිවිසුමේ දානියෙල්ට පසු පැමිණෙන දොලස, ඇතැම් විට "සුළු" දිවැස්වරුන් යැයි නම් කරන්නේ, ඒවා කෙටි නිසා මිස වැදගත්කමින් අඩු නිසා නොවේ.
- ✦ ඔවුන් සතු දෙවියන්වහන්සේගේ පණිවිඩය එසේම වැදගත් වන අතර, එහි මහත් තේමා යෙසායා, යෙරමියා, එසෙකියෙල් සහ දානියෙල් සතු ඒවාමය.
- ✦ දැන් අපට සැකෙවින් බැලිය හැක්කේ පොත් පහක් පමණක් නමුත්, ඔබ හත්වැනි පියවරට ප්‍රවිශ්ඨවූ විට (64 පිට බලන්න.) අවසානයේ සියලුම පොත් කියවනු ඇත. (බයිබල් ඉතිහාසයට සුළු දිවැස්වරු ගැළපෙන තැන් බලා ගැනීමට පිටුපස කවරයේ ඇතුල් පැත්තේ ඇති සටහන විමසන්න.)

## දිනපතා සටහන්

**ඉරිදා - හොෂෙයා 13 -** ඉශ්‍රායෙල්ගේ අවිශ්වාසකමට එරෙහිව දෙවියන් වහන්සේගේ ප්‍රේමය මෙම අනාවැකිය විස්තර කරයි. දෙවියන්වහන්සේගේ ජනතාව සඳහා (යුදෙව් හෝ අන්‍යජාතික) (1:10) යොමු කරවීමට අවශ්‍යය (5 පදය), රජෙකු අවශ්‍යය (10 පදය) සහ මරණින් ගළවා ගත යුතුය. (14 පදය) 1 කොරින්ති 15:54-57 බලන්න.

**සඳුදා - යෝවෙල් 3 -** සියලුම ජාතීන් සටන් කිරීම සඳහා යෙරුසලෙමට පැමිණිය යුතුය. එවිට දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගින් මැදිහත් වෙනු ඇත.

**අඟහරුවාදා - මීකා 5 -** බෙත්ලෙහෙම්හි උපත ලද යේසුස්වහන්සේ (2 පදය), තම ජනතාව ගළවා, ඔවුනට නායකත්වය දෙන යහපත් එඬේරාණෝය. (4-5 පද)

**බදාදා - සෙකරියා 8 -** ඉශ්‍රායෙලය සම්පූර්ණව ප්‍රතිසංස්කරණය සහ මනස්තාපය වූ විට (7-8 පද) දෙවියන්වහන්සේගේ විශ්මිත ක්‍රියාවේ උදාහරණ ලෙස සියලු ජාතීන් හට ඔවුනට ගෞරවය පෙන්වීමට සිදුවෙනවා ඇත. (13 පදය)

**බ්‍රහස්පතින්දා - සෙකරියා 12 -** යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගත් විට පමණක් (10 පදය) ඔවුන් සම්පූර්ණව ප්‍රතිස්ථාපනය කරනු ඇත.

**සිකුරාදා - මලාකි 3 -** යේසුස්වහන්සේ විනිශ්චයෙන් එනවිට (2 පදය) ඉශ්‍රායෙලය පිරිසිදු කරනු ලබන්නේය. (3 පදය) දැන් අප උන්වහන්සේට ගෞරව කර උන්වහන්සේ උදෙසා කැපවන්නේ නම්, උන්වහන්සේ අප අගේකොට සලකනු ඇත. (17 පදය)

**සෙනසුරාදා - මලාකි 4 -** ආශිර්වාදයෙන් (2 පදය) සහ ශාපයෙන් (6 පදය) පැරණි ගිවිසුම අවසන් කෙරේ. එයින් අප සඳහා ඇත්තේ කුමක්ද? දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමට ඉශ්‍රායෙල් අසාර්ථක විය. අප වෙනස් වේද!






## යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව්ව

| | |
|---|---|
| ඉරිදා | එළිදරව් 1 |
| සඳුදා | එළිදරව් 2 |
| අඟහරුවාදා | එළිදරව් 3 |
| බදාදා | එළිදරව් 5 |
| බ්‍රහස්පතින්දා | එළිදරව් 19 |
| සිකුරාදා | එළිදරව් 21 |
| සෙනසුරාදා | එළිදරව් 22 |

- ✦ බයිබලයේ අන්තිම පොත යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ පැමිණෙන රාජ්‍යය ගැන පණිවිඩය සම්පූර්ණ කරයි.
- ✦ එය දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේ වෙත (එළිදරව් 1:1) දෙන ලද්දේ, ස්වර්ගයෙන් යේසුස්වහන්සේ එළිදරව් වීමට පෙර සිදුවිය යුතුදේ පිළිබඳව උන්වහන්සේගේ සේවයන් හට පෙන්වීමටය.
- ✦ පැට්මෝස් දිවයිනට පිටුවහල්ව සිටි අවධියේ එය යොහන්ට දැනගන්නට සලස්වන ලදී.
- ✦ සංකේත භාෂාවෙන් දෙන ලද එය ශුද්ධලියවිල්ලේ ඉතිරියේ ආලෝකයෙන් පමණක් තේරුම්ගත හැක.
- ✦ පළමු පරිච්ඡේද තේරුම් ගැනීමට පහසුය. ඒවා ආමන්ත්‍රණය කළේ ආසියාවේ "සභා" (එක්ලේසියා) හතටය. (සිතියම බලන්න.) ඒවා තුළ අපට සජීවී අවවාද ඇත.




ආසියාවේ "සභා" හත
1. එපීසස්
2. ස්මර්නා
3. පර්ගමොස්
4. තියාතිරා
5. සාර්දිස්
6. ෆිලදෙල්ෆියා
7. ලවුදිකා

## දිනපතා සටහන්

**ඉරිදා - එළිදරව් 1 -** දෙවියන්වහන්සේ මෙම පොත, යේසුස්වහන්සේ තුළින්, තම සේවකයන් හට ඉගැන්වීමට දුන් සේක. (1 පදය) අප උන්වහන්සේගේ සේකයෝද ? එසේ නම්, අප උන්වහන්සේගේ වචනය කියවන්නෙමු, ශ්‍රවණය කරන්නෙමු, පවත්වන්නෙමු. (3 පදය)

**සඳුදා - එළිදරව් 2 -** අප "අසන්නට කන් ඇත්නම්" දෙවියන්වහන්සේගේ වචනයට සවන් දෙනවාද? (7, 11, 17, 29 පද) විශ්වාසිකයන් හට වූ පොරොන්දු දෙස බලා සිටින්න.

**අඟහරුවාදා - එළිදරව් 3 -** ඇල්මැරුණු ඇදහිලිවන්තයාට වඩා, සිසිල්ව හෝ උණුසුම්ව හෝ සිටීම වඩා හොඳය. (15 පදය) අප කවුරුන්ද? "ජයගන්නෝ" කවුරුන්ද ?

**බදාදා - එළිදරව් 5 -** ක්‍රිස්තුස්වහන්සේගේ අය පෘථිවියේ සියලු ජාතීන් මත පාලනය කරනවා ඇත. (10 පදය) අප "ක්‍රිස්තුස්වහන්සේගේද?"

**බ්‍රහස්පතින්දා - එළිදරව් 19 -** ක්‍රිස්තුස්වහන්සේ සතු අය උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමින් ආවරණය කරන අතර (8 පදය) උන්වහන්සේ සමඟ සදාකාලයටම එකතු වනු ඇත. (7 පදය)

**සිකුරාදා - එළිදරව් 21 -** "අලුත් යෙරුසලෙම" ක්‍රිස්තුස්වහන්සේගේ මනාලියයි. උන්වහන්සේ සමඟ සදාකාලයට එකතු වූ අය (2, 9, 10 පද). නමුත් සමහරු පිටත දමනවා ඇත. (8 පදය)

**සෙනසුරාදා - එළිදරව් 22 -** ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සඳහා යාච්ඤාවකින් බයිබලය අවසන් වෙයි. (20 පදය) මෙය අපගේ යාච්ඤාවද? උන්වහන්සේගේ පැමිණීමට අප සූදානම්ද?

## බයිබල් ඉගැන්වීම් වල සංක්ෂිප්තයක්

1. බයිබලය, උන්වහන්සේගෙන් ඍජුවම ආනුභාවය ලද දෙවියන් වහන්සේගේ වචනයයි. (2 තිමෝති 3:16, හෙබ්‍රෙව් 1:1, 2 පේත්‍රුස් 1:21)

2. ඇත්තේ එකම දෙවිකෙනෙකි, ලෝකය මැවූ පියාණන්වහන්සේය. (ද්විතිය කථාව 6:4, 1 කොරින්ති 8:6, 1 තිමෝති 2:5, යෙසායා 45:6, 12)

3. ශුද්ධාත්මය, තමන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට ක්‍රියාශීලිවූ දෙවියන්වහන්සේගේ බලය වේ. (ලූක් 1:35, ක්‍රියා 10:38, ක්‍රියා 8:18-19)

4. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ පියාණෝය. (ලූක් 1:35, මතෙව් 3:17, ගීතාවලිය 2:7)

5. කන්‍යාමරියාගෙන් උපත ලද යේසුස්වහන්සේ මනුෂ්‍යයාගේ පුත්‍රයා විය. (ගලාති 4:4, 1 තිමෝති 2:5, පිලිප්පි 2:8)

6. පාපය සහ මරණය පරාජය කිරීම සඳහා යේසුස්වහන්සේ අපගේ මනුෂ්‍ය ස්වභාවය උරුමකර ගත්හ. (හෙබ්‍රෙව් 2:14, හෙබ්‍රෙව් 4:15, රෝම 8:3)

7. සියලු පෙළඹවීම් ජයගත් යේසුස්වහන්සේ, පාප විරහිත වුවත්, පාපයෙන් සහ මරණයෙන් තම අනුගාමිකයන් ගලවා ගැනීම සඳහා මිය ගියහ. (රෝම 5:6, යොහන් 3:16, යෙසායා 53:5)

8. දෙවියන්වහන්සේට අකීකරු වී පාපය සහ මරණය පොළොවට ගෙනා පළමුවැනි මිනිසා ආදම් විය. (උත්පත්ති 3:17-19, රෝම 5:12, 1 කොරින්ති 15:21-22)

9. සියලු මිනිසුන් හට පාපයට නැඹුරු ස්වභාවයක් ඇති අතර ඔවුන් පවු කරන බැවින් මිය යති. (රෝම 6:23, දේශනාකාරයා 3:19-20, ගීතාවලිය 146:3-4)

10. මරණයේදී විඥ්ඥාණයක් නැත. (යෙසායා 38:18-19, දේශනාකාරයා 9:5-6, ගීතාවලිය 89:48)

11. "ආත්මය" යනු ශරීරය, ඉන්ද්‍රිය හැඟීම හෝ හුස්මය, නමුත් එය අමරණීය නොවේ. ආත්ම මියයත්. (යෙසායා 38:17, යෝෂුවා 11:11, එසකියෙල් 18:4)

12. "නිරය" යනු මිනීවල සඳහා තවත් නමකි. (යෝනා 2:1-3, ගීතාවලිය 116:3, ගීතාවලිය 16:10)

13. "නිරාගින්න" හඳුන්වන්නේ, විනිශ්චයේ දවසට පසු අවිශ්වාසිකයන්ගේ සම්පූර්ණ විනාශයයි. එය සැබැවින්ම, ගෙහෙන්නා නමැති හෙබ්‍රෙව් වචනයේ පරිවර්තනයක් වන අතර, එය යෙරුසලෙමට පිටත තිබූ මිටියාවතක් විය. එතැන අපද්‍රව්‍යය සහ අපරාධකරුවන් පිළිස්සූ අතර එය සදාකාලික වධකස්ථානයක් නොවිය. (මාර්ක් 9:43, මතෙව් 10:23, ගලාති 4:1-3 සමඟ සසඳන්න.

14. දෙවියන්වහන්සේ විසින් යේසුස්වහන්සේ මරණින් නැගිටවූ අතර පසුව ස්වර්ගයට නගින ලදී. (ක්‍රියා 1:3, 9, එළිදරව් 1:18, ක්‍රියා 10:40, මාර්ක් 16:19)

15. දෙවියන්වහන්සේ සහ මිනිසා අතර එකම මැදිහත්කරු යේසුස් වහන්සේ <u>පමණි.</u> (තිමෝති 2:5, හෙබ්‍රෙව් 7:24-25, ක්‍රියා 4:12)

16. යේසුස්වහන්සේ පෞද්ගලිකව පෘථිවියට පැමිණෙනු ඇත. (ක්‍රියා 1:10-11, මතෙව් 16:27, ක්‍රියා 3:20-21)

17. උන්වහන්සේ නැවත පැමිණි විට, යේසුස්වහන්සේ බොහෝ මිය ගියවුන් නැගිටුවනු ඇත. (1 තෙසලෝනික 4:16, යොහන් 5:29, දානියෙල් 12:1-2)

18. මරණින් පසු ජීවිතයේ එකම බලාපොරොත්තුව උත්ථානයයි. (1 කොරින්ති 15:13-14, පිලිප්පි 3:20-21, ක්‍රියා 24:15)

19. උත්ථානයට පසු විනිශ්චයක් තිබෙනු ඇත. (2 කොරින්ති 5:10, 2 තිමෝති 4:1, රෝම 14:10-12)

20. පෘථිවිය මත සදාකාලික ජීවිතය, අමරණීයත්වයට පත් කරන ලද ශරීර සතු මිනිසුන් සහ ගැහැණුන් සඳහාය. එය දෙවියන් වහන්සේගේ දීමනාව වේ. (මතෙව් 5:5, 1 කොරින්ති 15:53-54, පිලිප්පි 3:20-21)

21. ආබ්‍රහම්ට වූ පොරොන්දු හඟවන්නේ සියලු විශ්වාසිකයන් හට පෘථිවිය තුළ ප්‍රායෝගික උරුමයක්ය. (උත්පත්ති 13:15, උත්පත්ති 28:13, හෙබෙව් 11:8-9, 39-40)

22. දාවිත්ට වූ පොරොන්දු හඟවන්නේ ඉශ්‍රායලය තුළ දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ යේසුස්වහන්සේ රජු වීමය. (2 සාමුවෙල් 7:12-14, යෙසායා 9:6-7, ලූක් 1:30-33)

23. දෙවියාන්වහන්සේගේ රාජ්‍යයේ අගනුවර වනුයේ යෙරුසලෙමය. (එසකියෙල් 21:27, යෙසායා 24:23, මතෙව් 5:35)

24. උන්වහන්සේගේ අමරණීය අනුගාමිකයෝ ලෝකය පාලනය කිරීමට යේසුස්වහන්සේට උදව් කරනු ඇත. (දානියෙල් 7:27, එළිදරව් 2:26, ලූක් 22:30)

25. දෙවියන්වන්සේගේ රාජ්‍යයේ ප්‍රතිපලය වනුයේ සදාකාලික ධර්මිෂ්ඨතාවය, ප්‍රීතිය සහ සාමයයි. (යෙසායා 32:17, යෙසායා 2:4, ගීතාවලිය 67:4-7)

26. පෘථිවියේ මැරෙන සුලු ජනතාව වසර දහසක් ක්‍රිස්තුස්වහන්සේ පාලනය කරනු ඇත. සියලු පාපය සහ මරණය එවිට ඉවත් කරනු ඇති අතර පෘථිවිය දෙවියන් වහන්සේගේ මහිමයෙන් පිරෙනු ඇත. (එළිදරව් 20:6, එළිදරව් 21:4, 1 කොරින්ති 15:24-26)

27. යක්ෂයා යනු අප තුළම ඇති පාපයට ප්‍රවනතාවය මිස වෙනම සුපිරි ස්වභාවික ජීවියෙකු නොවේ. ක්‍රිස්තුස් වහන්සේ අපගේ නැඹුරුතාවයන් සහ පෙළඹවීම් බෙදාගත්තද පාප විරහිත භාවයෙන් ඒවා ජයගත්හ. එම නිසා, උන්වහන්සේ හට අපට උදව් කිරීමටත්, අප සමඟ උන්වහන්සේගේ ජයග්‍රහණය බෙදා ගැනීමටත් හැක. (යාකොබ් 1:14-15, හෙබෙව් 2:14, හෙබ්‍රෙව් 9:26)

28. සාතන් යන්නෙහි තේරුම විරුද්ධවාදියාය. දෙවියන් වහන්සේගේ කැමැත්තට විරුද්ධ වන කෙනෙක් හෝ දෙයක් හෝ සඳහා එම වචනය පාවිච්චි කරයි. පේත්‍රුස් පවා එක් අවස්ථාවක සාතන් යනුවෙන් හඳුන්වනු ලැබීය. (මතෙව් 16:23) දුෂ්ඨයන්ට විරුද්ධව දෙවියන් වහන්සේටද ඇතැම් විට විරුද්ධවාදියෙකු ලෙස ක්‍රියා කල හැක. (ගණන් කථාව 22:22, 2 සාමුවෙල් 24:1, 1 ලේකම් 21:1 සමඟ සසඳන්න.

29. යක්ෂයෝ (භූතයෝ) සුපිරි ස්වභාවික ජීවීන් නොවේ. මානසික ආබාධ සහිත අය තුළ "අශුද්ධ ආත්ම" ඇතැයි පවසන ලදී. මෙහි අරුත ආබාධිත මනස්ය. ඇත්තේ එකම දෙවිකෙනෙකි. මිත්‍යාදෘෂ්ඨික ආගම් වල සිටිනවා යැයි පැවසූ යක්ෂයෝ පැවතුනේ නැත. (1 කොරින්ති 10:20, ක්‍රියා 17:18, අන් දේවතාවන් = භූතයෝ, යෙසායා 45:5, 7)

30. ගැළවීම සම්බන්ධ වන්නේ පාපයට සමාව දීමටයි. ධර්මිෂ්ඨකම ලබාගත හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළ විශ්වාසයෙන් දෙවියන්වහන්සේගේ දයාවෙන් පමණි. (රෝම 4:13, 21-25, හෙබ්‍රෙව් 11:6, ගලාති 3:26)



31. දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ දේ ගැන සැබෑ පැවසීමකින් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්, ජලය තුළ ගිලීමේ බෞතීස්මය, ගැළවීම සඳහා අනිවාර්යය. මෙයින් අදහස් වන්නේ අප "මිහිදන්" වී ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවිතයකට නැවත නැගිටීමකි. අප උන්වහන්සේ අනුගමනය කරමින් සිටිනා විට, උන්වහන්සේගේ ධර්මිෂ්ඨභාවයෙන් අප ආවරණය කොට ඇත. (යොහන් 3:5, ක්‍රියා 8:12, මාර්ක් 16:16, ක්‍රියා 22:16, ක්‍රියා 8:38, රෝම 6:4, ගලාති 3:27-29)

32. ඉශ්‍රායෙලය දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟය. අකීකරුකම නිසා විසිරී සිටියද, බයිබල් අනාවැකි පූර්ණ වීමෙන් ඔවුන් නැවත එකතු වෙමින් සිටිති. (යොවෙල් 3:2, එසෙකියෙල් 37:12, එසෙකියෙල් 37:22)

33. ඉශ්‍රායලය මනස්තාපවී තම මෙසායා යේසුස්වහන්සේ ලෙස පිළිගත් විට, ඔවුන් ජාතියක් වශයෙන් පවිත්‍ර කොට, ජාතීන්ගේ ප්‍රධානියා වනු ඇත. (සෙකරියා 12:10, යෙරමියා 31:33, සෙකරියා 8:23, රෝම 11:25-29)

34. යේසුස්වහන්සේ අනුස්මරණය කරමින් පූප කැඩීම සහ මිදි යුෂ පානය උන්වහන්සේ විසින් තම සැබෑ අනුගාමිකයන් හට නියම කරන ලදී. (ලූක් 22-19-20, ක්‍රියා 2:42, 1 කොරින්ති 11:23-26)

35. ඇත්තේ වෙනස් නොකල හැකි එකම සුභාරංචියක් පමණි. (එපීස 4:4-6, ගලාති 1:3, යුද් 3)

36. සුභාරංචිය විශ්වාස කොට ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතීස්ම වන්නන් "ක්‍රිස්තුස්වහන්සේ තුළ සහෝදරයෝය" දෙවියන්වහන්සේ ඔවුන් තම දරුවන් ලෙස හඳුන්වන සේක. (1 යොහන් 3:1, යොහන් 1:12, 1 පේත්‍රුස් 1:23)

මෙම ඉගැන්වීම් සියල්ල විශ්වාස කරන්නෝ දැහැමි ක්‍රිස්තියානි ජීවිතයක් ගත කිරීමට උත්සහ කල යුතුය.

✦ සටහන : ක්‍රිස්ටඩෙල්ෆියන්ස් නමෙහි අරුත "ක්‍රිස්තුස් වහන්සේ තුළ සහෝදරයෝය." (කොලොස්සි 1:2) ඔබට ආසන්නයේම ඇති ක්‍රිස්ටඩෙල්ෆියන්වරු හඳුන්වා දීමට අප කැමැත්තෙමු. ලෝකයේ බොහෝ ස්ථාන වල ඔවුන්ගේ රැස්වීම් ස්ථාන ඇත.

බොහෝ බයිබල් මාතෘකා මත නොමිලේ සපයන ලියවිලි ද ඇත. ඔබට යම් ගැටළු හෝ ප්‍රශ්න හෝ ඇත්නම් කරුණාකර අපට ලියන්න.

# සියලුම සෑතුවලට බයිබලය

වෙනස්වන සෑම අවශ්‍යයතාවයක් සඳහා දෙවියන්වහන්සේගේ වචනයට සැනසුම සහ ශක්තිය සැපයිය හැක.

උපකාරවේ යැයි සිතෙන උදාහරණ කිහිපයක් මෙන්න :

| | |
|---|---|
| ✦ ශෝකී අවස්ථාවලදී | ගීතාවලිය 90 |
| ✦ බියජනක අවස්ථාවලදී | ගීතාවලිය 91 |
| ✦ හුදකලා අවස්ථාවලදී | ගීතාවලිය 142 |
| ✦ රෝගී අවස්ථාවලදී | ගීතාවලිය 103 |

ඔබ මේ ගැන සැලකිලිමත් නම් :

| | |
|---|---|
| ✦ ඔබගේ දරුවන් සඳහා | හිතෝපදේශ 4 |
| ✦ අනාගතය සඳහා | ලූක් 21 |
| ✦ ජීවිතය කුමක් සඳහාද | යෙසායා 45 |
| ✦ දෙවියන්වහන්සේගේ පොරොන්දුවක් සඳහා | යෙසායා 55 |

## හත්වැනි පියවර සඳහා විමසන්න.

එක්වසරක් තුළදී දෙවියන්වහන්සේගේ වචනය සෑම පරිච්ඡේදයක් තුළින්ම ඔබ ගෙනයන බයිබල් කියැවීම් සැලැස්මක් ඔබට දැන් අවශ්‍ය ඇත. බයිබල් සහායකයා නමැති නොමිලයේ දෙන පොත් පිංච මෙම අවශ්‍යතාවය ඔබට සපයන අතර දහස් ගණන් ක්‍රිස්ටඩෙල්ෆියන්වරු සහ මෙම ක්‍රමය අනුගමනය කරන අනෙකුත් අය සමඟ දිනපතා බයිබලය කියැවීමට උදව් කරනු ඇත. සෑම වසරක්ම බයිබලය කියැවීමේ වසරක් කරගන්න.

**බයිබල් සහායකයා නමැති දිනපතා බයිබල් කියැවීමේ වගුව සඳහා ලියන්න.**

**ක්‍රිස්ටඩෙල්ෆියන්ස්**

**තැ.පෙ. 60, මීගමුව.**